

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ

# ස්ථාවර නියෝග

(2022 නොවැම්බර් 23 දින දක්වා සංශෝධිතය.)

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුවේ

# ස්ථාවර නියෝග

(2022 නොවැම්බර් 23 දින දක්වා සංශෝධිතය.)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ
## ස්ථාවර නියෝග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව විසින් මෙම ස්ථාවර නියෝග සම්පාදනය කරන ලදී.

2022 ඔක්තෝබර් 05 දින සහ 2022 නොවැම්බර් 23 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සංශෝධන ද අන්තර්ගතකර ප්‍රකාශයට පත්කරන මෙම සංශෝධිත ස්ථාවර නියෝග 2022 නොවැම්බර් 23 දින සිට බලාත්මකය.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2022 නොවැම්බර් 23 දින දී ය.

# පටුන

ස්ථාවර නියෝග අංකය | | | පිටුව

## ප්‍රථම රැස්වීම


| | | | |
|---|---|---|---|
| 1-2 | ..... | පාර්ලිමේන්තුවේ පළමුවැනි රැස්වීමේ කාර්ය පටිපාටිය ……………………… | 1 |
| 3 | ..... | මන්ත්‍රීවරයන්ට ආසන පැනවීම ……………………………………… | 1 |
| 4 | ..... | කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම …………………… | 2 |
| 5 | ..... | නිල ප්‍රතිඥාව හෝ දිවුරුම …………………………………………….. | 4 |
| 6 | ..... | නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම ………………………………………… | 4 |
| 7 | ..... | ජනාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීම ………………………………… | 4 |


## රැස්වීම්


| | | | |
|---|---|---|---|
| 8-9 | ..... | පාර්ලිමේන්තුවේ රැස්වීම් …………………………………………………….. | 5 |
| 10 | ..... | මහ ලේකම්වරයාගේ රාජකාරි ……………………………………………… | 6 |
| 11-12 | ..... | ගණපූරණය ………………………………………………………………… | 7 |
| 13-14 | ..... | පාර්ලිමේන්තුවේ වැඩකටයුතු ……………………………………………… | 8 |
| 15-16 | ..... | කල් තැබීම ..……………………………………………………………….. | 9 |
| 17-18 | ..... | පමාකිරීමේ යෝජනා………………………………………………………… | 9 |
| 19 | ..... | හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා කල්තැබීම ……………………………………………………………… | 10 |
| 20 | ..... | කල්තබන අවස්ථාවේ යෝජනා හෝ ප්‍රශ්න ………………………………….. | 11 |
| 21 | ..... | පිට අය ……………………………………………………………………….. | 12 |


## ප්‍රධාන කටයුතු


| | | | |
|---|---|---|---|
| 22 | ..... | පාර්ලිමේන්තුවේ කටයුතු ………………………………………………… | 12 |
| 23 | ..... | ප්‍රධාන වැඩකටයුතු ………………………………………………………… | 13 |
| 24-25 | ..... | පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා ……………………………………… | 13 |
| 26 | ..... | ලිපිලේඛනාදිය ……………………………………………………………… | 14 |
| 27-29 | ..... | දැනුම්දීම්………………………………………………………………….. | 15 |
| 30 | ..... | මහජන පෙත්සම් …………………………………………………………… | 17 |
| 31-37 | ..... | ප්‍රශ්න………………………………………………………………………... | 18 |
| 38 | ..... | අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න……………………………………… | 21 |

ස්ථාවර නියෝග අංකය | | | පිටුව

## විවාද


| | | | |
|---|---|---|---|
| 39-41 | ..... | විවාදයට භාජනය වන ප්‍රශ්න …………………………………………………..… | 22 |
| 42 | ..... | අපේක්ෂණය ………………………………………………………………… | 22 |
| 43-45 | ..... | සංශෝධන …………………………………………………………………….. | 23 |
| 46 | ..... | සමාප්තිය ……………………………………………………………………… | 25 |
| 47-49 | ..... | ඡන්දය දීම ……………………………………………………………………. | 25 |


## පනත් කෙටුම්පත්


| | | | |
|---|---|---|---|
| 50 | ..... | පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය ………………………….. | 27 |
| 51 | ..... | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ දක්වා ඇති කාරණා සම්බන්ධ පනත් කෙටුම්පත් …………………………….... | 28 |
| 52-53 | ..... | පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පත් ……………………………… | 29 |
| 54 | ..... | බලපෑමට ලක්වන පාර්ශ්වයන්, සාක්ෂිකරුවන් සහ සාක්ෂි …………………… | 31 |
| 55 | ..... | දෙවැනි වර කියවීම …………………………………………………………… | 31 |
| 56 | ..... | දෙවැනි වර කියවීම පිළිබඳ විවාදය …………………………………………….. | 32 |
| 57-58 | ..... | පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා අවස්ථාව ……………………………… | 32 |
| 59-66 | ..... | පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා කාර්ය පටිපාටිය ……………………….. | 33 |
| 67- 70 | ..... | පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභාවල වාර්තා …………………………….. | 34 |
| 71-73 | ..... | තුන්වැනි වර කියවීම ………………………………………………………… | 35 |
| 74 | ..... | කථානායකවරයාගේ සහතිකය ………………………………………………… | 35 |
| 75 | ..... | විසර්ජන පනත් කෙටුම්පත සඳහා වෙන් කරන ලද දිනයන් …………………… | 36 |


## විනය


| | | | |
|---|---|---|---|
| 76 | ..... | විනය රීති පිළිබඳ වගකීම …………………………………………………… | 37 |
| 77-83 | ..... | පාර්ලිමේන්තුව තුළ විනය …………………………………………………… | 38 |
| 84-85 | ..... | පූර්ණ යෝජනාවක් මත ඇතැම් තැනැත්තන් ඉවත් කරනු ලැබීම ……………… | 41 |
| 86-90 | ..... | විවාද රීති ……………………………………………………………………… | 43 |
| 91 | ..... | පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේ දී මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති …….. | 44 |
| 92 | ..... | කථා නොකරන මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති ………………………. | 46 |


## කාරක සභා


| | | | |
|---|---|---|---|
| 93-99 | ..... | පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව …………………………………………… | 47 |
| 100-110 | ..... | විශේෂ කාරක සභා …………………………………………………………….. | 48 |

| ස්ථාවර නියෝග අංකය | | | පිටුව |
|---|---|---|---|
| 111 | ..... | ආංශික අධීක්ෂණ කාරක සභා ........................................ | 50 |
| 112 | ..... | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා .................................. | 54 |
| 113 | ..... | ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව.................................. | 55 |


## විශේෂ කාර්යයන් සඳහා කාරක සභා


| | | | |
|---|---|---|---|
| 114 | ..... | තේරීම් කාරක සභාව .................................................. | 56 |
| 115 | ..... | පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව.............................. | 57 |
| 116 | ..... | ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව ................................... | 58 |
| 117 | ..... | ගෘහ්‍ය කාරක සභාව .................................................. | 58 |
| 118 | ..... | අවාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ........................... | 58 |
| 119 | ..... | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ...................................... | 60 |
| 120 | ..... | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ..................................... | 62 |
| 121 | ..... | රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ....................................... | 63 |
| 122 | ..... | බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව ........................ | 65 |
| 123 | ..... | ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව................................ | 68 |
| 124 | ..... | ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව ...................................... | 70 |
| 125 | ..... | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව .................................... | 72 |
| 126 | ..... | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව............................ | 74 |
| 127 | ..... | උසස් නිලතල පිළිබඳ කාරක සභාව ...................................... | 74 |
| 128 | ..... | සම්බන්ධීකරණ කාරක සභාව ............................................ | 75 |
| 129 | ..... | පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව.................................. | 76 |
| 130 | ..... | විශේෂ කාර්යයන් සඳහා කාරක සභාවල කාර්ය පටිපාටිය ..................... | 77 |
| 131 | ..... | කාරක සභා සඳහා පොදු රීති ............................................ | 78 |
| 132 | ..... | කාරක සභා සභාපතිවරයන් විසින් ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම......... | 80 |
| 133 | ..... | විසර්ජන පනත් කෙටුම්පතෙහි උපලේඛන සම්බන්ධයෙන් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක කාර්ය පටිපාටිය ............................ | 81 |


## මුදල්


| | | | |
|---|---|---|---|
| 134-135 | ..... | අධි වැය ........................................................... | 82 |
| 136 | ..... | රජයේ මුදල් ......................................................... | 84 |

ස්ථාවර
නියෝග
අංකය

පිටුව

## විවිධ


137 ..... ස්ථාවර නියෝග සංශෝධනය කිරීම ………………………………………… 85

138 ..... ස්ථාවර නියෝග අත්හිටුවීම …………………………………………………. 85

139-142..... කථානායකවරයාගේ සාමාන්‍ය අධිකාරය ……………………………………. 85

143 ..... සභාපති නාමාවලිය ……………………………………………………………. 86

144 ..... මන්ත්‍රීවරයන් විසින් නීතිමය නියෝජනයක් කරනු ලැබිය නොහැකි වීම ………. 86

145 ..... සාක්ෂිකරුවන්ගේ හා විශේෂඥයන්ගේ වියදම් ……………………………….. 86

146 ..... අවශේෂ බලතල ……………………………………………………………….. 87

# මහා මැතිවරණයකට පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ පළමුවැනි රැස්වීමේ කාර්ය පටිපාටිය

**1.** මහා මැතිවරණයකට පසු (මෙහි මින්මතු ‘‘පාර්ලිමේන්තුව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් පවත්වන පළමුවැනි දිනයෙහි 3 ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව නිසි පරිදි නියම කරන ලද ස්ථානයේ දී නියමිත වේලාවට මන්ත්‍රීවරයන් එක් රැස්වී අසුන් ගනු ලැබූ විට, රැස්වීම කැඳවූ (මෙහි මින්මතු ‘‘ජනාධිපතිවරයා’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයාගේ ප්‍රකාශනය (මෙහි මින්මතු ‘‘මහ ලේකම්වරයා’’ යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවනු ලැබිය යුතු අතර, එම දිනයෙහි ඊට අනතුරුව සිදුවිය යුතු කාර්යය අනුපිළිවෙළ වන්නේ—

(අ) කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම;

(ආ) මහ ලේකම්වරයා විසින් ගනු ලබන පරිදි කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ දී සිය නිල ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම;

(ඇ) කථානායකවරයා ඉදිරියේ අන් සියලු ම මන්ත්‍රීවරයන් නිල ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම;

(ඈ) (මෙහි මින්මතු ‘‘නියෝජ්‍ය කථානායකවරයා’’ යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම;

(ඉ) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම;

යනාදී වශයෙන් විය යුතු අතර, ඉහත කාර්යය අවසානයේ දී පාර්ලිමේන්තුව විසින් නියම කරන ලද දිනය සහ වේලාව වන තෙක් පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

**2.** කථානායක ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වන කවර හෝ අවස්ථාවකදී, එම පුරප්පාඩුව ඇති වීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් එහි පළමුවැනි රැස්වීමේ දී කථානායකවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

## මන්ත්‍රීවරයන්ට ආසන පැනවීම

**3.**(1) මහා මැතිවරණයකට පසු පාර්ලිමේන්තුව රැස්වන ප්‍රථම දිනයේ සහ ඉන්පසුව එක් එක් මන්ත්‍රීවරයාට ආසනයක් බැගින් වෙන්කර දෙනු ලබන තෙක්, මන්ත්‍රීවරයන් විසින් සභා සීමාව ඇතුළත තිබෙන කවර හෝ ආසනයක අසුන් ගනු ලැබිය හැකි ය.

(2) කථානායකවරයාගේ අභිමතය පරිදි, කලින් කලට, මන්ත්‍රීවරයන් සඳහා ආසන වෙන්කර දෙනු ලැබිය යුත්තේ ය.

## කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම

**4.** කථානායකවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ කාර්ය පටිපාටිය මතු සඳහන් පරිදි විය යුත්තේ ය:—

(අ) කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කිරීමට රිසි යම් මන්ත්‍රීවරයකු, අදාළ මන්ත්‍රීවරයා එසේ තෝරා පත්කර ගනු ලැබුවහොත් කථානායකවරයා ලෙස සේවය කිරීමට එකී මන්ත්‍රීවරයා රිසි ද යන්න එකී මන්ත්‍රීවරයාගෙන් ම කලින් විමසා දැනගනු ලැබිය යුත්තේ ය.

(ආ) යම් මන්ත්‍රීවරයකු විසින්, මහ ලේකම්වරයා අමතමින්, එම අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ සිටින වෙනත් යම් මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ කථානායක ධුරයට යෝජනා කරමින් එම මන්ත්‍රීවරයා කථානායකවරයා වශයෙන් මෙම පාර්ලිමේන්තුවේ මූලාසනාරූඪ විය යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම යෝජනාව ස්ථිර කරනු ලැබිය යුත්තේ ය. එහෙත් ඒ පිළිබඳව විවාදයකට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය.

(ඇ) කථානායකවරයා වශයෙන් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලබනුයේ එක් මන්ත්‍රීවරයකු පමණක් නම්, එම මන්ත්‍රීවරයා කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව මහ ලේකම්වරයා විසින් ප්‍රශ්නය නොවිමසා ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය. එක් මන්ත්‍රීවරයකුට වැඩි ගණනක් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලැබ ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් බෙදුම් සීනු මිනිත්තු පහක් නාද කිරීමෙන් අනතුරුව රහස් ඡන්දයෙන් කථානායකවරයකු තෝරා පත්කර ගැනීමට කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(ඈ) ඡන්දය පැවැත්වීමේ කාර්යය සඳහා, මහ ලේකම්වරයා විසින් පැමිණ සිටින එක් එක් මන්ත්‍රීවරයාට, ඡන්ද පත්‍රිකාව බැගින් දෙනු ලැබිය යුතු අතර, එම මන්ත්‍රීවරයා විසින් තමා ඡන්දය දීමට රිසි මන්ත්‍රීවරයාගේ නම එම ඡන්ද පත්‍රිකාව මත ලියනු ලැබ, එසේ ලියන ලද නම නොපෙනෙන ආකාරයට ඡන්ද පත්‍රිකාව නවනු ලැබිය යුතු අතර, ස්වකීය අත්සන ද එම ඡන්ද පත්‍රිකාවේ තබනු ලැබිය යුත්තේ ය.

(ඉ) මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ඡන්ද පත්‍රිකා එකතු කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ සභාමේසය මත දී මහ ලේකම්වරයා විසින් ඒවා ගණන් කිරීම සිදු කරනු ලැබිය යුත්තේ ය. ඡන්ද විමසීමේ ප්‍රතිඵලය මහ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය.

(ඊ) (i) අපේක්ෂකයන් දෙදෙනෙකුට වැඩි ගණනකගේ නම් යෝජනා කරනු ලැබ ඇති අවස්ථාවක දී, පළමුවැනි ඡන්ද විමසීමේ දී එක් අපේක්ෂකයකුටවත් අනෙක් අපේක්ෂකයන් සියල්ලන්ටම ලැබී තිබෙන මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද ගණනක් ලැබී නොමැති නම්, ඡන්ද අඩුම ගණන ලබා ගත් අපේක්ෂකයා ඡන්ද විමසීමෙන් බැහැර කොට ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම ඉදිරියට කරගෙන යනු ලැබිය යුත්තේ ය. ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන සෑම ඡන්ද විමසීම් වාරයක දී ම අඩුම ඡන්ද ගණන ලබා ගන්නා අපේක්ෂකයා බැහැර කරමින් එක් අපේක්ෂකයකු, ඉතිරි වී සිටින අනික් අපේක්ෂකයා ලබා ඇති ඡන්ද ගණනට හෝ ඉතිරි වී සිටින අනෙක් අපේක්ෂකයන් ලබා ඇති මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා තෙක්, අවස්ථානුකූලව, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම කරනු ලැබිය යුත්තේ ය.

(ii) අපේක්ෂකයන් තිදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වනු ලබන ඡන්ද විමසීමකින් අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු එක සමාන ඡන්ද ගණනක් ලැබ සිටින අවස්ථාවක දී මෙහි (i) අනු ඡේදය යටතේ ඉන් එක් අපේක්ෂකයකු ඡන්ද විමසීමෙන් බැහැර කරනු ලැබිය යුතු විට, එක සමාන ඡන්ද ගණනක් ලබා ගත් අපේක්ෂකයන් අතරින් බැහැර කරනු ලැබිය යුතු අපේක්ෂකයා තෝරා ගැනීම මහ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන අන්දමට කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(iii) අපේක්ෂකයන් දෙදෙනෙකු අතර ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන ඡන්ද විමසීමක දී ඡන්ද ගණන සමාන වන අවස්ථාවක දී, නැවත ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසනු ලැබිය යුතු අතර, එම නැවත ඡන්දය විමසීමේ දී ද ඡන්ද ගණන සමාන වුවහොත්, ඡන්ද විමසීමෙන් බැහැර කරනු ලැබිය යුතු අපේක්ෂකයා තෝරා ගැනීම මහ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(උ) ඡන්ද පත්‍රිකා ගණන් කරන අතර ම ඒවා පෙට්ටියක තැන්පත් කරනු ලැබිය යුත්තේ ය. තව ද මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබූ විට, පාර්ලිමේන්තුව ඉදිරිපිට දී පෙට්ටියට මුද්‍රා තබනු ලැබ එය එක් ලිත් මාසයක් මහ ලේකම්වරයාගේ භාරයෙහි තබනු ලැබිය යුත්තේ ය. ඉන් පසු මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවෙන් ලැබිය හැකි යම් නියමයකට යටත්ව, එම ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබ, එසේ කළ බව පාර්ලිමේන්තුවට සහතික කර දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

## නිල ප්‍රතිඥාව හෝ දිවුරුම

**5.**(1) කථානායකවරයා විසින් නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දීමෙන් අනතුරුව පැමිණ සිටින මන්ත්‍රීවරයන් සියල්ලන්ම ලවා ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම සහ අත්සන් තැබීම කරවීමට සලස්වනු ලැබිය යුත්තේ ය. ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම මහ ලේකම්වරයා විසින් කරවනු ලැබිය යුත්තේ ය.

(2) කථානායකවරයා විසින් ආරම්භ කරනු ලබමින් සෑම මන්ත්‍රීවරයකු විසින් ම ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම සිදු කරනු ලැබූ වහා ම මහ ලේකම්වරයා විසින් තත් කාර්යය සඳහා තබා ඇති මන්ත්‍රී නාම ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව රැස්වන කවර හෝ දිනයක ඊට පෙර නිල ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම සිදුකරනු නොලැබූ මන්ත්‍රීවරයකුට 22 ස්ථාවර නියෝගය යටතේ නියම කරනු ලබන වේලාවට පාර්ලිමේන්තු සභාමේසය වෙත පැමිණ ඒ සම්බන්ධයෙන් මහ ලේකම්වරයාට දැනුම් දෙනු ලැබිය හැකි අතර, එවිට, මහ ලේකම්වරයා විසින්, එම මන්ත්‍රීවරයා ලවා නිල ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම කරවනු ලැබිය යුතු අතර, ඉන් පසු එම මන්ත්‍රීවරයා විසින් මන්ත්‍රී නාම ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුත්තේ ය.

## නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම

**6.**(1) 1 ස්ථාවර නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අභිනවයෙන් තේරී පත්වූ පාර්ලිමේන්තුවක පළමුවැනි රැස්වීමේ දී හෝ නියෝජ්‍ය කථානායක ධූරයෙහි හෝ නියෝජ්‍ය කාරක සභා සභාපති ධූරයෙහි හෝ පුරප්පාඩුවක් ඇතිවීමෙන් පසුව පැවැත්වෙන පාර්ලිමේන්තුවේ පළමුවැනි රැස්වීමේ දී එහි ප්‍රධාන කටයුතු ආරම්භයේ දී, පාර්ලිමේන්තුව විසින්, අවස්ථාවෝචිත පරිදි, නියෝජ්‍ය කථානායකවරයකු හෝ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීමට කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(2) නියෝජ්‍ය කථානායකවරයකු සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ කාර්ය පටිපාටිය එම ඡන්ද විමසීම් කථානායකවරයා විසින් පවත්වනු ලැබිය යුතු බව හැර, කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ දී අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටියට හැකි තරම් සමාන විය යුත්තේ ය.

## ජනාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීම

**7.** (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ අවස්ථාවක දී ඡන්ද පත්‍රිකා භාවිතයෙන් රහස් ඡන්දයක් පැවැත්වීමට පාර්ලිමේන්තුව විසින්

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුත්තේ ය.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්

***8.** [(1) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, එක් එක් මාසයේ පළමුව යෙදෙන ඉරිදාට පසුව එළැඹෙන සතියෙන් ආරම්භ කරමින් ඒ ඒ සතියේ අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල දී එක් එක් මාසයේ පළමුවැනි සහ තුන්වැනි සති දෙකේ දී පාර්ලිමේන්තුව රැස්වනු ලැබිය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුවේ රැස්වීම පූ. භා. 9.30 ට ආරම්භ කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් කැඳවනු ලබන රැස්වීමක්, ඒ සඳහා ජනාධිපතිවරයා විසින් කරනු ලබන දැනුම් දීමෙන් නියම කර ඇති වේලාවට ආරම්භ කරනු ලැබිය යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තු රැස්වීම් දිනවල, අ.භා. 12.30ට සලකා බැලීමට භාජනය වෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳව වැඩකටයුතු ප්‍රශ්නය නොවිමසා අත්හිටවනු ලැබ, අ.භා. 1.00 ට නැවත ආරම්භ කරනු ලැබිය යුත්තේ ය.

(4) කථානායකවරයා විසින්, අ.භා. 5.30ට ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

(5) අ.භා. 5.00 ට එම අවස්ථාවේ දී සැලකිල්ලට භාජනය වෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳ වැඩකටයුතු අත්හිටවනු ලැබිය යුතු අතර, එවිට පාර්ලිමේන්තුව කාරක සභා අවස්ථාවේ පසු වේ නම් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් මූලාසනයෙන් ඉවත්ව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. තව ද, පාර්ලිමේන්තුව හෝ විවාදය හෝ කල් තබනු ලැබිය යුතු බවට හෝ කාරක සභා අවස්ථාවේ දී මූලාසනාරූඪ මන්ත්‍රීවරයා වෙත ප්‍රගතිය වාර්තා කරනු ලැබිය යුතු බවට හෝ ආසනයෙන් ඉවත් වනු ලැබිය යුතු බවට හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එවැනි සෑම පමා කිරීමේ යෝජනාවක් ම ප්‍රශ්නය නොවිමසා අවලංගු විය යුත්තේ ය:

එසේ වුව ද, වැඩකටයුතු අත්හිටවනු ලැබූ විට 46 ස්ථාවර නියෝගය ප්‍රකාරව විවාදය අවසන් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, හෝ ඒ වනවිට එම ස්ථාවර නියෝගය ප්‍රකාරව වැඩකටයුතු කරමින් පවතී නම්, ඉන් මතු වන ප්‍රශ්නය එම ස්ථාවර නියෝගයේ විධිවිධාන සලසා ඇති ආකාරයට ඉදිරිපත් කරනු ලැබ ඇති

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

වැඩිමනත් වූ යෝජනාවක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කරනු ලබන තෙක් කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා හෝ මූලාසනයෙන් ඉවත් වනු නොලැබිය යුත්තේ ය.

(6) අ.භා. 5.00 ට සැලකිල්ලට භාජනය වෙමින් පවතින වැඩකටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කර අවසන් කරනු ලැබීමෙන් අනතුරුව කවර හෝ මන්ත්‍රීවරයකු විරුද්ධ වන, කිසිදු වැඩකටයුත්තක් සලකා බැලීම සඳහා ගනු නොලැබිය යුත්තේ ය.

(7) මෙම ස්ථාවර නියෝගයෙහි (4) සහ (5) ඡේදවල විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණ ද, එවකට සිදුකරමින් පවතින පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සමාප්ත කිරීමේ කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් දැනුම් දීමකින් තොරව කරනු ලබන යෝජනාවක් මත සභාවේ පැමිණ සිටින මන්ත්‍රීවරයන් බහුතරයකගේ එකඟත්වය පළ කරනු ලැබ ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් රැස්වීම් පවත්වනු ලබන කාල වේලාවන් දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය.]

*__9__. [ප්‍රධාන කටයුතු ආරම්භයේ දී, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව නිශ්චිතව සඳහන් කරනු ලබන යම් වැඩකටයුත්තක් පිළිබඳ කටයුතු යම් නිශ්චිත දිනයක රැස්වීමේ දී 8 ස්ථාවර නියෝගයේ විධිවිධානවලින් නිදහස් විය යුතු බවට යෝජනාවක් කරනු ලැබිය හැකි අතර, එවැනි යෝජනාවකට එකඟත්වය ලැබ ඇත්නම්, එසේ නිශ්චිතව සඳහන් කරන ලද වැඩකටයුත්ත, අත්හිටවීමට නියම කර ඇති වේලාවේ දී සාකච්ඡාවට භාජනය වෙමින් පවතී නම් එය අත්හිටවීම කරනු නොලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් විරෝධතාවක් ඇති වුව ද කවර වේලාවක දී හෝ එය සලකා බැලීමට ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 8 ස්ථාවර නියෝගය ක්‍රියාත්මක වීමෙන් නිදහස් කරන ලද වැඩකටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අ.භා. 5.00 න් පසු අවසන් වූ විට, නිදහස් කරන ලද වැඩකටයුතුවල අවසන් විෂයය නිම කරනු ලැබූ වහා ම, කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.]

## මහ ලේකම්වරයාගේ රාජකාරි

**10.** (1) පාර්ලිමේන්තුවේ සහ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවල වැඩකටයුතු පිළිබඳ කාර්ය සටහන් මහ ලේකම්වරයා විසින් සකස් කරනු ලැබිය යුත්තේ ය. රැස්වීමට සහභාගිවන මන්ත්‍රීවරයන්ගේ නම් සහ පාර්ලිමේන්තුව විසින් ගන්නා ලද තීරණ සියල්ල ම එම කාර්ය සටහන්වල සඳහන් කරනු ලැබිය යුත්තේ ය.

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(2) පාර්ලිමේන්තුවේ දී හෝ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක දී හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමේ දී, ප්‍රශ්නයට පක්ෂව ඡන්දය දෙන මන්ත්‍රීවරයන්ගේත්, විරුද්ධව ඡන්දය දෙන මන්ත්‍රීවරයන්ගේත් සංඛ්‍යාවන් ද, බෙදීම සිදුවන්නේ 47(2)(ආ) සහ (ඇ) ස්ථාවර නියෝග යටතේ නම්, ඒ අනුව ඡන්දය දෙන මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව සහ නම් ද, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව සහ නම් ද, පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වල අඩංගු කරනු ලැබිය යුත්තේ ය. මෙම කාර්ය සටහන් ස්ථිර කිරීම අවශ්‍ය නොවේ. එහෙත් එහි වැරදි තිබේ නම්, පාර්ලිමේන්තුවේ අවසරය මත ඒ සඳහා ඉදිරිපත්කරනු ලබන යෝජනාවක් මාර්ගයෙන් ඒවා නිදොස් කරනු ලැබිය හැකි ය.

(3) මතු කවර දිනකට හෝ නියම කරන ලද සියලු කටයුතු සහ නම් කරන ලද හෝ නම් නොකරන ලද මතු දිනකට තබන ලද ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳ දැනුම්දීම් සඳහන් කරනු ලබන න්‍යාය පුස්තකයක් මහ ලේකම්වරයා විසින් එදිනෙදා සකස් කරනු ලැබ පාර්ලිමේන්තුවේ සභාමේසය මත හා පුස්තකාලයෙහි තබනු ලැබිය යුත්තේ ය. කවර හෝ විශේෂ දිනක කටයුතු නියම කර තබනු ලැබිය හැකි අතර, එසේ කරනු ලැබූ බවට න්‍යාය පුස්තකයෙහි සටහනක් තැබිය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්, වාර්තා සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් සහ අනෙකුත් ලේඛනවල සුරක්ෂිත භාරකාරත්වය සම්බන්ධයෙන් මහ ලේකම්වරයා විසින් වගකියනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ට සහ කථානායකවරයා විසින් අනුමත කරන ලද විධිවිධාන යටතේ වෙනත් තැනැත්තන්ට ද ඒවා පරීක්ෂා කිරීමට අවකාශ තිබිය යුත්තේ ය.

(5) මහ ලේකම්වරයා විසින් කාරක සභාවලට පරිපාලනමය හා සම්පත් සහාය ලබා දීම සඳහා වගබලා ගැනීම සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුත්තේ ය.

## ගණපූරණය

**11.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 73 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ගණපූරණය මූලාසනාරූඪ මන්ත්‍රීවරයා ද ඇතුළුව මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් සමන්විත වේ. ඕනෑම අවස්ථාවක දී, ගණපූරණයක් නොපවතින බවට කථානායකවරයාගේ හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාගේ අවධානය යොමු කරනු ලැබුවහොත් බෙදුම් සීනු නාද කිරීමට කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් හෝ අණ කරනු ලැබිය යුත්තේ ය. බෙදුම් සීනු නාද කිරීම ආරම්භ කරනු ලැබ මිනිත්තු පහක් ගත වීමෙන් අනතුරුව ගණපූරණයක් නොමැති නම්, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් හෝ ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

**12.** පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක ගණපූරණය විස්සක් විය යුතු ය. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවෙහි දී ගණපූරණයක් නොමැති බව

සැලකිල්ලට භාජනය වුවහොත් සභාපතිවරයා විසින් 11 ස්ථාවර නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ක්‍රියා කරනු ලැබිය යුත්තේ ය. ගණපූරණයක් නොමැති නම් සභාපතිවරයා ආසනයෙන් ඉවත් වී රැස්වීම යළිත් පාර්ලිමේන්තු තත්ත්වයට පත් වූ වහාම පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ගණන් කරනු ලැබිය යුත්තේ ය. එවිට ද, ගණපූරණයක් නොමැති නම්, 11 ස්ථාවර නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය. එහෙත් ගණපූරණයක් පවතින බව පෙනී ගියහොත්, පාර්ලිමේන්තුව වහාම කාරක සභාවට පරිවර්තනය විය යුත්තේ ය.

## පාර්ලිමේන්තුවේ වැඩකටයුතු

**13.** පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පවත්වාගෙන යා යුත්තේ ය. පාර්ලිමේන්තුවේ දී කරනු ලබන සෑම කථාවක් ම එය පවත්වනු ලබන භාෂාවෙන් (මෙහි මින් මතු "හැන්සාඩ්" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ පළ කරනු ලැබිය යුත්තේ ය. කථාව පවත්වනු ලබන භාෂාව තේරුම් ගත නොහැකි මන්ත්‍රීවරයන් සඳහා සුදුසු විධිවිධාන සැලසීම කථානායකවරයාගේ කාර්යය විය යුත්තේ ය. එම විධිවිධානවලට මතු සඳහන් ඒවා ද ඇතුළත් විය හැකි ය:—

(අ) පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලැබීම;

(ආ) කථා සහ අනෙකුත් වැඩකටයුතු සමගාමීව අනෙකුත් භාෂා දෙකට පරිවර්තනය කරනු ලැබීම;

(ඇ) හැන්සාඩ් වාර්තාවේ ඉදිරිපස කවරය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුද්‍රණය කරනු ලැබීම;

(ඈ) කථිකයාගේ නම සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සඳහන් කරනු ලැබිය යුතු අතර, පවත්වනු ලබන කථා ඒවා පවත්වන ලද භාෂාවෙන් ම හැන්සාඩ් වාර්තාවේ පළ කරනු ලැබීම.

**14.** (1) සභාවේ වැඩකටයුතු, පාර්ලිමේන්තුව විසින්, කලින් කලට, නිශ්චය කරනු ලබන රීති හා කොන්දේසිවලට යටත්ව ගුවන්විදුලිය, රූපවාහිනිය හෝ වෙනත් යම් විද්‍යුත් මාර්ග හෝ උපකරණ භාවිතයෙන් විකාශය කිරීම සඳහා ඉඩ සලසනු ලැබිය හැකි ය.

(2) සභාවේ වැඩකටයුතු විකාශය කිරීමේ දී, පාර්ලිමේන්තුව විසින් යොදා ගනු ලබන සාධාරණත්වය පිළිබඳ ප්‍රමිති පවත්වා ගෙන යා යුත්තේ ය.

(3) කාරක සභාවල වැඩකටයුතු ද, පාර්ලිමේන්තුව සහ අදාළ කාරක සභා විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි රීති හා කොන්දේසිවලට යටත්ව කාරක සභා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් අවස්ථාවල විකාශය සඳහා ද ඉඩ සලසනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, දී ඇති යම් අවස්ථාවක දී පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක වැඩකටයුතු සජීවී ලෙස විකාශය කිරීම සඳහා ඉඩ සලසනු ලැබීම, ඒ සඳහා සීමා පනවනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම හෝ පිළිබඳව තීරණය කිරීමේ සිය අභිමතානුසාරී බලය ක්‍රියාවේ යෙදවීමට අවස්ථාවෝචිත පරිදි කථානායකවරයාට හෝ කාරක සභාවක සභාපතිවරයාට හැකි ය.

## කල් තැබීම

**15.** පාර්ලිමේන්තුව කල් තැබීමක් යනුවෙන් අදහස් කෙරෙනුයේ දැනුම් දීමකින් පසුව ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව අන්කිසි නියමිත දිනකට පාර්ලිමේන්තුව කල් තබන ලෙස පාර්ලිමේන්තුව නියෝග කර ඇත්නම් මිස, පාර්ලිමේන්තුව සිරිත් පරිදි රැස්වන ඊළඟ දිනය තෙක් කල් තැබීමකි. දින නියමයක් නොමැති කල් තැබීමේ යෝජනාවක් පිළිගනු නොලැබිය යුත්තේ ය.

**16**. හතළිස් අට පැයකට වැඩි කාලයක් පවතින කල් තැබීමක් තුළ දී පාර්ලිමේන්තුව නැවත රැස්වීමට නියම කරන ලද දිනකට කලින් දිනකට පාර්ලිමේන්තුව කැඳවන ලෙස අග්‍රාමාත්‍යවරයා විසින් කථානායකවරයාගෙන් ඉල්ලුම් කරනු ලබයි නම්, එම ඉල්ලීමේ දක්වා ඇති පරිදි පාර්ලිමේන්තුව කැඳවමින් කථානායකවරයා විසින් දැනුම්දීමක් කරනු ලැබිය යුත්තේ ය. එවිට කථානායකවරයාගේ දැනුම්දීමෙහි නියම කරන ලද දින නියමිත වේලාවට පාර්ලිමේන්තුව රැස්වී එම දින සහ වේලාව වන තෙක් යථා පරිදි කල් තබන ලද්දාක් මෙන් පාර්ලිමේන්තුව ස්වකීය වැඩකටයුතුවල යෙදිය යුත්තේ ය. මෙවැනි දැනුම්දීමක් නිකුත් කරනු ලැබීමේ දී, පාර්ලිමේන්තුව කැඳවනු ලබන දිනය සහ වේලාව මන්ත්‍රීවරයන්ට දැන්වීමට ගත හැකි සෑම පියවරක් ම කථානායකවරයා විසින් ගනු ලැබිය යුත්තේ ය.

## පමාකිරීමේ යෝජනා

**17.** කිසියම් විවාදයක් පැවැත්වෙන අවස්ථාවේදී, විවාදය කල් තැබීම සඳහා හෝ පාර්ලිමේන්තුව කල් තැබීම සඳහා හෝ නැතහොත් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක සභාපතිවරයා විසින් "ප්‍රගතිය වාර්තා කරනු ලැබිය යුත්තේ ය", නැතහොත් "මූලාසනයෙන් ඉවත් වනු ලැබිය යුත්තේ ය" යනුවෙන් යෝජනාවක් ඉදිරිපත් වූ විට ඒ පිළිබඳව පවත්වනු ලබන විවාදය එසේ ඉදිරිපත් කරනු ලබන යෝජනාවේ සඳහන් කාරණයට සීමා විය යුතු අතර, එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබූ හෝ ස්ථිර කරනු ලැබූ හෝ මන්ත්‍රීවරයකුට එම විවාදය පැවැත්වෙන අවස්ථාවේ දී ඊට සමාන කිසියම් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමේ හෝ ස්ථිර කරනු ලැබීමේ හෝ හිමිකම් නොතිබිය යුත්තේ ය.

**18.** යම් විවාදයක් පැවැත්වෙන අවස්ථාවේ දී, විවාදය හෝ පාර්ලිමේන්තුව කල් තැබිය යුත්තේ ය, නැතහොත් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක සභාපතිවරයා විසින් කාරක සභාවේ ප්‍රගතිය වාර්තා කරනු ලැබිය යුත්තේ ය, නැතහොත් මූලාසනයෙන් ඉවත් විය යුත්තේ ය, යනුවෙන් ඉදිරිපත්

වන යෝජනාවක් පාර්ලිමේන්තු රීති අයථා පරිදි යොදා ගැනීමක් බවට කථානායකවරයාගේ හෝ අන්කිසි මූලාසනාරූඪ මන්ත්‍රීවරයකුගේ හෝ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක සභාපතිවරයකුගේ හෝ මතය වන්නේ නම්, ඒ පිළිබඳව ප්‍රශ්නය වහා ම මූලාසනයේ සිට විමසනු ලැබිය හැකි ය, නැතහොත් ඒ පිළිබඳ ප්‍රශ්නය සභාභිමුඛ කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

## හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා කල් තැබීම

*****19.** [(1) ප්‍රශ්න අවසාන වූ විට මන්ත්‍රීවරයකු ස්වකීය ස්ථානයේ නැගී සිට හදිසි පොදු වැදගත්කමක් ඇති නිශ්චිත කාරණයක් සාකච්ඡා කිරීම සඳහා කාරණය කුමක්දැයි සඳහන් කරමින් පාර්ලිමේන්තුව කල් තැබීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා ඇතොත් මිස, ප්‍රධාන කටයුතු ආරම්භ කරන තෙක් (අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හැර) පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) (අ) එවැනි ඕනෑම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම් පටන් ගැනීමට පෙර ඒ යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, කථානායකවරයාගේ එකඟත්වය ලබා ඇත්නම්; සහ

(ආ) මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ අවසරය ලබාගෙන ඇත්නම්; හෝ

(ඇ) පාර්ලිමේන්තුවේ අවසරය ලබා නොදෙන ලදුව, විසි දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් ස්වකීය ස්ථානවල සිට ඒ මන්ත්‍රීවරයාගේ ඉල්ලීමට අනුග්‍රහ දැක්වීමට නැගී සිටිත් නම්

මිස (1) ඡේදය යටතේ එවැනි යෝජනාවක් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය:

එසේ වුව ද, කථානායකවරයා, ස්වකීය එකඟත්වය ලබාදීම ප්‍රතික්ෂේප කළහොත් හෝ සාකච්ඡා කිරීමට යෝජනා කර තිබෙන කාරණය රීති විරෝධී යැයි කථානායකවරයා විසින් අදහස් කරන්නේ නම්, යෝජනාව හෝ කථානායකවරයා විසින් අනුමත කරනු ලැබූ ඉන් කොටසක් හෝ පිළිබඳ දැනුම් දීම කියවීමට ප්‍රශ්නය මතුකරන මන්ත්‍රීවරයාට ඉඩ දෙනු ලැබිය හැකි ය. ඉක්බිතිව ම, ස්වකීය එකඟත්වය දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ එම යෝජනාව රීති විරෝධී වෙතැයි තීරණය කිරීමට හෝ හේතු වූ කාරණා කථානායකවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය.

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(3) යෝජනාවට එසේ අනුග්‍රහය ලැබේ නම් නැතහොත් පාර්ලිමේන්තුව විසින් අවසර දෙනු ලබන්නේ නම්, එම යෝජනාව පිළිබඳව අ.භා. 3.30 ට පාර්ලිමේන්තුව විසින් ක්‍රියා කරනු ලැබිය යුත්තේ ය.

(4) කවර හෝ එක් දිනක දී එවැනි යෝජනා එකකට වැඩි ගණනක් සඳහා අවසර ඉල්ලනු නොලැබිය යුත්තේ ය.

(5) ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගන්නා දිනවල දී මේ නියෝගයෙහි විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් හැර, පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ දිනට නියමිත වැඩකටයුතු අතරතුරෙහි දී අ.භා. 5.00 ට පෙර එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.]

## කල්තබන අවස්ථාවේ යෝජනා හෝ ප්‍රශ්න

**20.** පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් සභාව කල් තබන අවස්ථාවේ දී යෝජනාවක් හෝ ප්‍රශ්න සලකා බැලීමට තීරණය කරනු ලැබ ඇති දිනයක දී, සභාවේ ප්‍රධාන කටයුතු සමාප්ත කිරීමෙන් අනතුරුව, මතු සඳහන් රීතිවලට යටත්ව පැය එකකට නොවැඩි කාලයක් මේ සඳහා වෙන්කර දෙනු ලැබිය යුත්තේ ය:—

(අ) සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, හදිසි පොදු වැදගත්කමකින් යුතු කාරණාවලට සීමා කළ යුත්තේ ය;

(ආ) අදාළ යෝජනාව හෝ ප්‍රශ්න මගින් යම් ස්ථාවර නියෝගයක් උල්ලංඝනය වන බව හෝ එම යෝජනාව හෝ ප්‍රශ්න අසනු ලැබීම අදාළ මන්ත්‍රීවරයාගේ අයිතිවාසිකම අනිසි ලෙස භාවිතා කරනු ලැබීමක් බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, එම යෝජනාව හෝ ප්‍රශ්නය සඳහා ඉඩ නොදීමේ බලය කථානායකවරයා සතු විය යුත්තේ ය;

(ඇ) විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය අතරතුර සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න සඳහා වෙන්කරනු ලබන කාලය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අඩු කරනු ලැබිය හැකි වීම; සහ

(ඈ) සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නවලට අදාළ කාර්ය පටිපාටිය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබීම.

## පිට අය

**21.** (1) කථානායකවරයා විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීතිවලට යටත්ව සභා ගර්භය තුළ වෙන් කරන ලද ස්ථානවල "පිට අයට" රැඳී සිටිය හැකි ය.

(2) පාර්ලිමේන්තුවේ හෝ යම් කාරක සභාවක හෝ රැස්වීමකට පිට අය පැමිණ සිටින බවට යම් මන්ත්‍රීවරයෙක් මූලාසනයේ අවධානය යොමු කරනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, කථානායකවරයා හෝ සභාපතිවරයා විසින් "පිට අය ඉවත් වීම සඳහා නියෝග කරනු ලැබිය යුතු ය" යන ප්‍රශ්නය යම් විවාදයකට හෝ සංශෝධනයකට අවසර නොදී, වහාම විමසනු ලැබිය යුත්තේ ය.

(3) එවැනි දැන්වීමක් නොමැතිව වුව ද, කථානායකවරයා හෝ සභාපතිවරයා විසින් සුදුසු යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක හෝ සභා ගර්භයේ කවර හෝ කොටසක සිටින පිට අය ඉවත් කිරීමට නියෝග කරනු ලැබිය හැකි ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 ව්‍යවස්ථාව යටතේ සිය කාර්යය ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුවට පැමිණ සිටින නීතිපතිවරයා හෝ නීතිපතිවරයාගේ නියෝජිතයකු පිට අයකු ලෙස සලකනු නොලැබිය යුත්තේ ය.

(5) පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට පැමිණීම සඳහා ප්‍රවෘත්ති මාධ්‍යයක යම් නියෝජිතයකුට හෝ නියෝජිතයන් කිහිප දෙනෙකුට පොදු අවසරයක් ලබා දීමට කථානායකවරයාට හැකි ය. යම් ප්‍රවෘත්ති වාර්තාවක් සාධාරණ නොවන හෝ සභාවට අපකීර්තියක් ඇති කිරීමට අදහස් කරන ලද වාර්තාවක් වන්නේ යැයි කථානායකවරයා විසින් සලකනු ලබන්නේ නම්, එවැනි අවසරයක් අවලංගු කළ හැකි ය.

## පාර්ලිමේන්තුවේ කටයුතු

**22.** පාර්ලිමේන්තුවේ කටයුතු මතු සඳහන් අනුපිළිවෙළට පවත්වනු ලැබිය යුත්තේ ය:—

(1) අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම;

(2) ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ;

(3) කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන;

(4) ලිපිලේඛනාදිය පිළිගැන්වීම;

(5) කාරක සභා වාර්තා පිළිගැන්වීම;

(6) මහජන පෙත්සම් පිළිගැන්වීම;

(7) වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න;

(8) නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනා;

(9) අමාත්‍යාංශ නිවේදන;

(10) පෞද්ගලික පැහැදිලි කිරීම්;

(11) වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න;

(12) ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා;

(13) ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා;

(14) ශෝක ප්‍රකාශ යෝජනා;

(15) ප්‍රධාන වැඩකටයුතු.

## ප්‍රධාන වැඩකටයුතු

**23.** (1) ප්‍රධාන වැඩකටයුතු, දිනට නියමිත කටයුතු හා යෝජනා පිළිබඳ දැනුම්දීම්වලින් සමන්විත විය යුත්තේ ය.

(2) යම් නියමිත දිනයක දී සැලකිල්ලට භාජනය කරනු ලැබිය යුතු යැයි පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලද පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනා සම්මතයක් හෝ වෙනත් යම් කාරණයක් යම් දිනයකට නියමිත වැඩකටයුතු විය යුත්තේ ය. එසේ නියම කරන ලද දිනය වෙනුවට ඊට කලින් වූ දිනයක් යොදා ගනු ලැබිය නොහැකි ය.

(3) එක් එක් මාසයේ පළමුවැනි සිකුරාදා රැස්වීම හැර අනෙකුත් සෑම දිනයක ම ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය.

(4) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් එක් එක් මාසයේ පළමුවැනි සිකුරාදා රැස්වීමේ ප්‍රධාන කටයුතු ආරම්භයේ දී “ආණ්ඩුවේ කටයුතු අද දින මුඛ්‍යස්ථානය ගත යුතු ය” නැතහොත් “ආණ්ඩුවේ කටයුතුවලින් නිශ්චිතව දක්වා ඇති යම් කටයුත්තක් අද දින මුඛ්‍යස්ථානය ගත යුතු ය” යනුවෙන් සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව තීරණය කරනු ලැබිය යුතු යෝජනාවක්, දැනුම් දීමක් නොමැතිව ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි යෝජනාවක් සම්මත වුවහොත්, ආණ්ඩුවේ කටයුතු හෝ නිශ්චිතව දක්වා ඇති කටයුත්ත ඒ අනුව මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය.

(5) ආණ්ඩුව විසින් සුදුසු යැයි සලකනු ලබන අනුපිළිවෙළට ආණ්ඩුවේ කටයුතු වැඩ සටහනට ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

## පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා

**24.** (1) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් නියෝග කරන්නේ නම් මිස, එක් එක් මාසයේ රැස්වීම පැවැත්වෙන පළමුවැනි සිකුරාදා පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ කටයුතු ආණ්ඩුවේ කටයුතු අභිබවා මුඛ්‍යස්ථානය ගත යුතු අතර, යෝජනා පිළිබඳ දැනුම්දීම දිනට නියමිත වැඩකටයුතු අභිබවා මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය.

(2) පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් පිළිබඳව දැනුම්දීමක් කරනු ලබන යම් මන්ත්‍රීවරයකු එම යෝජනාව යම් නිශ්චිත පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ දිනයකට නියම කරගැනීමට කැමැත්ත පළ කරන්නේ නම් මිස, පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ සියලු ම යෝජනා ඊළඟට තිබෙන පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ දිනයට නියම කරනු ලැබිය යුත්තේ ය. එවැනි යෝජනා සියල්ල ම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ පළ වන අනුපිළිවෙළට සාකච්ඡාවට ගනු ලැබිය යුත්තේ ය. පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා කාලානුක්‍රමික අනුපිළිවෙළට පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයේ ඇතුළත් කරනු ලැබිය යුතු අතර, දී ඇති කවර හෝ අවස්ථාවක දී යම් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරන ලද එවැනි යෝජනා දහයකට වඩා වැඩි සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු නොලැබිය යුත්තේ ය.

(3) "පෞද්ගලික මන්ත්‍රීවරයා" යන්නට කථානායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, අග්‍රාමාත්‍ය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍ය, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය, පාර්ලිමේන්තුවේ සභානායක, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක යනාදී ධූර දරන මන්ත්‍රීවරයකු ඇතුළත් නොවේ.

**25.** පාර්ලිමේන්තුව කල් තබන විට වැඩකටයුතු අවසන් නොකරන ලද දිනට නියමිත සියලු කටයුතු ඒ සඳහා යෝජනාවක් ඉදිරිපත් නොකර ම ඊළඟ රැස්වීම් දිනයට කල් දැමිය යුත්තේ ය. තවද, මන්ත්‍රීවරයකුගේ නමින් ඇති යෝජනා පිළිබඳ දැනුම්දීම් සම්බන්ධයෙන් එම මන්ත්‍රීවරයන්ගෙන් නිශ්චය වශයෙන් ම යම් උපදෙසක් ලැබී නැතහොත්, වැඩකටයුතු අවසන් නොකළ යෝජනා පිළිබඳ සියලු දැනුම්දීම්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ හෝ නමින් තිබේ නම් ඊළඟ රැස්වීම් දිනයට ද, පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ නමින් තිබේ නම් රැස්වීමක් නියමිතව ඇති ඊළඟ මාසයේ ප්‍රථම සිකුරාදා දිනයට ද, ගෙන යා යුත්තේ ය.

## ලිපිලේඛනාදිය

**26.** (1) කථානායකවරයා, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් පමණක් ලිපිලේඛනාදිය පිළිගන්වනු ලැබිය යුත්තේ ය.

(2) සෑම ලිපිලේඛන පිළිගැන්වීමක් ම පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වල ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

(3) කිසියම් ලිපිලේඛනයක් පිළිගැන්වීමේ දී එහි අන්තර්ගතය පිළිබඳ කෙටි විස්තරාත්මක ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය. එහෙත් පිළිගන්වනු ලබන අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් විවාදයක් පවත්වනු නොලැබිය යුත්තේ ය.

(4) පිළිගන්වනු ලබන ලිපිලේඛන සියල්ලක්ම සහා මේසය මත තිබිය යුතු යැයි නියෝග කරන ලද්දක් මෙන් සලකනු ලැබිය යුතු අතර, එම ලිපිලේඛන මුද්‍රණය කිරීමට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් වෙතොත්, සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව නිර්ණය කරනු ලැබිය යුත්තේ ය.

## දැනුම්දීම්

**27**. (1) ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳ දැනුම් දිය යුත්තේ දැනුම් දෙනු ලබන මන්ත්‍රීවරයාගේ අත්සන දරන ලියවිල්ලක් මහ ලේකම්වරයා නමට ලිවීමෙනි. එවැනි දැනුම්දීම් පාර්ලිමේන්තුව රැස් වී සිටින කවර වේලාවක දී හෝ මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය හැකිය. එසේ නැතහොත්, කවර වේලාවක දී හෝ මහ ලේකම්වරයාගේ කාර්යාලයට යවනු ලැබිය හැකිය; නැතහොත් භාරදෙනු ලැබිය හැකි ය.

(2) රීති විරෝධී යැයි කථානායකවරයා විසින් තීන්දු කරනු ලබන යම් ප්‍රශ්නයක් හැර මහ ලේකම්වරයාට දැනුම්දීම් ලැබී ඇති සියලු ප්‍රශ්න, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින හතක් ඉකුත් වන්නට මත්තෙන් නොයෙදෙන දිනයක දී පිළිතුරු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුවද, ප්‍රශ්න අවසානයේ දී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකවරයකු විසින් අසනු ලැබිය හැකි ය.

(3) රීති විරෝධී යයි කථානායකවරයා තීන්දු කරන යම් යෝජනාවක් හැර, මහ ලේකම්වරයාට ලැබී ඇති දැනුම්දීම් පිළිබඳ වූ සියලු යෝජනා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය; එහෙත් පාර්ලිමේන්තුව අන් කිසි නියෝගයක් කරතොත් මිස, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින පහක් ඉකුත් වී ඇතොත් මිස, ඒ සම්බන්ධව විවාදයක් පවත්වනු නොලැබිය යුත්තේ ය. මෙම ඡේදයන්හි කුමක් සඳහන් වුවද, ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන යෝජනා පිළිබඳ දැනුම්දීම් කිසිවක් ඉකුත් රැස්වීම් දින සහා මේසය ඉදිරියේ භාරගනු ලැබ තිබේ නම් එය න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුත්තේ ය.

(4) කිසියම් කාරණයක් පිළිබඳව දැනුම් දෙන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් විවාදයක් පවත්වනු නොලැබිය යුත්තේ ය.

(5) මෙම ස්ථාවර නියෝග මගින් අන් කිසි විධානයක් කර ඇතොත් මිස, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලද යෝජනාවක් හෝ කටයුතු මත හැර විවාදයක් පවත්වනු නොලැබිය යුත්තේ ය.

(6) ප්‍රශ්නයක් හෝ යෝජනාවක් පිළිබඳව දැනුම්දීමක් කර ඇති මන්ත්‍රීවරයෙකුට මහ ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම් දීමෙන් ඒවා ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(7) අමාත්‍යාංශ නිවේදනයක් අග්‍රාමාත්‍යවරයා විසින් හෝ අදාළ විෂය පිළිබඳ අමාත්‍යාංශ වගකීම පැවරී ඇති අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එසේ, එබඳු නිවේදනයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන අමාත්‍යවරයකු අදාළ නිවේදනයේ පිටපතක් කලින් කථානායකවරයා වෙත ලබා දී ඒ සඳහා පළමුව අනුමතිය ගනු ලැබිය යුත්තේ ය.

(8) යම් මන්ත්‍රීවරයකු සභාවේ නොසිටි අවස්ථාවක සභාවේ වෙනත් මන්ත්‍රීවරයකු විසින් එම මන්ත්‍රීවරයාගේ පෞද්ගලික හැසිරීම සම්බන්ධයෙන් කරන ලද සඳහනකට ප්‍රතිචාර වශයෙන් එම මන්ත්‍රීවරයාගේ පෞද්ගලික කල්ක්‍රියාව නිදොස්කර ගැනීමේ කාර්යය සඳහා පෞද්ගලික පැහැදිලි කිරීමක් කරනු ලැබිය හැකි ය. එවැනි පැහැදිලි කිරීමක් කිරීමට අදහස් කරනු ලබන යම් මන්ත්‍රීවරයකු විසින්, කථානායකවරයාට එම පෞද්ගලික පැහැදිලි කිරීමේ පිටපතක් කලින් ලබා දී ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුම්දීමක් කර පළමුව ඒ සඳහා කථානායකවරයාගේ අනුමතිය ගනු ලැබිය යුත්තේ ය. එම පෞද්ගලික පැහැදිලි කිරීම එම මන්ත්‍රීවරයාගේ පෞද්ගලික කල්ක්‍රියාව නිදොස් කර ගැනීමේ කාර්යය සඳහා නියත වශයෙන්ම සීමා විය යුත්තේ ය.

**28.** ස්ථාවර නියෝග අන් කිසි නියමයක් කර ඇතොත් මිස, මතු සඳහන් යෝජනා සම්බන්ධයෙන් හැර, ඉදිරිපත් කිරීමට අදහස් කරන කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම්දීමක් කරනු ලැබිය යුත්තේ ය:—

(අ) පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව තුළ දී කරන ලද යෝජනාවක්;

(ආ) පාර්ලිමේන්තුව හෝ කවර වූ හෝ විවාදයක් කල් තැබීම සඳහා කරනු ලබන යෝජනාවක්;

(ඇ) විශේෂ කාරක සභාවක වාර්තාවක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබීමට හෝ මුද්‍රණය කිරීමට කරනු ලබන යෝජනාවක්;

(ඈ) පිට අය ඉවත් කිරීමට කරනු ලබන යෝජනාවක්;

(ඉ) මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව අත්හිටවීමට කරනු ලබන යෝජනාවක්;

(ඊ) වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් සම්බන්ධ යෝජනාවක්;

(උ) එදින පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව ක්‍රියාකර අවසන් වූ වහාම කිසියම් අලුත් කාරණයකට අවතීර්ණ වීමට පෙර අවසන් වූ ඒ කටයුතුවලින් පැන නඟින යෝජනාවක්.

**29.** (1) පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට ඍජුව ම සම්බන්ධ හදිසි යෝජනාවක් අන් සියලු යෝජනාවන් ද එදිනට නියමිත සියලු කටයුතු ද අභිබවා මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට ඍජුව ම සම්බන්ධ ප්‍රශ්නයක් මෑතක දී පැන නැඟ තිබෙන විට, ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් මත වූ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පාර්ලිමේන්තුවේ කටයුතු කවර හෝ වේලාවක දී තාවකාලිකව නතර කරනු ලැබිය හැකි ය.

(2) එවැනි වරප්‍රසාද පිළිබඳ කාරණයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන කිසියම් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ කටයුතු තාවකාලිකව නතර කිරීම සඳහා පළමුව මූලාසනය වෙත දැනුම් දී ඒ සඳහා මූලාසනයේ අවසරය ගනු ලැබිය යුත්තේ ය.

## මහජන පෙත්සම්

**30.** (1) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන සෑම පෙත්සමක් ම කථානායකවරයාගේ නමට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මන්ත්‍රීවරයකු විසින් පිළිගන්වනු ලැබිය යුත්තේ ය.

(2) සෑම පෙත්සමක් ම ගෞරවාන්විත භාෂාවෙන් විය යුතු අතර, එහි අදාළ නොවන ප්‍රකාශ අන්තර්ගත නොවිය යුත්තේ ය.

(3) සෑම පෙත්සමක් ම පැහැදිලිව කියවිය හැකි විය යුතු අතර, ඉල්ලා සිටිනු ලබන සහනය ප්‍රකාශ කරන ආයාචනයකින් එය අවසන් විය යුත්තේ ය.

(4) අසනීපයක් හේතුවෙන් නොහැකියාවට පත් වූ අවස්ථාවක හැර සෑම පෙත්සමක් ම පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් හෝ විසින් අත්සන් කරනු ලැබිය යුත්තේ ය. ලිවීමට නොහැකි කෙනෙකු විසින් සාක්ෂිකරුවකු ඉදිරියේ තම සලකුණ තබනු ලැබිය යුත්තේ ය. පෙත්සමකට අත්සන් තබනු ලබන සෑම තැනැත්තකුගේ ම සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය එහි සඳහන් ව තිබිය යුත්තේ ය. පෙත්සම්කරු විසින් දුරකථන අංකය ද ඇතුළුව වෙනත් කවර හෝ සම්බන්ධ කරගත හැකි තොරතුරු ද සඳහන් කරනු ලැබිය හැකි ය.

(5) යම් පෙත්සමකට කවර හෝ ලිපි, දිවුරුම් ප්‍රකාශ හෝ වෙනත් ලේඛන අමුණා නොතිබිය යුත්තේ ය.

(6) යම් පෙත්සමක, පාර්ලිමේන්තුවේ කිසි ම විවාදයක් පිළිබඳ සඳහන් කරනු නොලැබිය යුත්තේ ය.

(7) තමාගේ ම පෙත්සමක් පිළිගැන්වීමේ බලය මන්ත්‍රීවරයකුට නොතිබිය යුත්තේ ය, එහෙත් එය වෙනයම් මන්ත්‍රීවරයකු විසින් පිළිගන්වනු ලැබිය හැකි ය.

(8) සෑම පෙත්සමක් ම එය පිළිගැන්වීමට පෙර මුලින් එය භාර මන්ත්‍රීවරයා විසින් අත්සන් කරනු ලැබ, යටත් පිරිසෙයින් සම්පූර්ණ දින දෙකක්වත් මහ ලේකම්වරයා වෙත තිබෙන සේ එය භාර දෙනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා විසින් එය කථානායකවරයාගේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. තවද, කිසි ම පෙත්සමක් එසේ අනුමත කරනු ලබන තුරු, පිළිගන්වනු නොලැබිය යුත්තේ ය.

(9) පෙත්සමක් පිළිගන්වනු ලබන මන්ත්‍රීවරයකු විසින් තම ප්‍රකාශය මතු සඳහන් ආකෘතියට සීමා කරනු ලැබිය යුතු අතර, එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසි ම විවාදයකට අවසර දෙනු නොලැබිය යුත්තේ ය:—

"ගරු කථානායකතුමනි, ................................................ පදිංචි
(ලිපිනය)
................................................ ගෙන් සහ වෙනත්
(පෙත්සම්කරුගේ නම)
.................................... දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි."
(පෙත්සම්කරුවන්ගේ සංඛ්‍යාව)

(10) පෙත්සමක් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලැබීමෙන් අනතුරුව එය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලැබිය යුත්තේ ය.

## ප්‍රශ්න

**31.** මෙම ස්ථාවර නියෝග මගින් විධිවිධාන සලසා ඇති වැඩකටයුතු සිදු කරන අවස්ථාවේ දී පොදු කටයුතු පිළිබඳ ප්‍රශ්න අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ ජනාධිපතිවරයා විසින් පවරා දෙන ලද යම් විෂයයන් හා කාර්ය භාරයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය වගකීම ඇති අමාත්‍යවරයාගෙන් අසනු ලැබිය හැකි ය.

**32.** (1) වාචික පිළිතුරක් ඉල්ලා ඇති යම් ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි පළ වූ අවස්ථාවක, එම ප්‍රශ්නය පළ වී තිබෙන්නේ යම් මන්ත්‍රීවරයකුගේ නමින් ද, කථානායකවරයා විසින් එම මන්ත්‍රීවරයා අමතනු ලැබිය යුතු අතර, එසේ අමතනු ලැබූ මන්ත්‍රීවරයා ස්වකීය ස්ථානයෙහි නැගී සිට ප්‍රශ්නයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි දී ඇති අංකය සඳහන් කරමින් එය අසනු ලැබිය යුත්තේ ය. එවිට ප්‍රශ්නය යොමු කරනු ලැබූ අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් ඊට පිළිතුරු දෙනු ලැබිය යුත්තේ ය.

(2) ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා නියමිත දින එම ප්‍රශ්නවලට වාචිකව පිළිතුරු සැපයීම සඳහා අදාළ අමාත්‍යවරයා හෝ එම අමාත්‍යවරයා පැමිණ නොසිටියි නම් එම අමාත්‍යවරයා විසින් බලය පවරන ලද අදාළ විෂයය භාර අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට පැමිණ සිටිය යුත්තේ ය.

(3) යම් නිශ්චිත දිනයක දී මන්ත්‍රීවරයකු විසින් මතු කරන ලද යම් ප්‍රශ්නයකට වාචික පිළිතුරු සැපයීම සඳහා පාර්ලිමේන්තුවට පැමිණීමට නොහැකිවන අමාත්‍යවරයකු ඒ සඳහා කථානායකවරයාගේ පූර්ව අවසරය ගනු ලැබිය යුතු අතර, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා එකී අමාත්‍යවරයා විසින් යොදා ඇති වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් කථානායකවරයාට දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

(4) පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ප්‍රශ්නයක් සඳහා අවම වශයෙන් තුන්වැනි අවස්ථාවේදීවත් පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) ප්‍රශ්නයකට ලිඛිත පිළිතුරක් ඉල්ලා ඇති විට, එම ප්‍රශ්නය යොමු කරන ලද අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් ඒ සඳහා වන පිළිතුර හැන්සාඩ් වාර්තාවෙහි භාෂාත්‍රයෙන් මුද්‍රණය කිරීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

**33.** (1) 32 ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නගින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය.

එසේම තවදුරටත්, කවර හෝ අතුරු ප්‍රශ්නයක් මගින් ප්‍රශ්න ඇසීමට ඇති ඉඩකඩ පිළිබඳ රීති උල්ලංඝනය වේ යැයි කථානායකවරයාගේ මතය වන්නේ නම්, එම අතුරු ප්‍රශ්න අසනු ලැබීමට කථානායකවරයා විසින් ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය.

(2) අතුරු ප්‍රශ්න ඇසීමට සහ ඒවාට පිළිතුරු දීම සඳහා ලබා දී ඇති කාලය කථානායකවරයා විසින් සීමා කරනු ලැබිය හැකි ය.

**34.** (1) ප්‍රශ්නයක නිසි අරමුණ විය යුත්තේ ප්‍රශ්නය යොමු කරනු ලබන අමාත්‍යවරයාගේ විශේෂ දැනුමට ගෝචර කාරණයක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙස අයැද සිටීම වේ.

(2) ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් කර නොගත යුත්තේ ය.

**35.** යම් දිනයක දී ප්‍රශ්න සඳහා පැයකට නොවැඩි කාලයක් වෙන්කරනු ලැබිය යුතු අතර, කිසි ම මන්ත්‍රීවරයකු එක් දිනක දී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න දෙකකට වඩා වැඩියෙන් අසනු නොලැබිය යුත්තේ ය:

එසේ වුව ද, විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව සඳහා නියම කර ගෙන ඇති දිනයක ප්‍රශ්න සඳහා මිනිත්තු තිහකට නොවැඩි කාලයක් වෙන්කරනු ලැබිය යුත්තේ ය.

**36.** ප්‍රශ්න ඇසීමේ අයිතිවාසිකම මතු සඳහන් රීතිවලට යටත් විය යුත්තේ ය:—

(අ) කවර හෝ එක් ප්‍රශ්නයක දී එක් විෂයයක් ගැන පමණක් සඳහන් විය යුතු අතර, ප්‍රශ්නය වචන එකසිය පනහක් නොඉක්මවිය යුත්තේ ය;

(ආ) ප්‍රශ්නය පැහැදිලිව තේරුම් ගැනීම සඳහා අත්‍යවශ්‍ය නොවන යම් නමක් හෝ ප්‍රකාශයක් ප්‍රශ්නයක සඳහන් කරනු නොලැබිය යුත්තේ ය;

(ඇ) ප්‍රශ්නයක ප්‍රකාශයක් ඇතුළත් වේ නම්, එම ප්‍රකාශයේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයා විසින් එහි වගකීම භාරගනු ලැබිය යුත්තේ ය;

(ඈ) ප්‍රශ්නයක කිසිම තර්කයක්, අනුමානයෙන් බැසගත් තීරණයක්, ආරෝපිත චෝදනාවක්, අනවශ්‍ය විස්තර දක්වන පදයක්, හෝ අවඥා සහගත ප්‍රකාශයක් ඇතුළත් නොවිය යුත්තේ ය;

(ඉ) කාරක සභාවක වාර්තාවක් මගින් පාර්ලිමේන්තුවට දැනුම් නොදෙන ලද එම කාරක සභාවේ වැඩකටයුතු පිළිබඳ ප්‍රශ්නයක් අසනු නොලැබිය යුත්තේ ය;

(ඊ) අධිකරණයක විනිශ්චයට භාජන වෙමින් පවතින යම් කාරණයක් හෝ අධිකරණ තීරණයක් ලබා දීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක සඳහනක් නොතිබිය යුත්තේ ය;

(උ) මතයක් ප්‍රකාශ කරනු පිණිස හෝ අමූර්ත නීති ප්‍රශ්නයකට හෝ මනඃකල්පිත ප්‍රශ්නයකට විසඳුමක් වශයෙන් ප්‍රශ්නයක් අසනු නොලැබිය යුත්තේ ය;

(ඌ) යම් තැනැත්තකුගේ නිල තත්ත්වය හෝ පොදු තත්ත්වයට අදාළව හැර එම තැනැත්තාගේ චරිතය හෝ හැසිරීම ගැන සඳහන් වන ප්‍රශ්නයක් අසනු නොලැබිය යුත්තේ ය;

(එ) පූර්ණ යෝජනාවකින් පමණක් යම් තැනැත්තකුගේ චරිතය හෝ හැසිරීම අභියෝග කරනු ලැබිය හැකි අවස්ථාවක, එවැනි තැනැත්තකුගේ චරිතය හෝ හැසිරීම පිළිබඳව සඳහන් ප්‍රශ්නයක් අසනු නොලැබිය යුත්තේ ය;

(ඒ) පෞද්ගලික ස්වභාවයෙන් චෝදනාවක් කරනු ලබන හෝ අඟවනු ලබන ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය; සහ

(ඔ) යම් සභා වාරයක දී සම්පූර්ණයෙන් පිළිතුරු සපයන ලද ප්‍රශ්නයක් නැවත එම සභා වාරය තුළදී ම අසනු නොලැබිය යුත්තේ ය.

**37.** (1) මෙම ස්ථාවර නියෝග යටතේ යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දිය හැකි ද, නොහැකි ද, යන්න කථානායකවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, යම් ප්‍රශ්නයක් ප්‍රශ්න ඇසීමේ අයිතිය අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමක් හෝ එය පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටියට බාධා කිරීමට හෝ අගතිදායක ලෙස බලපෑමට සිතාමතා අසනු ලබන බව හෝ එමගින් යම් ස්ථාවර නියෝගයක් උල්ලංඝනය වන බව කථානායකවරයාගේ මතය වේ නම්, කථානායකවරයා විසින් එම ප්‍රශ්නය ඇසීමට ඉඩ නොදී සිටිය හැකි ය. කථානායකවරයා විසින් යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ නොදීම, ඒ සඳහා හේතු ද සමඟ මහ ලේකම්වරයා විසින් අදාළ මන්ත්‍රීවරයාට ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුත්තේ ය.

(2) අනුචිත ප්‍රකාශ අඩංගු, නැතහොත් පාර්ලිමේන්තුවේ කිසියම් ස්ථාවර නියෝගයකට අනනුකූල යම් දැනුම්දීමක් එය පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයේ පළ කරනු ලැබීමට පෙර ප්‍රශ්නය අසන මන්ත්‍රීවරයාගේ එකඟත්වය ඇතිව කථානායකවරයා විසින් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(3) යම් ප්‍රශ්නයක් සඳහා දීර්ඝ පිළිතුරක් අවශ්‍ය බව කථානායකවරයාගේ මතය වේ නම්, කථානායකවරයා විසින් එම ප්‍රශ්නය වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්නයක් ලෙස සලකනු ලැබිය හැකි අතර, එම තීරණය මහ ලේකම්වරයා විසින් අදාළ මන්ත්‍රීවරයාට සන්නිවේදනය කරනු ලැබිය යුත්තේ ය.

## අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න

**38.** (1) සෑම මාසයක ම පළමුවැනි රැස්වීම් සතියේ බදාදා වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන් කර ඇති කාලය තුළ මිනිත්තු තිහක කාලයක් ප්‍රශ්න හතරකට නොවැඩි සංඛ්‍යාවක් අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලැබීම සඳහා වෙන්කරනු ලැබිය යුත්තේ ය. අග්‍රාමාත්‍යවරයා පළමු බදාදා පැමිණ නොසිටියි නම් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තත් කාර්යය සඳහා එම මාසය තුළ වෙනත් යෝග්‍ය දිනයක් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) මෙම ස්ථාවර නියෝගය යටතේ යම් ප්‍රශ්නයක් ඇසීමට අපේක්ෂා කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ හැර පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරයකු එම ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ සභානායකවරයාගේ කාර්යාලයට ද පිටපතක් සහිතව ඊට පෙර සතියේ සිකුරාදා මධ්‍යාහ්න 12.00 ට පෙර මහ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබිය යුත්තේ ය.

(3) අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න ජාතික වැදගත්කමකින් යුතු කාරණා ද ඇතුළුව ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අදාළ කාරණාවලට සීමා විය යුත්තේ ය. විස්තරාත්මක පිළිතුරක් හෝ යම් විෂයයකට සීමා වන පිළිතුරක් අපේක්ෂා කරන යම් ප්‍රශ්නයක් අග්‍රාමාත්‍යවරයාගේ අභිමතය පරිදි පිළිතුරු ලබාදීම සඳහා අදාළ විෂයය භාර අමාත්‍යවරයාට යොමු කරනු ලැබිය හැකි ය.

(4) වෙන්කරනු ලබන යම් දිනයක දී ආණ්ඩු පාර්ශ්වයට ප්‍රශ්න දෙකක් ද විරුද්ධ පාර්ශ්වයට ප්‍රශ්න දෙකක් ද වශයෙන් ඇසීමට හැකි ය.

(5) වෙන්කරනු ලබන යම් දිනයක දී එක් මන්ත්‍රීවරයකුට එක් ප්‍රශ්නයක් පමණක් අසනු ලැබිය හැකි අතර, එම ප්‍රශ්නය වචන එකසිය පනහක් නොඉක්මවිය යුත්තේ ය.

(6) අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න, තර්ක සහ මත ප්‍රකාශ කිරීමකින් තොරව අසනු ලැබිය යුත්තේ ය. සෑම ප්‍රශ්නයක්ම එක් පොදු ප්‍රතිපත්තියකට පමණක් සීමා විය යුත්තේ ය.

(7) අග්‍රාමාත්‍යවරයා විසින් යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමෙන් අනතුරුව ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න දෙකක් අසනු ලැබිය හැකි ය. ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව, පාර්ලිමේන්තුවේ වෙනත් ඕනෑම මන්ත්‍රීවරයකුට එම අතුරු ප්‍රශ්නවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් අසනු ලැබිය හැකි ය:

එසේ වුව ද, අතුරු ප්‍රශ්න, මුල් ප්‍රශ්නයට හෝ ඒ සඳහා දෙන ලද පිළිතුරට අදාළ විෂයයට පමණක් සීමා විය යුත්තේ ය.

## විවාදයට භාජනය වන ප්‍රශ්න

**39.** පොදු වැදගත්කමකින් යුතු යම් කාරණයක් පිළිබඳව කවර හෝ මන්ත්‍රීවරයකු විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට හැකියාව තිබිය යුතු අතර, එවැනි යෝජනාවක් මෙම ස්ථාවර නියෝග අනුව විවාද කරනු ලැබිය යුත්තේ ය; නැතහොත් ඊට අනුකූලව වෙනයම් පිළිවෙළකට ක්‍රියා කර අවසන් කරනු ලැබිය යුත්තේ ය.

**40.** (1) මෙම ස්ථාවර නියෝග මගින් ස්ථිර කරනු ලැබිය යුතු යම් යෝජනාවක් හෝ සංශෝධනයක් එසේ ස්ථිර කරනු නොලැබුවහොත් අහෝසි විය යුත්තේ ය.

(2) යම් පෞද්ගලික මන්ත්‍රීවරයකු තම නමින් තිබෙන යෝජනාවක් ඉදිරිපත් කිරීමට කැඳවනු ලබන විට, එම මන්ත්‍රීවරයා විසින් එකී යෝජනාව ඉදිරිපත් කරනු නොලබන්නේ නම්, එකී යෝජනාව ඉදිරිපත් කරනු ලැබීමට එම මන්ත්‍රීවරයා විසින් ලිඛිතව නිසි පරිදි බලය පවරනු ලැබ ඇති වෙනත් යම් මන්ත්‍රීවරයකු විසින් එය ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, එම යෝජනාව අහෝසි විය යුත්තේ ය:

එසේ වුව ද, දිනකට නියමිත වැඩකටයුත්තක් භාරව සිටින යම් මන්ත්‍රීවරයකු එම වැඩකටයුත්ත වෙනත් දිනයකට කල් දැමීමට රිසි බව මහ ලේකම්වරයාට කලින් දන්වා ඇත්නම් මිස, කවර හෝ මන්ත්‍රීවරයකුට එම නියෝගය ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**41.** යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ අවසරය ඇතිව එය ඉල්ලා අස් කර ගනු ලැබිය හැකි ය.

## අපේක්ෂණය

**42.** (1) සලකා බැලීම සඳහා නියමිත පනත් කෙටුම්පතකට හෝ වෙන යම් දිනකට නියමිත වැඩකටයුත්තකට විෂයය වන කාරණා සම්බන්ධ යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කිරීම රීති විරෝධී විය යුත්තේ ය; තවද දැනුම් දෙන ලද යෝජනාවකට විෂය වන කාරණා අදාළ කර ගනිමින් ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක් ද රීති විරෝධී විය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් මත වන විවාදයකදී හෝ වෙන කිසියම් විවාදයකදී හෝ දිනට නියමිත වැඩකටයුත්තක්, යෝජනාවක් පිළිබඳ දැනුම් දීමක් හෝ දැනුම් දෙන ලද සංශෝධනයක් පිළිබඳව අපේක්ෂණයක් කරනු නොලැබිය යුත්තේ ය.

(3) අපේක්ෂණය කිරීමේ හේතුවෙන් කිසියම් සාකච්ඡාවක් රීති විරෝධී යැයි නිශ්චය කිරීමේදී අපේක්ෂණය කරන ලද විෂයය සාධාරණ කාල සීමාවක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කොතෙක් දුරට ඉඩ තිබේ ද යන්න කථානායකවරයාගේ සැලකිල්ලට භාජනය විය යුත්තේ ය.

## සංශෝධන

**43.** (1) මූලාසනයෙන් සභාභිමුඛ කරනු ලබන ප්‍රශ්නයක්—

(අ) ඇතැම් වචන වෙනුවට වෙනත් වචන ඇතුළත් කරනු ලැබීම සඳහා එම වචන ඉවත් කරනු ලැබීමෙන්; හෝ

(ආ) ඇතැම් වචන ඉවත් කරනු ලැබීමෙන්; හෝ

(ඇ) වෙනත් ඇතැම් වචන ඇතුළත් කරනු ලැබීමෙන් හෝ එකතු කරනු ලැබීමෙන්; හෝ

සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම සංශෝධනයක්ම ලිඛිතව තිබිය යුතු අතර, යෝජනා කරනු ලබන මන්ත්‍රීවරයා විසින් එය මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය යුත්තේ ය.

(3) පනත් කෙටුම්පතකට යෝජනා කරනු ලබන සෑම සංශෝධනයක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිපතිවරයා විසින් පරීක්ෂා කරනු ලැබිය යුත්තේ ය.

(4) ප්‍රශ්නයකට ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක්, එම සංශෝධනය යෝජනා කරනු ලබන ප්‍රශ්නයට පමණක් අදාළ විය යුත්තේ ය.

(5) පාර්ලිමේන්තුවේ රීති අනුව දැනුම්දීමකින් අනතුරුව ඉදිරිපත් කරනු ලබන පූර්ණ යෝජනාවකින් පමණක් මතු කරනු ලැබිය හැකි යම් ප්‍රශ්නයක් සංශෝධනයකින් මතු කරනු නොලැබිය යුත්තේ ය.

(6) ප්‍රශ්නයක කිසියම් කොටසකට ඉදිරිපත් කරන ලද සංශෝධනයක් සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබීමෙන් අනතුරුව ඊට පූර්වයෙන් ඇති කොටසක් සංශෝධනය කරනු නොලැබිය යුත්තේ ය.

(7) එමෙන් ම, ප්‍රශ්නයක කිසියම් කොටසකට සංශෝධනයක් මූලාසනයෙන් සභාභිමුඛ කරනු ලැබ ඇති අවස්ථාවකදී, එසේ සභාභිමුඛ කරන ලද සංශෝධනයක් ඉල්ලා අස්කර ගනු ලැබුවහොත් මිස, ඊට පූර්වයෙන් ඇති කොටසක් සංශෝධනය කරනු නොලැබිය යුත්තේ ය.

(8) යම්කිසි ප්‍රශ්නයක් පිළිබඳ වූ සංශෝධනයක් එම ප්‍රශ්නය පිළිබඳව ම කවර හෝ පනත් කෙටුම්පතකට හෝ කාරණයකට එම අවධියේදී ම දෙන ලද පූර්ව තීරණයකට අනනුකූල නොවිය යුත්තේ ය.

(9) මූලාසනයෙන් සභාභිමුඛ කරන ලද සංශෝධනයකට, සංශෝධනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**44.** (1) සංශෝධනයකින් අදහස් කරනු ලබන්නේ ඇතැම් වචන ඉවත්කරනු ලැබ ඒ වෙනුවට වෙනත් වචන ඇතුළත් කරනු ලැබීමට නම් කථානායකවරයා හෝ සභාපතිවරයා විසින් සංශෝධනය සඳහන් කරනු ලැබීමෙන් අනතුරුව, "ඉවත් කරනු ලැබීමට යෝජනා කරන ලද වචන ප්‍රශ්නයෙහි හෝ වගන්තියෙහි කොටසක් වශයෙන් තිබිය යුත්තේ ය" යන ප්‍රශ්නය පළමුව සභාභිමුඛ කරනු

ලැබිය යුත්තේ ය. එම ප්‍රශ්නය විමසන ලදුව එය නිෂ්ප්‍රභ වෙත් නම්, "සංශෝධනයෙන් යෝජනා කරනු ලබන වචන ඒ වෙනුවට ආදේශ විය යුත්තේ ය" යන ප්‍රශ්නය එතුමා විසින් සභාභිමුඛ කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, සංශෝධනයක් පිළිබඳව පාර්ලිමේන්තුවේ පිළිගැනීම ගැන විමසන ප්‍රශ්නය වශයෙන් කථානායකවරයා හෝ සභාපතිවරයා, හැකිනම් විමසනු ලැබිය යුත්තේ රීතියානුකූල සංශෝධනයක් ඊට පසු ඉදිරිපත් කරනු ලැබීම නොවළක්වන වචන පමණක් ය. එලෙස සභාභිමුඛ කරන ලද ප්‍රශ්නය නිෂ්ප්‍රභ වෙත් නම් තවත් ප්‍රශ්න කිරීමක් නොමැතිව සංශෝධනය මගින් ඉවත් කරනු ලැබීමට යෝජනා කරන ලද ඉතිරි වචන ඉවත් කරන ලදැයි සලකනු ලැබිය යුත්තේ ය.

(2) සංශෝධනය යෝජනා කරනු ලබන්නේ ඇතැම් වචන ඉවත් කරනු ලැබීමට නම්, සංශෝධනය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඉවත් කරනු ලැබීමට යෝජනා කරන ලද වචන ප්‍රශ්නයෙහි හෝ වගන්තියෙහි කොටසක් වශයෙන් තිබිය යුතු යැයි යන ප්‍රශ්නය කථානායකවරයා හෝ සභාපතිවරයා විසින් සභාභිමුඛ කරනු ලැබිය යුත්තේ ය.

(3) සංශෝධනය යෝජනා කරනු ලබන්නේ ඇතැම් වචන ඉවත් කරනු ලැබීමට, ආදේශ කරනු ලැබීමට, ඇතුළත් කරනු ලැබීමට හෝ එකතු කරනු ලැබීමට නම්, සංශෝධනය සඳහන් කරනු ලැබීමෙන් අනතුරුව, යෝජනා කරන ලද වචන ඉවත් කරනු ලැබිය යුතු යැයි, ආදේශ කරනු ලැබිය යුතු යැයි, ඇතුළත් කරනු ලැබිය යුතු යැයි හෝ එකතු කරනු ලැබිය යුතු යැයි යන ප්‍රශ්නය කථානායකවරයා හෝ සභාපතිවරයා විසින් සභාභිමුඛ කරනු ලැබිය යුත්තේ ය.

(4) මෙම නියෝගයේ ඉහත ඡේදවල විධිවිධානවල කුමක් සඳහන් වුවද, එකී ඡේදවල සඳහන් "ප්‍රශ්නය හෝ ප්‍රශ්න" වෙනුවට, "සංශෝධනය පිළිගනු ලැබිය යුතු යැයි" යන ප්‍රශ්නය කථානායකවරයා විසින් සභාභිමුඛ කරනු ලැබිය හැකි ය.

(5) සභාභිමුඛ සංශෝධනයට සංශෝධනයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, පළමු කී සංශෝධනයට ඉදිරිපත් කරනු ලබන සංශෝධන සියල්ල සම්බන්ධයෙන් ක්‍රියා කර අවසන් වන තෙක් එය මුල් ප්‍රශ්නය වශයෙන් සලකා ඒ පිළිබඳව ක්‍රියා කරනු ලැබිය යුත්තේ ය.

**45**. ප්‍රශ්නයක් පිළිබඳ විවාදය අවසන් වූ විට, කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ ප්‍රශ්නය මුල් ස්වභාවයෙන් ම තිබේ නම් ඒ ස්වභාවයෙන් ද, එසේ නොමැතිව සංශෝධනය වී තිබේ නම් එම ස්වභාවයෙන් ද ප්‍රකාශ කොට, ප්‍රශ්නය විමසනු ලැබිය යුත්තේ ය.

## සමාප්තිය

**46**. (1) ප්‍රශ්නයක් සභාභිමුඛ කරනු ලැබීමෙන් අනතුරුව, මන්ත්‍රීවරයකුට ස්වකීය ස්ථානයේ නැගී සිට, "ප්‍රශ්නය දැන් විමසනු ලැබිය යුත්තේ ය" යනුවෙන්

යෝජනා කරනු ලැබීමේ අයිතිය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. එවිට, යෝජනාව සහා රීති අයුතු අන්දමට භාවිතා කරනු ලැබීමක් හෝ සුළු පාර්ශ්වයේ අයිතිවාසිකම් කඩ කරනු ලැබීමක් හෝ යනුවෙන් මූලාසනයට පෙනෙතොත් මිස ''ප්‍රශ්නය දැන් විමසනු ලැබිය යුතු යැයි'' යන ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය.

(2) ''ප්‍රශ්නය දැන් විමසනු ලැබිය යුතු යැයි'' යන යෝජනාව සම්මත වී, ඉන් මතුවන ප්‍රශ්නය ද තීරණය කරනු ලැබීමෙන් අනතුරුව, (මීට ඉහතින් සඳහන් කරනු ලැබූ අන්දමට මූලාසනයේ එකඟත්වය නොදෙන ලද්දේ නොවේ නම්) මූලාසනයෙන් ඊට කලින් සභාභිමුඛ කරන ලද කිසියම් ප්‍රශ්නයක් පිළිබඳ තීරණයකට එළඹීමට අවශ්‍ය වැඩිමනත් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) වගන්තියක් සලකා බලන අවස්ථාවේ දී (මීට ඉහතින් සඳහන් කරනු ලැබූ අන්දමට මූලාසනයෙන් එකඟත්වය නොදෙන ලද්දේ නොවේ නම්) ''එම වගන්තියේ ඇති වචන කිසිවක් නියම වශයෙන් යෝජනාවක සඳහන් කරමින් එම වචන වගන්තියේ කොටසක් වශයෙන් තිබිය යුතු යැයි'', නැතහොත් ''වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු යැයි'' හෝ ''පනත් කෙටුම්පතට එකතු කරනු ලැබිය යුතු යැයි'' යන ප්‍රශ්නය දැන් විමසනු ලැබිය යුතු යැයි යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) මෙම නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම යෝජනාවක්ම වහා විමසනු ලැබ සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(5) මන්ත්‍රීවරයන් විසි දෙනෙකු යෝජනාවට පක්ෂව වැඩි පාර්ශ්වයට ඡන්දය ලබාදුන් බව බෙදීමක දී අනාවරණය වන්නේ නම් මිස, මෙම නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් පාර්ලිමේන්තුවේ දී හෝ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක දී හෝ සභා සම්මත නොවිය යුත්තේ ය.

## ඡන්දය දීම

**47.** (1) කථානායකවරයා විසින් ප්‍රශ්නය විමසනු ලැබිය යුතු අතර, ''පක්ෂයි'' සහ ''විරුද්ධයි'' යනුවෙන් කටහඬවල් අනුව ඡන්දය ලබාගෙන කථානායකවරයා විසින් ප්‍රතිඵලය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) කථානායකවරයාගේ තීරණය සමඟ යම් මන්ත්‍රීවරයකු එකඟ නොවන්නේ නම්, කථානායකවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මතු සඳහන් කවර හෝ ක්‍රමයකට ඡන්දයක් සඳහා බෙදීමක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී, බෙදුම් සීනු මිනිත්තු පහක් නාද කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව—

(අ) මන්ත්‍රීවරයන් එක් පේළියෙන් පේළිය බැගින් තම ස්ථානවලින් නැගී සිට සභාව ඉදිරියේ තිබෙන යෝජනාවට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය භාවිතා කිරීම, ගණන් කිරීමෙන් කරනු ලැබිය යුත්තේ ය;

(ආ) විද්‍යුත් ඡන්ද සටහන් කිරීමේ යන්ත්‍රය භාවිතයෙන් ඡන්දය ගනු ලැබිය යුත්තේ ය. මෙහිදී මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් ඉඩදෙනු ලබන කාල සීමාව ඇතුළත ඔවුන්ගේ තීරණය දැක්වීම සඳහා අදාළ බොත්තම එබීමට කටයුතු කරනු ලැබිය යුත්තේ ය;

(ඇ) මහ ලේකම්වරයා විසින් එක් එක් මන්ත්‍රීවරයාගෙන් එම මන්ත්‍රීවරයා ඡන්දය දීමට රිසි කවර ආකාරයෙන් ද යන්න විමසා ඒ අනුව ඡන්ද සටහන් කර ගනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා විසින් පළමුව අග්‍රාමාත්‍යවරයාගේ ද, ඉන්පසු අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ ද, ඉන්පසු අනෙකුත් මන්ත්‍රීවරයන්ගේ ද ඡන්දය ඔවුන්ගේ නම්වල අකාරාදී අනුපිළිවෙළට විමසනු ලැබිය යුතු අතර, යම් මන්ත්‍රීවරයකු ඡන්දය භාවිතා කිරීමෙන් වැළකී සිටීමට අදහස් කරන්නේ නම්, ඒ බව මහ ලේකම්වරයාට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක මහ ලේකම්වරයා විසින් එම මන්ත්‍රීවරයාගේ නම වාර්තා කරමින් ඔහු ඡන්දය භාවිතා කිරීමෙන් වැළකී සිටි ලෙස සටහන් කරනු ලැබිය යුත්තේ ය.

(3) කථානායකවරයා විසින්, තීරණයට පක්ෂව හා විරුද්ධව ප්‍රකාශ කරනු ලැබ ඇති ඡන්ද ගණන නිවේදනය කරනු ලැබිය යුතු අතර, ඡන්ද සංඛ්‍යා සමාන නම්, කථානායකවරයාට තීරක ඡන්දය දෙනු ලැබීමට හැකි ය. කථානායකවරයා විසින්, ඉන්පසු ඡන්ද විමසීමෙහි ප්‍රතිඵලය ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය.

**48.** ඡන්දය විමසීමක දී සටහන් කරන ලද සංඛ්‍යා හෝ නම් සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් නිවැරදි කළ නොහැකි පැටලිලි සහගත තත්ත්වයක් හෝ වරදක් ඇති අවස්ථාවක දී කථානායකවරයා විසින් ඉන් අනතුරුව වහාම තවත් ඡන්ද විමසීමක් වෙත පාර්ලිමේන්තුව යොමු කරනු ලැබිය යුත්තේ ය.

**49.** යම් මන්ත්‍රීවරයකු විසින් සිය ඡන්දය වැරදි ලෙස භාවිතා කරන ලද බව හෝ යම් ඡන්දයක් වැරදි ලෙස ගණන් ගත් බව හෝ ප්‍රකාශ කරනු ලබයි නම්, එම වරද නිවැරදි කරන ලෙස එම මන්ත්‍රීවරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය:

එසේ වුව ද, කථානායකවරයා විසින් ඡන්දය දීම සඳහා ඉඩ ලබා දෙනු ලැබූ කාලය අවසාන වූ බවට ප්‍රකාශ කරනු ලැබීමට පෙර එම මන්ත්‍රීවරයා විසින් එම ඉල්ලීම කරනු ලැබිය යුත්තේ ය.

## පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය

***50.**[(1)යම් අමාත්‍යවරයකු විසින්, දැනුම් දීමෙන් අනතුරුව පනත් කෙටුම්පතක් හඳුන්වා දීම සඳහා පාර්ලිමේන්තුවේ නියෝගයක් නොමැතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ප්‍රධාන කටයුතු ආරම්භයේ දී පනත් කෙටුම්පතක් එසේ ඉදිරිපත් කරනු ලැබූ විට මහ ලේකම්වරයා විසින් පනත් කෙටුම්පතේ නාමය කියවනු ලැබිය යුතු අතර, එවිට, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලදුව එය මුද්‍රණය කරනු ලැබිය යුතු බවට නියෝග කරන ලද සේ සලකා එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට †දින දහහතරක් ඇතුළත නොවන දිනයක් එහි දෙවැනි වර කියවීම සඳහා නියම කිරීම ද කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාවේ සඳහන් හදිසි පනත් කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එහි දෙවැනි වර කියවීම සඳහා නියම කරනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි සෑම පනත් කෙටුම්පතක්ම පළමුවැනි වර කියවීම නිම වූ වහාම යෝජනාවක් නොමැතිව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාව විසින් පනත් කෙටුම්පතට සංශෝධන යෝජනා කරනු ලැබිය හැකි ය. කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ආපසු වාර්තා කරන තෙක් හෝ පාර්ලිමේන්තුව විසින් එසේ වාර්තා කිරීමට ලබා දී ඇති කාලය ඉකුත් වන තෙක් පාර්ලිමේන්තුව විසින් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක කාර්යය සඳහා වහා අවශ්‍ය වන්නා වූ ද, ඒ බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ අත්සන ඇති සටහනක් දරන්නා වූ ද, පනත් කෙටුම්පතකට අදාළව ජනාධිපතිවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයා අමතා යවන ලද යොමු කිරීමක පිටපතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(1) ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා වෙත ලැබී ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(1)(ඇ) ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා ඇති පරිදි කථානායකවරයාට ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් එහි තීරණය ලැබෙන තුරු එකී පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේ ය.]

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

† විසිඑක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා ඇති වූ ආනුෂංගික සංශෝධනය

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III ලැයිස්තුවේ දක්වා ඇති කාරණා සම්බන්ධ පනත් කෙටුම්පත්

**51.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III ලැයිස්තුවේ දක්වා ඇති කාරණයක් සම්බන්ධ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, ඒ සම්බන්ධයෙන් මෙම ස්ථාවර නියෝගයේ (2) ඡේදයේ සඳහන් කර ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුත්තේ ය.

(2) (අ) එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එක් එක් පළාත් සභාවේ අදහස් ලබා ගැනීම සඳහා එම පනත් කෙටුම්පතේ පිටපත් අදාළ පළාත් සභාවට යොමු කරනු ලබන දිනයේ සිට මාස දෙකක් ඇතුළත දී හෝ පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් කාලසීමාවක් තුළ දී එසේ අදහස් දැක්වීමෙන් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබීම සඳහා ඒ එක් එක් පළාත් සභාවට යොමු කරනු ලබන ලෙස කථානායකවරයා විසින් මහ ලේකම්වරයාට නියෝග කරනු ලැබිය යුත්තේ ය.

(ආ) ඉහත (අ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීම හෝ පළාත් සභාවේ අදහස් ලැබීම යන දෙකෙන් කලින් සිදුවන දෙයට අනතුරුව, පාර්ලිමේන්තුව විසින් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනු ලැබිය හැකි ය.

(3) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් සාදනු ලැබීමට නියමිත යම් යෝජිත ප්‍රඥප්තියක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් විමසමින්, යම් පළාත් සභාවකින් දැනුම්දීමක් ලැබුණු කවර හෝ අවස්ථාවක දී, කථානායකවරයා විසින් ලැබෙන පළමුවැනි අවස්ථාවේ දී, එවැනි දැනුම්දීමක් ලැබුණු බව පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුත්තේ ය. ඉන් අනතුරුව එම යෝජිත ප්‍රඥප්තිය ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය.

(ආ) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව, පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවෙන් එම දැනුම්දීම ලැබී මාස දෙකක් ඇතුළත දී, යෝජිත ප්‍රඥප්තිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් අදාළ පළාත් සභාවට ඉදිරිපත් කරන ලෙස මහ ලේකම්වරයාට නියෝග කරනු ලැබිය යුත්තේ ය.

## පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පත්

***52.** [(1) පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන යම් පෞද්ගලික මන්ත්‍රීවරයකු විසින් එම පනත් කෙටුම්පතේ අරමුණ සහ එහි මුඛ්‍යාංගයන් සඳහන් කරමින් එය ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි සෑම ඉල්ලීමක් ම යෝජනාවක් ආකාරයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලීම කරනු ලබන මන්ත්‍රීවරයා විසින්, යෝජිත පනත් කෙටුම්පතේ සිංහල හා දෙමළ භාෂා පිටපත් ඉංග්‍රීසි අනුවාදයක් ද සිය යෝජනාවේ පිටපතක් ද සමඟ මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය යුත්තේ ය.

(3) පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්නත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයට අදාළව යම් බාධාවක් තිබේ ද යන්නත්, පිළිබඳව නීතිපතිවරයාගේ මතය විමසා මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුත්තේ ය. නීතිපතිවරයා විසින් සිය නිරීක්ෂණ සති හයක කාලසීමාවක් ඇතුළත දී පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

(4) නීතිපතිවරයාගේ මතය ලැබීමෙන් අනතුරුව මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත එහි ඉංග්‍රීසි අනුවාදය ද සමඟ සිංහල සහ දෙමළ භාෂාවලින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

(5) පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින හතක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව කවර හෝ වේලාවක ඉහත (2) ඡේදයේ දක්වා ඇති යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

(6) ප්‍රශ්නය සභාභිමුඛ කරනු ලැබ සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් අවසරය දෙන ලදුව හෝ සභාව විසින් අවසරය ලබා නොදුන් අවස්ථාවක දී, එහෙත් මන්ත්‍රීවරයාට සහාය පළ කිරීමට විස්සකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් සිය අසුන්වලින් නැඟී සිටින අවස්ථාවක දී, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලද සේ සලකා මුද්‍රණය කිරීමට නියෝග කරනු ලැබූ පසු සාකච්ඡාවකින් තොරව එය අදාළ වන විෂයය හා කාර්යය භාර අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එවැනි අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ නොමැති නම් කථානායකවරයා විසින් නම් කරනු ලබන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ වෙත එය යොමු කරනු ලැබිය යුත්තේ ය. පනත් කෙටුම්පත යොමු කරනු ලැබූ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබන තෙක් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිදු ඉදිරි පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත්කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(7) ඉහත (6) ඡේදයේ දක්වා ඇති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව හෝ පනත් කෙටුම්පත අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ යොමු කරන ලද දින සිට එම අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් නොකර මාස හයක් ඉකුත් වීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා රිසි දිනයක එය දෙවැනි වර කියවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.]

**53.** (1) යම් විශේෂ පුද්ගලයකුට, සමිතියකට හෝ සංස්ථාගත මණ්ඩලයකට බලපෑමක් ඇති කිරීම සඳහා හෝ යහපතක් සැලසීම සඳහා අදහස් කරනු ලබන යම් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවකදී, එම පනත් කෙටුම්පතේ සාමාන්‍ය ස්වභාවය සහ අරමුණු පිළිබඳ දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ගැසට් පත්‍රයේ සහ ජනරජයේ සංසරණය වන යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබිය යුත්තේ ය. එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරනු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිනු ලැබීමට යටත් පිරිසෙයින් එක් මාසයකට පෙර එම දැන්වීම් පළ කරනු ලැබ තිබිය යුත්තේ ය.

(2) එවැනි සෑම පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන්ම 52 ස්ථාවර නියෝගයේ (2) ඡේදයේ සහ "මේ ස්ථාවර නියෝගයේ (1) ඡේදය යටතේ පළ කරන ලද දැන්වීම්වල පිටපතක්" යන වචන එම ඡේදයේ අවසාන පේළියේ "යෝජනාවේ පිටපතක්" යන වචනවලට පසුව ඇතුළත් කරන ලද්දාක් මෙන් එම ඡේදය බල පැවැත්විය යුත්තේ ය.

(3) එවැනි සෑම පනත් කෙටුම්පතක් ම දෙවැනි වර කියවීමෙන් අනතුරුව කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරනු ලැබිය යුත්තේ ය.

(4) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින්, එම පනත් කෙටුම්පත සම්මත කිරීම යථෝචිත යැයි පෙන්වීමට පනත් කෙටුම්පතේ ඉදිරිපත් කරනු ලබන සාධක සහ අනෙකුත් කරුණු සත්‍ය බව ඔප්පු කරනු පිණිස අවශ්‍ය යැයි කල්පනා කරන වාචික හෝ වෙනයම් සාක්ෂි එම කාරක සභාව විසින් විභාග කරනු ලැබිය යුත්තේ ය. ඊටපසු එම සාධක හා අනෙකුත් කරුණු ඔප්පු වී නොමැති යැයි එම ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් තීරණය කරනු ලබන්නේ නම් ඒ අනුව කාරක සභාව විසින් වාර්තා කරනු ලැබිය යුත්තේ ය. එම සාධක හා අනෙකුත් කරුණු ඔප්පු වී ඇති බවට කාරක සභාව තීන්දු කරන්නේ නම් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් පනත් කෙටුම්පතේ වගන්ති වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබිය යුත්තේ ය. වගන්ති ඉවත් කරනු ලැබීමටත් අලුත් වගන්ති එකතු කරනු ලැබීමටත් අවශ්‍ය යැයි හැඟෙන කවර හෝ සංශෝධනයක් කිරීමටත් කාරක සභාවට හැකි ය. එවැනි අලුත් වගන්ති සහ අනිකුත් සංශෝධන සියල්ලක්ම පාර්ලිමේන්තුවට වාර්තාවකින් දැනුම් දෙනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, මෙම ස්ථාවර නියෝගයෙහි (1) ඡේදය ප්‍රකාරව අවශ්‍ය දැනුම්දීමෙහි අදහසට අනුකූල නොවන කිසි වගන්තියක් එවැනි පනත් කෙටුම්පතකට ඇතුළත් කරනු ලැබීමට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය. යම්කිසි පෞද්ගලික අයිතිවාසිකමක් හෝ බැඳියාවක් කෙරෙහි බලපාන වගන්තියක් එවැනි පනත් කෙටුම්පතකට ඇතුළත් කරනු ලැබීම යුක්ති සහගත සහ යථෝචිත බවට කරුණු එම පනත් කෙටුම්පතින් දක්වා ඇත්නම් මිස, එවැනි වගන්තියක් පනත් කෙටුම්පතෙහි ඇතුළත් කිරීමට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය.

## බලපෑමට ලක්වන පාර්ශ්වයන්, සාක්ෂිකරුවන් සහ සාක්ෂි

*[1]**54.**[පෞද්ගලික අයිතිවාසිකම් හෝ බැඳියාවන් කෙරෙහි යම් පනත් කෙටුම්පතක් මඟින් විශේෂ බලපෑමක් ඇති වන යම් අවස්ථාවක දී, එසේ බලපෑමට ලක්වන යම් පාර්ශ්වයක් විසින් එම පනත් කෙටුම්පත පවරනු ලැබ ඇති යෝග්‍ය ආංශික අධීක්ෂණ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එවිට එම අයට ඒ කාරක සභා ඉදිරියෙහි පෞද්ගලිකව හෝ නීතිඥයකු මාර්ගයෙන් පෙනී සිට කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.]

## දෙවැනි වර කියවීම

**55.**[(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පතක් හැර, වෙනත් පනත් කෙටුම්පතක් එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට †දින දහහතරක් ඇතුළත නොවන යම් දිනයක දෙවැනි වර කියවීම සඳහා නියම කරනු ලැබිය යුත්තේ ය.

(2) යම් පනත් කෙටුම්පතක් හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබ, එහි පිටපතක් කථානායකවරයාට භාර දෙනු ලැබ ඇති අවස්ථාවක දී—

(අ) එම යොමු කරනු ලැබීම හෝ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබීම එසේ යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තු රැස්වීම් දිනයේ දී කථානායකවරයා විසින් ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට දැන්වීමක් කරනු ලැබිය යුත්තේ ය;

(ආ) එම පනත් කෙටුම්පත පිළිබඳ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කථානායකවරයාට දන්වනු ලබන තෙක් හෝ එම යොමු කරනු ලැබීම

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත්කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

** 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

† විසිඑක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා ඇති වූ ආනුෂංගික සංශෝධනය

හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීම කළ දිනයේ සිට සති තුනක කාලයක් ඉකුත් වන තෙක් හෝ යන මේ දෙකෙන් පළමුව එළැඹෙන අවස්ථාව තෙක් එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී තීරණය පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නිවේදනය සම්බන්ධයෙන් විවාදයකට අවසර දෙනු නොලැබිය යුත්තේ ය.]

## දෙවැනි වර කියවීම පිළිබඳ විවාදය

**56.** පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවීමේ දී එම පනත් කෙටුම්පතේ සාමාන්‍ය යෝග්‍යතාව හා ප්‍රතිපත්ති ආවරණය කරමින් විවාදයක් පවත්වනු ලැබිය හැකි ය.

## පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා අවස්ථාව

***57.** [අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවකින් අනතුරුව පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවා ඇති අවස්ථාවක දී, එම පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමේ දී පාර්ලිමේන්තුව විසින් එසේ තීරණය කරනු ලැබුවහොත් වාර්ෂික හෝ පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් හැර, වෙනත් යම් පනත් කෙටුම්පතක් කථානායකවරයා විසින් නම් කරනු ලබන විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ය.]

****58.**[පනත් කෙටුම්පතක් විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබූ අවස්ථාවක දී, එම කාරක සභාව විසින් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වාර්තා කරන තෙක් ඒ පිළිබඳව කිසිදු ඉදිරි පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.]

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

** 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

## පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා කාර්ය පටිපාටිය

**59.** 57 ස්ථාවර නියෝගය යටතේ යම් පනත් කෙටුම්පතක් කාරක සභාවකට යොමු කරන ලද අවස්ථාවක දී, එම කාරක සභාව විසින්, එහි නොයෙකුත් විධිවිධාන සහ යෝජිත සංශෝධන සාකච්ඡා කරනු ලැබිය යුතු අතර, එහි රැස්වීම කල් තබනු ලැබිය හැකි ය; නැතහොත් එය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් නම්, අවශ්‍යතාව අනුව විටින් විට, එහි ප්‍රගතිය වාර්තා කරනු ලැබිය හැකි ය.

**60.** කාරක සභාවේ සභාපතිවරයා හෝ මහ ලේකම්වරයා හෝ විසින් එක් එක් වගන්තියේ අංකය අනුපිළිවෙළින් කියවනු ලැබිය යුත්තේ ය.

**61**. වගන්තියකට හෝ වගන්තිවලට කරනු ලබන යම් සංශෝධනයක්, එම සංශෝධනය, පනත් කෙටුම්පතේ විෂයය කාරණයට අදාළ වන්නේ නම් සහ අන්‍යාකාරයෙන් ස්ථාවර නියෝග සමඟ අනුකූල වේ නම් යම් විධිවිධාන ඉවත් කරනු ලැබීම, ආදේශ කරනු ලැබීම, ඇතුළත් කරනු ලැබීම හෝ එකතු කරනු ලැබීම මගින් වගන්තියකට හෝ වගන්තිවලට යම් සංශෝධනයක් කරනු ලැබිය හැකි ය.

**62**. කාරක සභාවක දී, පනත් කෙටුම්පතක මූලධර්ම සාකච්ඡා කරනු නොලැබිය යුතු අතර, එහි විස්තර පමණක් සාකච්ඡා කරනු ලැබිය යුත්තේ ය.

**63**. පනත් කෙටුම්පතේ පූර්වයෙන් වූ යම් කොටසක් පිළිබඳව ගන්නා ලද යම් තීරණයකට අනනුකූල සංශෝධනයක් යෝජනා කරනු ලැබිය නොහැකි ය.

**64**. පනත් කෙටුම්පතක් කාරක සභාවක දී සලකා බලා අවසන් වීමෙන් අනතුරුව, පනත් කෙටුම්පත කාරක සභාවේ ම තිබිය දී යම් මන්ත්‍රීවරයකු විසින් සභාපතිවරයාගේ අවසරය ඇතිව, එවකටත් සම්මත වූ වගන්තියකට සංශෝධනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**65**. පනත් කෙටුම්පතේ පවතින වගන්ති සලකා බලන තෙක් සහ අලුත් වගන්ති ඉදිරිපත් කිරීමට පෙර යම් කිසි වගන්තියක් සලකා බැලීම කල් දමනු ලැබිය හැකි ය.

**66.** (1) පනත් කෙටුම්පතේ උපලේඛන සලකා බැලීමට පෙර අලුත් වගන්ති ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒවා පළමුවැනි වර කියවන ලද සේ සලකනු ලැබිය යුත්තේ ය. ඉන් අනතුරුව, "වගන්තිය දෙවැනි වර කියවනු ලැබිය යුත්තේ ය" සහ "වගන්තිය (හෝ වගන්ති සංශෝධිත ආකාරයෙන්) පනත් කෙටුම්පතට එකතු කරනු ලැබිය යුත්තේ ය" යන ප්‍රශ්නවලට එළඹිය යුත්තේ ය.

(2) පනත් කෙටුම්පතේ උපලේඛන පිළිබඳව කටයුතු කර අවසන් වීමෙන් අනතුරුව අලුත් උපලේඛන ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අලුත් වගන්ති සම්බන්ධයෙන් අනුගමනය කරන ලද පිළිවෙළ ම එම අලුත් උපලේඛන සම්බන්ධයෙන් ද අනුගමනය කරනු ලැබිය යුත්තේ ය.

(3) සෑම වගන්තියක් සහ උපලේඛනයක් ද, යෝජිත අලුත් වගන්තියක් හෝ උපලේඛනයක් ද සම්බන්ධයෙන් කටයුතු කර අවසන් වූ අවස්ථාවක දී,

පූර්විකාවක් තිබේ නම් එය සලකා බලා, "මෙය පනත් කෙටුම්පතේ පූර්විකාව විය යුත්තේ ය" යන ප්‍රශ්නය විමසනු ලැබිය යුත්තේ ය.

(4) පනත් කෙටුම්පතේ නාමයට යම් සංශෝධනයක් අවශ්‍ය වේ නම්, එය, මෙම ස්ථාවර නියෝගයේ දක්වා ඇති වැඩකටයුතු අවසානයේ දී කරනු ලැබිය යුත්තේ ය.

## පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභාවල වාර්තා

**67**. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් පනත් කෙටුම්පතක් සලකා බැලීම අවසන් කරනු ලැබූ අවස්ථාවක දී, සභාපතිවරයා විසින් සංශෝධන සහිතව හෝ රහිතව පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

***68.** [පනත් කෙටුම්පතක් යොමු කරනු ලැබ ඇති ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාව හෝ විසින් සිය නිර්දේශ සඳහන් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවේ පිටපතක් සෑම මන්ත්‍රීවරයකුට ම බෙදා දෙනු ලැබිය යුත්තේ ය.]

**69**. පනත් කෙටුම්පතක් පිළිබඳ විශේෂ කාරක සභාවක වාර්තාව සභාපතිවරයා විසින් පිළිගන්වනු ලැබිය යුතු අතර, එය සභා මේසය මත තැබිය යුතු යැයි නියෝග කරනු ලැබිය හැකි ය. නැතහොත් පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි අන්‍යාකාරයට ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය හැකි ය. යම් මන්ත්‍රීවරයකු විසින් කරනු ලබන යෝජනාවක් අනුව පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබිය හැකි ය. නැතහොත් විශේෂ කාරක සභාවේ වාර්තාව සලකා බැලීම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා විසින් යෝජනා කරනු ලබන දිනයකට කල් දැමිය හැකි ය.

****70**. [පනත් කෙටුම්පතක් පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවේ වාර්තාව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුව නියම කරනු ලබන දිනක දී සලකා බැලීම සඳහා කටයුතු කරනු ලැබිය යුත්තේ ය. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවක හෝ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් සලකා බැලිය යුත්තේ කාරක සභාව විසින් කරන ලද සංශෝධන ඇතොත් එපමණ ය. එහෙත් එම සංශෝධන තවදුරටත් සංශෝධනය කරනු ලැබිය හැකි ය. එම වාර්තාව සලකා බලනු ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් පිළිගන්නා ලද කාරක සභා සංශෝධනවලට ආනුෂංගික වන්නාවූ සංශෝධන හැර කිසිදු අලුත් සංශෝධනයක් පාර්ලිමේන්තුව විසින්

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

** 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

කරනු නොලැබිය යුත්තේ ය. එහෙත් එම කාරක සභාව විසින් කරන ලද සංශෝධන සම්බන්ධයෙන් පනත් කෙටුම්පත නැවතත් එම කාරක සභාවටම යොමු කරනු ලැබිය හැකි ය.]

## තුන්වැනි වර කියවීම

**71**. පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ පූර්ණ කාරක සභා අවස්ථාව පසු කිරීමෙන් හෝ විශේෂ කාරක සභාවක් විසින්, සංශෝධන රහිතව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමෙන් පසු කරනු ලබන යෝජනාවක් මත වහා ම තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය යුත්තේ ය; නැතහොත් පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම් තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

*__72.__ [(1) පනත් කෙටුම්පතක් සංශෝධන රහිතව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබ ඇති විට, එය සලකා බැලීමට නියම කරන ලද දිනයේ දී වහා ම තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය: නැතහොත්, පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

(2) පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් හෝ විසින් සංශෝධනය කර තිබේ නම්, කාරක සභාව මඟින් කරන ලද සංශෝධන පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම අවසන් කළ වහාම පනත් කෙටුම්පත තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය: නැතහොත්, පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.]

**73**. පනත් කෙටුම්පතක් තුන්වැනි වර කියවීමේ දී, දැනුම් දීමෙන් අනතුරුව යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව, වචන වලට හෝ කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාවලට පමණක් සීමා වූ සංශෝධන කරනු ලැබිය හැකි ය. පනත් කෙටුම්පතෙහි කථානායකතුමාගේ සහතිකය සටහන් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක දී පනත් කෙටුම්පතේ කිසියම් ව්‍යාකරණ දෝෂයක් හෝ මුද්‍රණ දෝෂයක් හෝ නිවැරදි කිරීමට කථානායකතුමාට බලය තිබිය යුත්තේ ය.

## කථානායකවරයාගේ සහතිකය

**74**. පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමෙන් අනතුරුව, හැකිතාක් ඉක්මනින් කථානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති පරිදි, සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පනත් කෙටුම්පතේ සහතිකය සටහන් කරනු ලැබිය යුත්තේ ය.

## විසර්ජන පනත් කෙටුම්පත සඳහා වෙන්කරන ලද දිනයන්

**75.** (1) දෙසැම්බර් 31 දිනට පූර්වයෙන් වූ (මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි මිස) දින විසි හයකට වැඩි නොවන දින ගණනක් විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ඉහත කී දින විසිහය ගණනය කිරීමේ දී යම් පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් සලකා බැලීම සඳහා යොදා ගනු ලබන දින ගණන ඊට ඇතුළත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) සිකුරාදා හැර එසේ වෙන්කරන ලද අනෙක් දිනයක රැස්වීම් වේලාවන් පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා ද, විය යුත්තේ ය. සිකුරාදා රැස්වීම් වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද, විය යුත්තේ ය:

එසේ වුව ද, අ. භා. 6.00 ට 8 ස්ථාවර නියෝගයේ (4), (5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුත්තේ ය.

(3) එසේ වෙන් කරන ලද දිනයක ප්‍රධාන කටයුතුවල පළමුවැනි විෂයය වශයෙන් විසර්ජන පනත් කෙටුම්පත ඇතුළත් කරනු ලැබිය යුතු අතර, එවැනි දිනයක අ. භා. 6.00 ට පෙර වෙනත් යම් ප්‍රධාන කටයුත්තක් සලකා බැලීම පිණිස ගනු නොලැබිය යුත්තේ ය.

(4) පනත් කෙටුම්පතේ දෙවැනි වර කියවීම සඳහා දින හතකට වැඩි කාලයක් වෙන්කරනු නොලැබිය යුතු අතර, එසේ වෙන්කරනු ලැබ ඇති අවසන් දිනයේ අ. භා. 6.00 ට කථානායකවරයා විසින්, දෙවැනි වර කියවීමේ වැඩකටයුතු කලින් අවසන් කර ඇත්නම් මිස, දෙවැනි වර කියවීම අවසන් කිරීම සඳහා අවශ්‍ය වන යම් ප්‍රශ්නයක් විමසා පනත් කෙටුම්පත කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය. ඒ සියලු ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කර අවසන් වන තෙක් පාර්ලිමේන්තුව කල් තැබීම කරනු නොලැබිය යුත්තේ ය.

(5) ඉහත (1) ඡේදයේ විධිවිධාන සලසා ඇති ආකාරයට හැර විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව සඳහා දින විසි දෙකකට නොවැඩි දින ගණනක් වෙන් කරනු ලැබිය යුතු අතර, එම දිනවලින් අවසන් දිනයෙහි අ. භා. 6.00 ට පනත් කෙටුම්පත ඊට කලින් වාර්තා නොකරන ලද්දේ නම් මිස එවිට සාකච්ඡා වෙමින් පවතින කවර සංශෝධනයන් හෝ පිළිබඳ ප්‍රශ්නය ද ඉන් අනතුරුව, එම ශීර්ෂයට ඇති ආණ්ඩුවේ සංශෝධන ද එම ශීර්ෂය සම්බන්ධයෙන් කටයුතු කර අවසන් වීමට අවශ්‍ය ප්‍රශ්නය ද වහා ම විමසනු ලැබිය යුත්තේ ය. ඉක්බිතිව, එක් එක් අමාත්‍යාංශයෙහි ශීර්ෂ පිළිබඳව ඒ ඒ අමාත්‍යාංශයේ ඇස්තමේන්තු වලින් එතෙක් ඉතිරි වී ඇති ශීර්ෂ යටතේ වෙන් කර ඇති සම්පූර්ණ ගණන ඒ ඇස්තමේන්තුවල විස්තර කර ඇති සේවා උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය යන ප්‍රශ්නය ද, ඉක්බිතිව ඒ ඒ උපලේඛන වෙන් වෙන්ව

පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තබනු ලැබිය යුත්තේ ය යන ප්‍රශ්නය ද, පිළිවෙළින් සභාපතිවරයා විසින් වහා විමසනු ලැබිය යුත්තේ ය. තව ද, පනත් කෙටුම්පත වාර්තා කරනු ලබන තෙක් පාර්ලිමේන්තුව කල් තබනු නොලැබිය යුත්තේ ය.

(6) මෙම ස්ථාවර නියෝගය යටතේ වැඩකටයුතු නිමාවට පත්කරනු ලැබිය යුතු යම් දිනයක දී කල් තැබීමේ යෝජනාවක් මගින් ඒ වැඩකටයුතු සලකා බැලීම අපේක්ෂණය කිරීම හෝ අත්හිටවීම හෝ කරනු නොලැබිය යුතු අතර, එවැනි වැඩකටයුතු සම්බන්ධයෙන් පමා කිරීමේ යෝජනාවක් ද ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය:

එසේ වුව ද, 19 ස්ථාවර නියෝගය යටතේ කල් තැබීමේ යෝජනාවකට අවසර දෙන ලද්දේ නම්, එම යෝජනාව විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධ වැඩ කටයුතු අවසන් වන තුරු පසුවට තැබිය යුතු අතර, අ. භා. 8.00 ට පාර්ලිමේන්තුව කලින් කල් තබා නොමැති නම්, කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

## විනය රීති පිළිබඳ වගකීම

**76.** (1) විනය රීති පිළිපැදීම පිළිබඳ වගකීම පිළිවෙළින් පාර්ලිමේන්තුව තුළ දී නම් කථානායකවරයා විසින් ද, යම් කාරක සභාවක් තුළ දී නම් එහි සභාපතිවරයා විසින් ද දරනු ලැබිය යුතු අතර, රීති ප්‍රශ්නයක් පිළිබඳව කථානායකවරයා හෝ කාරක සභා සභාපතිවරයා හෝ විසින් දෙනු ලබන තීරණයකට විරුද්ධව අභියාචනයකට අවකාශ නොතිබිය යුත්තේ ය. තව ද, දැනුම් දීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන පූර්ණ යෝජනාවක් මත හැර එම තීරණය පාර්ලිමේන්තුව විසින් සමාලෝචනය කරනු නොලැබිය යුත්තේ ය.

(2) විවාදයක් පවතින අතරතුර කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ යමක් පවසන කවර හෝ අවස්ථාවක දී, කථා කරමින් සිටින හෝ කථා කිරීමට අවස්ථාව ලබා දී ඇති හෝ යම් මන්ත්‍රීවරයකු විසින් අසුන් ගනු ලැබිය යුතු අතර, කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ විසින් පවසන දෙය යම් බාධාවක් නොමැතිව ඇසෙන සේ පාර්ලිමේන්තුව හෝ කාරක සභාව නිශ්ශබ්ද විය යුත්තේ ය.

(3) රීති ප්‍රශ්නයක් නඟා ඇති අවස්ථාවක දී, එම ප්‍රශ්නය නගන මන්ත්‍රීවරයා විසින් සිය අසුනේ නැවත අසුන් ගනු ලැබිය යුතු අතර, කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ ප්‍රශ්නය විසඳනු ලබන තෙක්, කථානායකවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ අවසරය ඇතිව මිස වෙනත් යම් මන්ත්‍රීවරයකු විසින් නැගී සිටිනු නොලැබිය යුත්තේ ය. ප්‍රශ්නය නගන ලද වේලාවේ පාර්ලිමේන්තුව අමතමින් සිටි මන්ත්‍රීවරයාට මූලාසනයේ තීරණයට අනුකූලතාව දක්වමින්, ස්වකීය කථාව නැවතත් කරගෙන යාමට හිමිකම තිබිය යුත්තේ ය.

## පාර්ලිමේන්තුව තුළ විනය

**77.** (1) යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතාම හෝ අනායාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මගින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිතා කිරීමේ වරද කරනු ලැබූ විගසම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී "එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටුවනු ලැබිය යුත්තේ ය" යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබා නොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි යම් යෝජනාවක් සම්මත වී මෙම ස්ථාවර නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්නම්, එසේ එම මන්ත්‍රීවරයාගේ සේවය අත්හිටවීම පළමු අවස්ථාවේ දී සති දෙකකට ද, එම සභාවාරයේ ම දෙවැනි අවස්ථාවේ දී සති තුනකට ද, එම සභා වාරයේ ම තෙවැනි හෝ ඊට පසුව එළඹෙන කවර හෝ අවස්ථාවක දී සති හතරකට ද වශයෙන් විය යුත්තේ ය:

එසේ වුව ද, පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්තේ කවර මන්ත්‍රීවරයකුගේ ද, එම මන්ත්‍රීවරයාට එම අත්හිටවනු ලැබීම බලපැවැත්වෙන කාලසීමාව තුළ දී විසර්ජන පනත් කෙටුම්පතේ අවසන් ඡන්ද විමසීමේ දී පමණක් ඡන්දය භාවිතා කරනු ලැබීමට කථානායකවරයා විසින් අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) සහ (2) ඡේදවල විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණ ද, සෙංකෝලය පාර්ලිමේන්තුවේ සභාගර්භය ඇතුළත තබා ඇති අවස්ථාවක දී, එය ස්පර්ශ කිරීම හෝ එසවීම හෝ මගින් බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලබන යම් මන්ත්‍රීවරයකු විසින් එම වරද සිදු කරනු ලබනුයේ පළමුවරට යන කාරණය නොසලකා එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය සති හතරකට අත්හිටවනු ලැබිය යුත්තේ ය.

(4) පැමිණ සිටින මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකු එක්ව මූලාසනයේ අධිකාරිය නොතකා ඇත්නම් මිස, එකම අවස්ථාවේ දී එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩි දෙනෙකු නම් කිරීම කරනු නොලැබිය යුත්තේ ය.

(5) මෙම ස්ථාවර නියෝගය යටතේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇති යම් මන්ත්‍රීවරයකු හෝ එක්ව ක්‍රියා කළ මන්ත්‍රීවරයන් හෝ එසේ සේවය අත්හිටවනු ලැබ ඇති කාල සීමාව තුළ පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් ඉවත් වීම සඳහා කථානායකවරයා විසින් කරනු ලබන විධානය පිළිපැදීම ප්‍රතික්ෂේප කරනු ලබයි නම්, කථානායකවරයා විසින් සිය විධානය බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියෝග කරනු ලැබිය හැකි ය.

(6) මෙම ස්ථාවර නියෝගයේ (1) ඡේදය යටතේ වරදක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් තුළ දී කරනු ලැබුවහොත්, සභාපතිවරයා විසින්

කාරක සභාවේ වැඩකටයුතු වහා ම අත්හිටවනු ලැබ සිද්ධියට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත, එම වරද පාර්ලිමේන්තුව තුළ දී කරන ලද්දාක් මෙන් සලකා, සංශෝධනයක්, කල් තැබීමක් හෝ විවාදයක් නොමැතිව කථානායකවරයා විසින් එම ප්‍රශ්නය විමසනු ලැබිය යුත්තේ ය.

**78**. විවාදයක දී, තමා විසින් ම කරන ලද හෝ වෙනත් මන්ත්‍රීවරයන් විසින් හෝ කරන ලද තර්ක නිරන්තරයෙන් අදාළ නොවන හෝ වෙහෙසකර ලෙස නැවත නැවතත් ප්‍රකාශ කිරීමෙහි යෙදෙන මන්ත්‍රීවරයකුගේ හැසිරීම කෙරෙහි පාර්ලිමේන්තුවේ සැලකිල්ල යොමු කරවනු ලැබ, එම මන්ත්‍රීවරයාගේ කථාව අඛණ්ඩව කර ගෙන යැම නවත්වන ලෙස සහ සජීවී විකාශය නවත්වන ලෙස කථානායකවරයා විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

**79**. (1) බරපතල ලෙස විනය විරෝධීව හැසිරෙන මන්ත්‍රීවරයකුට එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් පාර්ලිමේන්තුවෙන් වහා ම ඉවත් වන ලෙස කථානායකවරයා විසින් නියෝග කරනු ලැබිය යුතු අතර, සිය නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියම කරනු ලැබිය හැකි ය. චෙත්‍රධාරීවරයා විසින් එම නියෝගය ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ යුත්තේ ය.

(2) මෙම ස්ථාවර නියෝගය යටතේ සිය බලතල ප්‍රමාණවත් නොවේ යැයි කවර හෝ අවස්ථාවක දී කථානායකවරයා අදහස් කරන්නේ නම්, 77 ස්ථාවර නියෝගය ප්‍රකාරව එවැනි මන්ත්‍රීවරයන් නම් කරනු ලැබිය හැකි ය.

**80**. 77 ස්ථාවර නියෝගය ප්‍රකාරව සේවය අත්හිටවන ලද හෝ 79 ස්ථාවර නියෝගය ප්‍රකාරව පාර්ලිමේන්තුවෙන් ඉවත් වන්නට විධාන කරනු ලැබූ යම් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තු භූමි භාගයෙන් වහාම ඉවත් වනු ලැබිය යුතු අතර, එසේ අත්හිටුවන ලද කාල සීමාව තුළ දී, කාරක සභාවලට සහභාගී වීමට ද එම මන්ත්‍රීවරයන්ට තහනම් විය යුත්තේ ය.

මෙම පරිච්ඡේදයේ කාර්යය සඳහා "පාර්ලිමේන්තු භූමි භාගය" යනුවෙන් පාර්ලිමේන්තු ගොඩනැගිලි සහ පාර්ලිමේන්තුවේ ගේට්ටු අංක 1 සිට ගේට්ටු අංක 3 දක්වා පරිශ්‍රය ද ඇතුළත් වන්නේ ය.

**81.** පාර්ලිමේන්තුව තුළ පැන නගින බරපතල විනය විරෝධී තත්ත්වයක දී කථානායකවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, ප්‍රශ්නය නොවිමසා සභාව කල් තබනු ලැබීමට හෝ කථානායකවරයා විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට රැස්වීම අත්හිටුවනු ලැබීමට හැකි ය.

**82**. (1) විවාදයක දී අයුතු හෝ නොසැබි වූ නොනිසි වචන පාවිච්චි කරන හෝ 83 ස්ථාවර නියෝගය හෝ 91 ස්ථාවර නියෝගයේ (ඊ) හෝ (ඌ) ඡේදවල විධිවිධානවලට පටහැනිව කිසිවක් ප්‍රකාශ කරන සහ එසේ ප්‍රකාශ කළ දෙය පිළිබඳ පැහැදිලි කිරීමක් හෝ එම වචන ඉවත් කර ගැනීමක් සිදු නොකරන හෝ එවැනි අනුචිත වචන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සෑහීමකට

පත් වන ලෙස තම කනගාටුව ප්‍රකාශ කර නොමැති යම් මන්ත්‍රීවරයකු හෝ මෙම ස්ථාවර නියෝගවල නිශ්චිතව දක්වා නොමැති යම් රීතියක් කඩ කරන ලද යම් මන්ත්‍රීවරයකුට එරෙහිව පාර්ලිමේන්තුව විසින් සුදුසු යැයි සලකනු ලබන කවර හෝ ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි අතර මෙම ස්ථාවර නියෝග කිසිවකට, මෙම නියෝගවල නිශ්චය වශයෙන් දක්වා ඇති ආකාරයට හැර වෙනත් ආකාරයකට මෙම නියෝගවල නිශ්චිත වශයෙන් දක්වා ඇති රීති කඩ කිරීමක් සම්බන්ධයෙන් කවර හෝ මන්ත්‍රීවරයකුට එරෙහිව කටයුතු කිරීමෙන් පාර්ලිමේන්තුව වළකාලීමට නොහැක්කේ ය.

(2)(අ) යම් මන්ත්‍රීවරයකු විසින් දිගින් දිගටම අයෝග්‍ය ලෙස හැසිරෙන බව හෝ ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලබන බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව සජීවී විකාශය වහාම අත්හිටුවනු ලබන ලෙස නියෝග කිරීමට කථානායකවරයාට හැකි ය;

(ආ) අනුචිත හෝ නුසුදුසු අයෝග්‍ය වචන විවාදයකදී භාවිතා කරනු ලැබ ඇති බව හෝ 83 ස්ථාවර නියෝගය හෝ 91 ස්ථාවර නියෝගයේ (ඊ) හෝ (ඌ) ඡේද උල්ලංඝනය කරනු ලබන යම් දෙයක් විවාදයක දී ප්‍රකාශ කරන ලද විට, එම වචන හෝ ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස හා එම වචන නොකියන ලද සේ හෝ එම ප්‍රකාශ නොකරන ලද සේ හෝ සලකනු ලැබිය යුතු බවට නියෝග කිරීම කථානායකවරයාට සිය අභිමතානුසාරී බලය පාවිච්චි කරමින් කරනු ලැබිය හැකි ය.

**83.** (1) ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුත්තේ ය. යම් වැඩකටයුතුවල දී, අමාත්‍යවරයකු වෙත යොමු කරනු ලබන ප්‍රශ්නයක් හෝ වෙනත් යම් විෂයයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත සිදු කරනු ලබන විවාදයක දී අදහස් ප්‍රකාශ කිරීම්වල දී එවැනි යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් සඳහන් කිරීම රීත්‍යානුකූල නොවන්නේ ය.

(2) මෙම ස්ථාවර නියෝගයේ "විනිශ්චයකාරවරයා" යනුවෙන් ජනරජයේ ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මඟින් පත් කරනු ලබන අග්‍රවිනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චයකාරවරයෙක් ද අදහස් වේ.

## පූර්ණ යෝජනාවක් මත ඇතැම් තැනැත්තන් ඉවත් කරනු ලැබීම

**84**. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, විෂම පැවැත්ම හෝ අබලතාව යන හේතු මත අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු, අභියාචනාධිකරණයේ සභාපතිවරයා, සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු එම ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා ජනාධිපතිවරයා අමතා යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම සඳහා දැනුම් දීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 ව්‍යවස්ථාව ප්‍රකාරව, කථානායකවරයාට භාර දී ඇති අවස්ථාවක දී, කථානායකවරයා විසින් එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

(2) (අ) ඉහත (1) ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබ තිබෙන අවස්ථාවක දී, කථානායකවරයා විසින් අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා විමසා, එම යෝජනා සම්මතයේ දක්වා ඇති විනිශ්චයකාරවරයාගේ විෂම පැවැත්ම හෝ අබලතාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විමර්ශන මණ්ඩලයක් පත් කරනු ලැබිය යුත්තේ ය.

(ආ) කථානායකවරයා විසින්, එම විමර්ශන මණ්ඩලයේ එක් සාමාජිකයකු එහි සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුත්තේ ය.

(3) එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින් මාස දෙකක කාල සීමාවක් ඇතුළත දී, විමර්ශනය අවසන් කරනු ලැබිය යුතු අතර ඒ සඳහා අදාළ කාර්ය පටිපාටිය නීති ප්‍රතිපාදනවල සඳහන් වනු ඇත. කෙසේ වුවද, කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලයේ ඉල්ලීම මත, එම කාල සීමාව, එක වරකට මාසයක් නොඉක්මවන්නා වූ වැඩිදුර කාල සීමාවකට දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(4) විමර්ශනයේ වැඩකටයුතු අවසන් කරනු ලැබීමෙන් අනතුරුව, එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින්, එකී මණ්ඩලය ඉදිරියේ සටහන් කර ගන්නා ලද සාක්ෂි සම්බන්ධ කාර්ය සටහන් ද සමඟ එහි තීරණය කථානායකවරයාට වාර්තා කරනු ලැබිය යුතු අතර, එම විමර්ශන මණ්ඩලය විසින්, අදාළ චෝදනා ලත් විනිශ්චයකාරවරයා විෂම පැවැත්මට හෝ අබලතාවට වරදකරු බව තීරණය කරනු ලැබ තිබේ නම් පමණක් කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලය විසින් වාර්තා කරන ලද කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. අදාළ විනිශ්චයකාරවරයා වරදකරු නොවන බව විමර්ශන මණ්ඩලය විසින් සොයා ගනු ලැබ ඇත්නම්, කථානායකවරයා විසින් ඒ

බව පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුතු අතර, එම යෝජනා සම්මතය සම්බන්ධ සියලු වැඩකටයුතු අවසන් කරනු ලැබිය යුත්තේ ය.

(5) විමර්ශන මණ්ඩලය විසින් අදාළ විනිශ්චයකාරවරයාට එරෙහිව ඇති විෂම පැවැත්මට හෝ අබලතාවට වරදකරු බවට තීරණය කරනු ලැබ තිබේ නම්, කථානායකවරයා විසින් එය පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එම යෝජනාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන්ගේ බහුතරයකින් සම්මත වුවහොත්, කථානායකවරයා විසින්, එසේ ඔප්පු කරන ලද විෂම පැවැත්ම හෝ අබලතාව මත අදාළ විනිශ්චයකාරවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා එය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(6) පාර්ලිමේන්තුව වාරාවසාන කිරීම හෝ විසුරුවා හැරීම නොසලකා විමර්ශන මණ්ඩලය විසින් සිය වැඩකටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

**85.** (1) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා; හෝ

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන විගණකාධිපතිවරයා; හෝ

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්),

එම ධුරයෙන් ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා අමතා ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුළත් කරනු ලබන අවස්ථාවක දී, මෙම ස්ථාවර නියෝගයේ (2) ඡේදය යටතේ පත් කරනු ලබන විශේෂ කාරක සභාව පත් කරනු ලබන දිනයේ සිට එක් මාසයක කාල සීමාවක් ඉකුත් වන තෙක් එම යෝජනා සම්මතය, පිළිබඳව කටයුතු සිදු කරනු නොලැබිය යුත්තේ ය.

(2) ඉහත (1) ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුළත් කරනු ලැබ තිබෙන අවස්ථාවක දී, එම යෝජනා සම්මතයේ දක්වා තිබෙන කාරණා සම්බන්ධයෙන් විමර්ශනය කර පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීම සඳහා කථානායකවරයා විසින් සාමාජිකයන් හත් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුත්තේ ය.

(3) (අ) (2) ඡේදය යටතේ පත් කරනු ලබන විශේෂ කාරක සභාවක් විසින්, ධුරයෙන් ඉවත් කිරීම සඳහා සිය විමර්ශනයට විෂයය වී ඇති තැනැත්තා වෙත එම යෝජනා සම්මතයේ දක්වා ඇති කාරණාවල

පිටපතක් එම තැනැත්තාට යැවිය යුතු අතර, විශේෂ කාරක සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් කාල සීමාවක් ඇතුළත දී, සිය විත්තිවාචකය සම්බන්ධ ලිඛිත ප්‍රකාශයක් කිරීමට එම තැනැත්තාට නියම කරනු ලැබිය යුත්තේ ය.

(ආ) (2) ඡේදය යටතේ පත් කරන ලද විශේෂ කාරක සභාව විසින් විමර්ශනයට භාජනය වී ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා ලබා ඇති තැනැත්තාට එරෙහිව කර ඇති චෝදනා සාවද්‍ය බව ඔප්පු කිරීම සඳහා විශේෂ කාරක සභාව ඉදිරියේ පෙනී සිටීමට ද පෞද්ගලිකව හෝ නීතිඥයකු මගින් කරුණු කියා සිටීමට ද වාචික හෝ ලේඛනගත සාක්ෂි ගෙන හැර දැක්වීමට ද අයිතිවාසිකම තිබිය යුත්තේ ය.

(4) මෙම ස්ථාවර නියෝගයෙහි (2) ඡේදය යටතේ පත් කරනු ලබන විශේෂ කාරක සභාවට යම් තැනැත්තකු කැඳවීම සඳහා සහ ලියකියවිලි සහ වාර්තා ගෙන්වා ගැනීමට බලය තිබිය යුතු අතර, එහි ගණපූරණය සාමාජික සංඛ්‍යාවෙන් අඩකට නොඅඩු ගණනකින් සකස් විය යුත්තේ ය.

(5) මෙම ස්ථාවර නියෝගයෙහි (2) ඡේදය යටතේ පත් කරනු ලබන විශේෂ කාරක සභාව විසින් කරනු ලබන විමර්ශනය අවසානයේ දී, කාරක සභාව විසින්, එය ඉදිරියේ ගන්නා ලද සාක්ෂිවල සටහන් ද සමඟ එහි තීරණය පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීම සුදුසු යැයි කාරක සභාවට හැඟෙන කවර හෝ යම් කාරණා සම්බන්ධ විශේෂ වාර්තාවක් සකස් කරනු ලැබිය හැකි ය.

(6) මෙම ස්ථාවර නියෝගයෙහි (1) ඡේදයේ දක්වා ඇති ජනාධිපතිවරයා අමතා ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් සඳහා වූ යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ ඇති අවස්ථාවක දී, කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව වෙනුවෙන් එම ඇමතීම ජනාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

## විවාද රීති

**86**. කිසිම මන්ත්‍රීවරයකු විසින්—

(අ) සිය කථාවේ වරදවා තේරුම් ගෙන තිබෙන යම් වැදගත් කොටසක්, එම කොටසට වෙනත් අලුත් කාරණා ඇතුළත් නොකර එම කොටස පහදා දීමේ කාර්යය පිණිස; හෝ

(ආ) රීති ප්‍රශ්නයක් මත; හෝ

විනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කිසිම කාරණයක් සම්බන්ධයෙන් වරකට වඩා කථා කරනු නොලැබිය යුත්තේ ය.

**87**. යම් යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට එය සනාථ කරමින් කථා කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එම

යෝජනාව හෝ සංශෝධනය නිසි ලෙස ස්ථිර කරනු ලබන තෙක් ඒ පිළිබඳ වැඩිදුර විවාදයකට ඉඩ දෙනු නොලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කිසි ම ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවෙන් විමසනු නොලැබිය යුත්තේ ය.

**88**. කවර හෝ මන්ත්‍රීවරයකුට ස්වකීය ආසනයෙන් නැගී සිට මූලාසනයට හිස නැමීමෙන් විවාදයේ යම් පසු අවස්ථාවක දී තමාට කථා කිරීමට ඇති අයිතිවාසිකමට අගතියක් නොමැතිව, යෝජනාවක් හෝ සංශෝධනයක් ස්ථිර කරනු ලැබිය හැකි ය.

**89**. යම් ප්‍රශ්නයක් කථානායකවරයා විසින් සම්පූර්ණ වශයෙන් විමසනු ලැබීමෙන් අනතුරුව කිසි ම මන්ත්‍රීවරයකුට එම ප්‍රශ්නය පිළිබඳව කථා කරනු ලැබිය නොහැකි ය. ප්‍රශ්නයක් සම්බන්ධයෙන් "පක්ෂයි" සහ "විරුද්ධයි" යනුවෙන් හඬ නැගීමෙන් ඡන්දය ප්‍රකාශ කරනු ලැබීමෙන් අනතුරුව ප්‍රශ්නය සම්පූර්ණ වශයෙන් විමසනු ලැබුවා වන්නේ ය.

**90**. විවාද කළ යුතු ප්‍රශ්නයක් සභාභිමුඛ කර, විවාද කොට, අවසන් කරනු ලැබූ පසු, කථානායකවරයාගේ අවසරය නොමැතිව කවර හෝ මන්ත්‍රීවරයකුට එම සභා වාරයේදී ම එම ප්‍රශ්නය නැවත වරක් සභාභිමුඛ කළ නොහැකි ය: එමෙන්ම, පාර්ලිමේන්තුව විසින් යම් සභා වාරයක දී යම් කාරණයක් පිළිබඳව තීරණයක් ගෙන තිබේ නම්, ඒ කරුණ එම සභා වාරයේදී ම කථානායකවරයාගේ අවසරය නොමැතිව කිසිම විවාදයක දී නැවත වරක් මතු කරනු ලැබීමට හැකියාවක් නොමැත්තේ ය.

## පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේ දී මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති

**91**. සෑම මන්ත්‍රීවරයකු ම, පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබීමට නියමිත යම් ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් කථා කිරීමේ දී, මතු සඳහන් රීති දැඩි ලෙස පිළිපදිනු ලැබිය යුත්තේ ය:—

(අ) සෑම මන්ත්‍රීවරයකු විසින්ම කථානායකවරයා අමතමින් සිය අදහස් ප්‍රකාශ කිරීම කරනු ලැබිය යුතු අතර, කථානායකවරයාගේ අවසරය ඇතිව මිස සෑම මන්ත්‍රීවරයකු විසින් ම මන්ත්‍රීවරයාට වෙන්කරනු ලැබ තිබෙන ආසනයෙන් නැගී සිට කථා කරනු ලැබිය යුත්තේ ය;

(ආ) රීති ප්‍රශ්නයක් මත හෝ කථා කරනු ලබන මන්ත්‍රීවරයා විසින් මැදිහත්වීමට අවසරය දෙනු ලැබුවහොත් මිස, කිසිම මන්ත්‍රීවරයකුට බාධා කරනු නොලැබිය යුත්තේ ය;

(ඇ) මන්ත්‍රීවරයකු විසින් සිය අදහස් ප්‍රකාශ කරනු ලැබීම අවසන් කරනු ලැබූ විට, එම මන්ත්‍රීවරයා විසින් සිය ආසනයෙහි නැවත අසුන් ගනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුව ඇමතීමට රිසි වෙනත් යම් මන්ත්‍රීවරයකුට නැගී සිටිනු ලැබිය හැකි ය;

(ඇ) මන්ත්‍රීවරයන් දෙදෙනකු එකවර නැගී සිටියහොත්, කථානායකවරයා විසින් තමාගේ ඇසට පළමුවෙන් හසුවන මන්ත්‍රීවරයාට ආමන්ත්‍රණය කරනු ලැබිය යුත්තේ ය;

(ඉ) සෑම මන්ත්‍රීවරයකු විසින්ම සිය අදහස් ප්‍රකාශ කිරීම සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විෂයයට සීමා කරනු ලැබිය යුත්තේ ය;

(ඊ) කිසිම මන්ත්‍රීවරයකු විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කරනු නොලැබිය යුත්තේ ය. විනිශ්චයට භාජනය වී තිබෙන කාරණයට එරෙහි රීතිය කඩ කරමින් කථා කරන කවර හෝ මන්ත්‍රීවරයකුට සිය ආසනයෙහි අසුන් ගන්නා ලෙස නියෝග කරනු ලැබීමට කථානායකවරයාට හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාට හැකි ය;

එසේ වුව ද, එවැනි සඳහන් කිරීමක් නීති කෘත්‍යයක ප්‍රතිඵලය (අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින රීතිය) කෙරෙහි සැබෑ සහ සාරානුකූල හානියක් හෝ අගතියක් වීමේ අවදානමක් නොමැති බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, කථානායකවරයා විසින් එවැනි සඳහන් කිරීමකට ඉඩ දෙනු ලැබීමට හැකි ය;

(උ) කථා කරමින් සිටින හෝ සභාවේ පැමිණ සිටින යම් මන්ත්‍රීවරයකු විසින්, අපහාසාත්මක හෝ අනිසි වචන පාවිච්චි කරනු ලැබුවහොත්, කථානායකවරයා විසින් ඒ මන්ත්‍රීවරයාට රීත්‍යානුකූල වන ලෙස නියෝග කරනු ලැබිය යුතු අතර, එම සඳහන් කිරීම පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කරනු ලැබිය යුත්තේ ය;

(ඌ) කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය;

(එ) මන්ත්‍රීවරයකු විසින්, පාර්ලිමේන්තුව ඉදිරියේ ඇති විෂයය කරුණට අදාළ වන ලෙස කථා කරනු ලැබිය යුත්තේ ය;

(ඒ) පාර්ලිමේන්තුව ඉදිරියේ ප්‍රශ්නයක් සභාභිමුඛ කර නොතිබුණ ද, පාර්ලිමේන්තුවේ කැමැත්ත ඇතිව මන්ත්‍රීවරයකුට තමා සම්බන්ධව පෞද්ගලික ස්වභාවයේ කාරණා පැහැදිලි කරනු ලැබිය හැකි ය. එහෙත් එවැනි කාරණා විවාදයකට භාජනය කරනු ලැබිය නොහැකි ය.

එමෙන්ම එම කථාව එම මන්ත්‍රීවරයාගේ පැවැත්ම නිදොස් කිරීමට පමණක් සීමා කරනු ලැබිය යුත්තේ ය;

(ඔ) පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනා සම්මතයක් හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට විවාදය අවසානයේ දී පිළිතුරු දීම සඳහා අයිතිවාසිකමක් තිබිය යුත්තේ ය;

(ඕ) රීතිවලින් බැහැරවන කවර හෝ මන්ත්‍රීවරයකු වහාම සභාවේ රීතිවලට අනුකූල විය යුතු බවට කථානායකවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය;

(ක) ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ දී හැර, මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භයට ඇතුළුවන සහ ඉන් පිටව යන අවස්ථාවේ දී, මූලාසනයට ගෞරව කරනු ලැබිය යුත්තේ ය;

(ග) රැස්වීම අවසානයේ දී, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා සභාගර්භයෙන් පිටව යාමට සූදානම් අවස්ථාවේ දී, මන්ත්‍රීවරයන් විසින් සිය ආසනවලින් නැගී සිටිනු ලැබිය යුතු අතර, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා සභා ගර්භයෙන් පිටත්ව යන තෙක් මන්ත්‍රීවරයන් විසින් එලෙස නැගී සිටිනු ලැබිය යුත්තේ ය;

(ච) මෙම ස්ථාවර නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කථානායකවරයා විසින් මන්ත්‍රීවරයන් අතර සාධාරණ සහ යුක්තිසහගත ආකාරයකට කාලය වෙන් කිරීම සඳහා වගකියනු ලැබිය යුත්තේ ය. කථා කිරීම සඳහා කැඳවනු ලැබිය යුත්තේ කවරෙකුද යන්න තීරණය කරනු ලැබීමේ දී, ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සංවිධායකවරයන් විසින් එසේ කථා කිරීම සඳහා කථානායකවරයා විසින් කැඳවනු ලැබිය යුතු මන්ත්‍රීවරයන්ගේ ලැයිස්තුවක් ලබා දීම මගින් කථානායකවරයාට සහාය වනු ලැබිය හැකි ය.

## කථා නොකරන මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති

**92.** (1) පාර්ලිමේන්තුවේ විවාදයක් හෝ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් පැවැත්වෙන අතරතුර දී යම් මන්ත්‍රීවරයකු විසින්—

(අ) ශිෂ්ට සම්පන්නව සහ සත්පුරුෂයන් ලෙස පාර්ලිමේන්තුවට හෝ කාරක සභාවට හෝ පිවිසීම කරනු ලැබිය යුත්තේ ය;

(ආ) පාර්ලිමේන්තුවේ සභා ගර්භය හරහා ගමන් කරනු නොලැබිය යුත්තේ ය;

(ඇ) පාර්ලිමේන්තුව ඉදිරියේ ඇති කටයුතු හා සම්බන්ධ වන්නේ නම් මිස පුවත්පත් කියවනු නොලැබිය යුත්තේ ය;

(ඈ) දුම් පානය කරනු නොලැබිය යුත්තේ ය;

(ඉ) වෙනත් මන්ත්‍රීවරයකු කථා කරන විට නිශ්ශබ්දතාවය පවත්වා ගත යුතු අතර, කථා කරමින් සිටින මන්ත්‍රීවරයා විසින් ඉඩ දෙනු ලබන්නේ නම් මිස ඊට බාධා කරනු නොලැබිය යුත්තේ ය;

(ඊ) වාචික සන්නිවේදන උපකරණ භාවිතා කරමින් සංවාදයේ යෙදෙනු නොලැබිය යුත්තේ ය; සහ

(උ) පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ මධ්‍යයට පිවිසීම නොකළ යුත්තේ ය.

(2) රීති ප්‍රශ්න

(අ) ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳව මන්ත්‍රීවරයකු විසින් ප්‍රශ්න කරනු ලැබිය හැකි වන්නේ ය.

(ආ) රීති ප්‍රශ්නයක් මතු කිරීමේ දී, මන්ත්‍රීවරයකුට මිනිත්තු එකකට වඩා කතා කරනු ලැබිය නොහැකි අතර සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කථා කරනු ලැබිය නොහැකි වන්නේ ය. සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් අභිභවා රීති ප්‍රශ්නයක් මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුතු අතර සලකා බැලීමට භාජනය කරනු ලබමින් තිබෙන සාකච්ඡාව තාවකාලිකව අත්හිටුවනු ලැබිය යුත්තේ ය.

(ඇ) මෙම ස්ථාවර නියෝගවලට අනුකූලව යම් රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් තීරණයක් වහාම ගනු ලැබිය යුතු අතර කෙසේ වෙතත් විශේෂයෙන් තීරණයක් ගනු ලැබීම කල් දමනු ලැබිය හැකි වන්නේ ය. කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් මෙම ස්ථාවර නියෝගය යටතේ එළඹි තීරණය නිවේදනය කරනු ලැබිය යුතු අතර එම තීරණය සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීමට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය.

## පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව

**93.** (1) පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි යෝජනා සම්මතයකට එකඟ වීමෙන් අනතුරුව කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා මූලාසනයෙන් ඉවත් වනු ලැබිය යුත්තේ ය.

**94**. කථානායකවරයා විසින් හෝ කථානායකවරයා නොපැමිණ සිටින අවස්ථාවක දී, නියෝජ්‍ය කථානායකවරයා විසින් පූර්ණ පාර්ලිමේන්තු කාරක

සභාවක සභාපතිවරයා වශයෙන් මූලාසනය දරනු ලැබිය යුතු අතර, ඒ දෙදෙනාම නොපැමිණ සිටින අවස්ථාවක දී, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනය දරනු ලැබිය යුත්තේ ය. කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා යන තිදෙනාම නොපැමිණ සිටින අවස්ථාවක දී, සභාපති නාමාවලියේ කවර හෝ මන්ත්‍රීවරයකු විසින් මූලාසනය දරනු ලැබිය යුත්තේ ය.

**95**. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ ඡන්ද විමසීම් කිරීමේ දී 47 සිට 49 දක්වා ස්ථාවර නියෝගවල විධිවිධානවල "කථානායකවරයා" යන වචනය වෙනුවට "සභාපතිවරයා" යන වචනය ආදේශකොට එම විධිවිධානවලට අනුකූලව ඡන්දය විමසීම කරනු ලැබිය යුත්තේ ය.

**96**. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක සභාපතිවරයා විසින්, අනෙක් මන්ත්‍රීවරයන්ගේ ඡන්ද සමානව බෙදී ඇත්නම් මිස සිය ඡන්දය ප්‍රකාශ කරනු නොලැබිය යුතු අතර, එවැනි අවස්ථාවක දී සභාපතිවරයා විසින් තීරක ඡන්දය භාවිතා කරනු ලැබීමට හැකි ය.

**97**. මතු සඳහන් කාරණා වල දී හැර කථානායකවරයා මූලාසනයේ සිටින අවස්ථාවක දී, කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් අදාළ වන රීති පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය:—

(අ) යෝජනාවක් පිළිබඳව දැනුම් දීමක් අවශ්‍ය නොවන්නේ ය;

(ආ) යෝජනාවක් ස්ථිර කරනු ලැබීම අවශ්‍ය නොවන්නේ ය;

(ඇ) එකම ප්‍රශ්නය සම්බන්ධයෙන් මන්ත්‍රීවරයකුට එක් වරකට වඩා කථා කරනු ලැබිය හැකි ය.

**98**. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් එම කාරක සභාවට පාර්ලිමේන්තුව විසින් යොමු කරන ලද කාරණා සම්බන්ධයෙන් පමණක් කටයුතු සිදු කරනු ලැබිය යුත්තේ ය.

**99**. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක වැඩකටයුතු පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වල වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

## විශේෂ කාරක සභා

**100**. විශේෂ කාරක සභාවක් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

**101**. විශේෂ කාරක සභාවක්, පාර්ලිමේන්තුවේ අවසරය නොමැතිව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට වැඩි ගණනකින් සංයුක්ත නොවිය යුතු ය. එවැනි අවසරයක් ලබා ගැනීම සඳහා වන යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම් දීම අවශ්‍ය වන්නේ ය.

**102**. විශේෂ කාරක සභාවකින් කරනු ලබන පරීක්ෂණයක විෂයය සීමාව, එම කාරක සභාව පත් කරන ලද නියෝගයේ නියම මගින් නිශ්චය කරනු ලැබිය යුතු නමුත් එම විෂයය පථය පුළුල් කිරීම හෝ සීමා කිරීම පාර්ලිමේන්තුවේ උපදෙස් අනුව කරනු ලැබිය හැකි ය. එම කාරක සභාව විසින් එහි අවසන් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු කාල සීමාව පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය යැයි සලකනු ලබන යම් නිශ්චිත දිනයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි වීමට යටත්ව, එම කාරක සභාව විසින් සිය අවසන් වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු කාල සීමාව ඉහත කී නියෝගයේ නිශ්චිතව දක්වා තිබිය යුත්තේ ය.

**103**. සෑම විශේෂ කාරක සභාවකම සභාපතිවරයා සහ සභික මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය. සභාපතිවරයා නොපැමිණ සිටින අවස්ථාවක දී, පැමිණ සිටින සභික මන්ත්‍රීවරයන් විසින් තෝරා ගනු ලබන කාරක සභාවේ වෙනත් කවර හෝ මන්ත්‍රීවරයකු විසින් එම රැස්වීමේ මූලාසනය දරනු ලැබිය යුත්තේ ය.

**104**. සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් වේලාවක සහ ස්ථානයක කාරක සභාව විසින් සිය රැස්වීම් පවත්වනු ලැබිය යුත්තේ ය. පළමුවැනි රැස්වීමෙන් අනතුරුව පවත්වනු ලබන රැස්වීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වේලාවල සහ ස්ථානවල පවත්වනු ලැබිය යුත්තේ ය.

**105**. අන්‍යාකාරයෙන් නියෝග කරනු ලබන්නේ නම් මිස, විශේෂ කාරක සභාවක ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් හතර දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.

**106**. එවැනි යම් කාරක සභාවක පුරප්පාඩුවක් ඇති වන යම් අවස්ථාවක දී, කථානායකවරයා විසින්, කලින් කලට, එම සාමාජික මන්ත්‍රීවරයා වෙනුවට එම විශේෂ කාරක සභාවට වෙනත් මන්ත්‍රීවරයකු පත් කරනු ලැබිය හැකි ය. කාරක සභාවේ පූර්ව අවසරය නොලබා නොකඩවා රැස්වීම් තුනකට පැමිණ නොසිටින යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය. මෙම ස්ථාවර නියෝගය යටතේ කරනු ලබන සෑම පත් කිරීමක් ම පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීමේ දී පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුත්තේ ය.

**107**. විශේෂ කාරක සභාවක සභාපතිවරයාට එක් මූලික ඡන්දයක් තිබිය යුතු ය. ඡන්ද විමසීමක දී ප්‍රකාශ කරන ලද ඡන්ද සමානව බෙදී ඇත්නම්, සභාපතිවරයාට තීරක ඡන්දයක් භාවිතා කරනු ලැබිය හැකි ය.

**108**. පනත් කෙටුම්පතක් හෝ යම් කාරණයක් යොමු කරනු ලැබූ විශේෂ කාරක සභාවක් විසින් එම පනත් කෙටුම්පත හෝ යොමුගත කාරණය පිළිබඳ සාක්ෂ්‍ය විභාග කිරීම පිණිස පාර්ලිමේන්තුව විසින් එම කාරක සභාවට තැනැත්තන් කැඳවීමට සහ ලිපි ලේඛන සහ වාර්තා ගෙන්වා ගනු ලැබීමට යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබිය හැකි අතර, එවැනි බලතල පවරනු ලැබ ඇති යම් කාරක සභාවකට එම කාරක සභාව ඉදිරියේ ලබා ගන්නා ලද සාක්ෂිවල කාර්ය සටහන් ද සමඟ කාරක සභාවේ මතයන් සහ නිරීක්ෂණ

පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට ද පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීම සුදුසු යැයි සලකනු ලැබිය හැකි යම් කාරණයක් සම්බන්ධ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීමට ද අවසර තිබිය යුත්තේ ය.

**109**. පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද, විශේෂ කාරක සභාවක් විසින් සිය විමර්ශන නොකඩවා කරගෙන යනු ලැබිය හැකි අතර, එහි වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ යෝජනාවකින් මිස එය විසුරුවා හරිනු නොලැබිය යුත්තේ ය.

**110**. යම් විශේෂ කාරක සභාවක රැස්වීම සඳහා එක් එක් දිනයේ පැමිණෙන සාමාජික මන්ත්‍රීවරයන්ගේ නම්, විභාග කරන ලද සාක්ෂිකරුවන්ගේ නම් සහ යම් බෙදීමක් ඇති වූ අවස්ථාවක දී, ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශ්නය, එය ඉදිරිපත් කරනු ලැබූ තැනැත්තාගේ නම සහ පැමිණ සිටින සාමාජික මන්ත්‍රීවරයන් එම ප්‍රශ්නය සඳහා ඡන්දය ලබාදුන් අනුපිළිවෙළ ද කාරක සභාවේ වැඩකටයුතු පිළිබඳ කාර්ය සටහන්වල ඇතුළත් කරනු ලැබිය යුතු අතර, සාක්ෂි පිළිබඳ කාර්ය සටහන් සමඟ වැඩකටයුතු පිළිබඳ කාර්ය සටහන් ද පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු අතර කාරක සභාවේ වාර්තාව සමඟ ඒවා මුද්‍රණය කරනු ලැබිය යුත්තේ ය.

## ආංශික අධීක්ෂණ කාරක සභා

*__111__. [(1) තේරීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන විෂයයන් සහ කාර්යයන් පැවරෙන ආංශික අධීක්ෂණ කාරක සභා විස්සකට නොවැඩි සංඛ්‍යාවක් තිබිය යුත්තේ ය.

(2) ආංශික අධීක්ෂණ කාරක සභා පාර්ලිමේන්තුවේ කාලය තුළ දී ක්‍රියාත්මක විය යුතු අතර, පාර්ලිමේන්තුවේ යම් කල් තැබීමක් හෝ වාරාවසාන කිරීමක් නොසලකා එහි විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය.

(3) ආංශික අධීක්ෂණ කාරක සභාවලට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ දක්වා ඇති පනත් කෙටුම්පත් හැර කාරක සභාවට යොමු කරනු ලබන වෙනත් යම් පනත් කෙටුම්පතක්, ගිවිසුමක්, කාරක සභාවේ විෂය පථයට යටත් වන ආයතනවල වාර්ෂික වාර්තා සහ කාර්යසාධන වාර්තා ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමුකරන ලද වාර්තාවක් හෝ කාරණාවක් හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයෙකු හෝ විසින් එහි අධිකාර බල සීමාව තුළ ඇති විෂයයන් සහ කාර්යයන්ට අදාළ වෙනත් යම් කාරණයක් විභාග කිරීමට බලය තිබිය යුත්තේ ය.

(4) ඕනෑම අවස්ථාවක දී, ආංශික අධීක්ෂණ කාරක සභාවලට සිය වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි යැයි එම කාරක සභා විසින් සලකනු ලබන එවැනි විමසීම් සහ විමර්ශන සිදු කරනු ලැබිය හැකි ය.

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(5) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව සෑම මාසයකම දින දෙකකට නොඅඩු දින ගණනක් රැස්විය යුත්තේ ය.

(6) ආංශික අධීක්ෂණ කාරක සභාවලට පාර්ලිමේන්තුවේ මතු සඳහන් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුවට සහාය වීම පිණිස පොදු අධීක්ෂණ වගකීම් තිබිය යුත්තේ ය:—

(අ) රජයේ පවතින ප්‍රතිපත්ති අදාළ කර ගැනීම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවායෙහි සඵලත්වය පිළිබඳ විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම;

(ආ) විකල්ප ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස අනාගත පර්යේෂණ සහ පුරෝකථන සඳහා වන ක්‍රියාකාරකම්;

(ඇ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති සහ යම් නව හෝ අතිරේක නීතියක් පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව පෙන්නුම් කරනු ලැබිය හැකි තත්ත්වයන් සහ වාතාවරණයන් අදාළ කර ගැනීම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවායෙහි සඵලත්වය පිළිබඳ විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම; සහ

(ඈ) යම් නීතියක් සහ අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි එවැනි යම් අතිරේක නීතියක් සම්පාදනය කිරීම, සලකා බැලීම, පැනවීම හෝ සංශෝධන සිදු කිරීම.

(7) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවට තම අධිකාර බලසීමාව තුළ ඇති ඕනෑම ආයතනයකට කිසියම් තනතුරකට පත් කර ඇති හෝ ඕනෑම තනතුරක නිලතල දැරීමට නම් කර ඇති ඕනෑම තැනැත්තෙකුගේ යෝග්‍යතාවය පරීක්ෂා කර බලා එම පුද්ගලයන් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

(8) මතු සඳහන් තැනැත්තන් හැර, පාර්ලිමේන්තුවේ සෑම මන්ත්‍රීවරයකුම යම් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයන් ලෙස සේවය කිරීමට සුදුසුකම් ලැබිය යුත්තේ ය:—

(අ) කථානායකවරයා;

(ආ) නියෝජ්‍ය කථානායකවරයා;

(ඇ) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

(ඈ) අග්‍රාමාත්‍යවරයා;

(ඉ) පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

(ඊ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා; සහ

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්.

(9) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් කටයුතු කරනුයේ කවර අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරයකුගේ විෂය පථය යටතට ගැනෙන යම් විෂයයක්, කාර්යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක ද, ඒ හා සමාන අධිකාර බලයක් සහ අදාළ කාර්යය සහිත ආංශික අධීක්ෂණ කාරක සභාවක සේවය කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුත්තේ ය:

එසේ වුවද, පනත් කෙටුම්පතක් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාකච්ඡාවට භාජනය කරනු ලබන අවස්ථාවක දී, විෂය භාර අමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ එම කාරක සභාවට සහාය වීම පිණිස කැඳවනු ලැබිය හැකි ය.

(10) තේරීම් කාරක සභාව විසින්, ආංශික අධීක්ෂණ කාරක සභාවට සභික මන්ත්‍රීවරයන් නම් කිරීමේ දී පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විසින් කරනු ලබන නාමයෝජනාවලට අනුකූලව එම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට නිසි සැලකිල්ල දක්වමින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(11) අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයකු නොවන යම්කිසි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් එවැනි කාරක සභාවක කටයුතු නිරීක්ෂණය කරනු ලැබීමට එම කාරක සභාවේ සභාපතිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(12) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව, සිය පළමුවැනි රැස්වීමේ දී සහ ඉන් අනතුරුව එහි සභාපති ධුරය පුරප්පාඩු වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමුවැනි රැස්වීමේ දී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභික මන්ත්‍රීවරයන් අතුරින් සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(13) යම් ආංශික අධීක්ෂණ කාරක සභාවකින් පූර්ව අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

(14) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, එම කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් කාරණා විභාග කොට එම කාරක සභාවට වාර්තා කරනු ලැබීම සඳහා, එම කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(15) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් විධානය කරනු ලබන්නේ නම් මිස, යම් කාරණයක් ආංශික අධීක්ෂණ කාරක සභාවකට යොමු කිරීමේ දින සිට සති හයක් ඉකුත් වන තෙක්, පාර්ලිමේන්තුව විසින් එම කාරණය සලකා බලනු නොලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මඟින් ඉහත කී කාල සීමාව නිර්ණය කරනු ලැබිය හැකි ය.

(16) සෑම ආංශික අධීක්ෂණ කාරක සභාවක් ම යම් පනත් කෙටුම්පතක් හෝ පොදු වැදගත්කමකින් යුක්ත වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් බලපෑමට ලක්ව සිටින හෝ යම් බැඳියාවක් ඇති පාර්ශ්වයකින් සාක්ෂි කැඳවනු ලැබිය හැකි ය.

(17) සෑම ආංශික අධීක්ෂණ කාරක සභාවකට ම තැනැත්තන් කැඳවනු ලැබීමට සහ ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගනු ලැබීමට බලය තිබිය යුතු අතර ම, එම කාරක සභාව ඉදිරියේ විමසනු ලබන සාක්ෂිවල කාර්ය සටහන් ද සමඟ සිය මත සහ නිරීක්ෂණ අඩංගු වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(18) නීති පැනවීමට හෝ ව්‍යවස්ථාමය නොවන වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාවක් කටයුතු කරනු ලබන අවස්ථාවක දී, අදාළ විෂය පවරනු ලබන සහ අමාත්‍ය වගකීම් දරන කැබිනට් අමාත්‍යවරයා හෝ එලෙස පවරා නොමැති අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා විසින් වාර්තාවේ දක්වා ඇති නිර්දේශ සති අටක කාලයක් ඇතුළත ඉටු කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව තමා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතු ය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශ ඉටු කළ නොහැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඊට අමාත්‍යවරයා හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණාවලින් පැන නගින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(19) (අ) කාරක සභාව ඉදිරියේ පවතින එක් එක් කරුණු විමසීම් සම්බන්ධයෙන් වයස අවුරුදු 18 සහ 35 අතර වූ තරුණ නියෝජිතයන් පස්දෙනෙකු (5) ට නොවැඩි පිරිසක් කාරක සභාවට සහාය වීම සඳහා සභාපතිවරයාට කැඳවිය හැකි ය.

(ආ) එසේ කැඳවනු ලබන තරුණ නියෝජිතයන්ට සභාපතිවරයාගේ අවසරය ඇතිව කාරක සභාව ඉදිරියේ ඇති ලේඛන පරීක්ෂා කිරීමට සහ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය. එසේ වුවද, එකී තරුණ නියෝජිතයන්ට කාරක සභාවේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි ය.

(ඇ) කාරක සභාව විසින් ගනු ලබන ඕනෑම තීරණයකට යටත්ව, තරුණ නියෝජිතයින්ගේ අදහස්, නිරීක්ෂණ සහ මතයන් කමිටු වාර්තාවට අතිරේකයක් වශයෙන් ඇතුළත් කිරීමට සභාපතිවරයාට අවසර දිය හැකි ය.

(ඈ) තේරීම් කාරක සභාව විසින් නියම කරන ලද මාර්ගෝපදේශ මත තරුණ නියෝජනය සඳහා තෝරා ගැනීමේ නිර්ණායක තීරණය කරනු ලැබිය යුත්තේ ය.]

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා

*[*]**112.** [(1) පාර්ලිමේන්තුවේ එක් එක් සභාවාරය ආරම්භයේදීම සහ අවශ්‍යතා මතු වන අයුරින් කලින් කලට තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන්නා වූ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සංඛ්‍යාවක් පත් කළ යුත්තේ ය:—

(අ) සභාපතිවරයා ලෙස අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා;

(ආ) රාජ්‍ය අමාත්‍යවරයා;

(ඇ) නියෝජ්‍ය අමාත්‍යවරයා; සහ

(ඈ) තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙක්.

(2) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකින් තම අත්සන යටතේ වූ ඉල්ලීමක් මඟින් පූර්ව අවසරය ලබා නොගෙන ඒ කාරක සභාවේ අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගි නොවන යම් සාමාජික මන්ත්‍රීවරයකු ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකත්වය අතහැර ගියාසේ සලකනු ලැබිය යුතු අතර තේරීම් කාරක සභාවේ එකඟතාවය මත හැර ඒ සාමාජිකයා ඒ සභාවාරය තුළ නැවත ඒ කාරක සභාවට පත් නොකළ යුත්තේ ය:

එසේ වුව ද, ඒ සාමාජික මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවෙන් නොපැමිණීමේ අවසරය ප්‍රථමයෙන් ලබාගෙන පාර්ලිමේන්තු රැස්වීම්වලට නොපැමිණෙන කාලසීමාවක් තුළ යෙදෙන දිනයකදී ඒ කාරක සභාවක යම් රැස්වීමක් පවත්වනු ලබන්නේ නම්, ඉහත කී විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.

(3) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට තමා සාමාජිකයකු නොවන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක රැස්වීම්වලට ඒ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය පරිදි සහභාගි වීමට අවකාශ ඇති අතර සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී ඒ මන්ත්‍රීවරයා ඉන් ඉවත් විය යුත්තේ ය.

(4) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම සහ සභාපතිවරයා හෝ පාර්ලිමේන්තුව විසින් කාරක සභාවට යොමු කරනු ලබන යෝජනා, නියෝග හෝ ලේඛන ඇතුළුව

---

[*] 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

කවර හෝ කරුණු පිළිබඳ විමසා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක කාර්යය විය යුත්තේ ය.

(5) (අ) කාරක සභා රැස්වීම් කැඳවීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කළ යුත්තේ ය.

(ආ) පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයා මඟින් කාර්යාරම්භ කිරීමේ බලය අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකට තිබිය යුත්තේ ය.

(6) සභාපතිවරයා විසින් කැඳවනු ලබන කවර හෝ අවස්ථාවක එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්විය යුත්තේ ය. සභාපතිවරයා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සභාපතිවරයා විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක් හෝ රැස්වීමක් කැඳවා අර්ථවත් වැඩසටහනක් සකස් කරන බවට වගබලා ගැනීම, සෑම අමාත්‍යාංශ ලේකම්වරයකුගේම කාර්යය වන අතර කලින් කලට එහි නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය:

එසේ වුව ද, එබඳු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක යටත් පිරිසෙයින් සාමාජික මන්ත්‍රීවරයන් තුන් දෙනකුගේ ලිඛිත ඉල්ලීමක් මත හැකිතාක් ඉක්මනින් රැස්වීමක් කැඳවනු ලැබිය යුත්තේ ය.

(7) කාරක සභාව ඉදිරියට තැනැත්තන් කැඳවා ප්‍රශ්න කිරීමට ද, ලියකියවිලි සහ වාර්තා ගෙන්වා පරීක්ෂා කිරීමට ද, තැනින් තැනට යාමට ද, තමන් වෙත යොමු කෙරෙන කරුණු පූර්ණ ලෙස සලකා බැලීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවන් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබනු ලැබ ඇති විටක වුව ද රැස්වීමට ද, එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(8) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු අතර නියමිත ගණපූරණය නොමැතිව කටයුතු නොකිරීම ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුත්තේ ය.

(9) කාරක සභා සඳහා වන පොදු රීති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා ද අදාළ විය යුත්තේ ය.]

## ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව

**113**. (1) නියෝජ්‍ය කථානායකවරයා සභාපති වූ ද නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් සමන්විත, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) තේරීම් කාරක සභාව විසින් ආණ්ඩු පාර්ශ්වය සහ විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරමින් අතිරේක මන්ත්‍රීවරයන්ද නම් කරනු ලැබිය හැකි අතර, එවැනි මන්ත්‍රීවරයන් නම් කරනු ලැබීමට කථානායකවරයාට බලය ඇත්තේ ය.

(3) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ ගණපූරණය මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.

(4) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ කර්තව්‍යය, පාර්ලිමේන්තුව විසින් ඊට සලකා බැලීම පිණිස යොමු කරනු ලබන පනත් කෙටුම්පත්/යෝජිත ප්‍රඥප්තිවලට පමණක් සීමා විය යුත්තේ ය.

(5) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් අදාළ කර්තව්‍යය ඉටුකරනු ලැබීම පිණිස යම් යම් අය කැඳවනු ලැබීමට ද, ලියකියවිලි හා පොත්පත් ගෙන්වා ගනු ලැබීමට ද, එම කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(6) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපතිවරයාට එක් මූලික ඡන්දයක් තිබිය යුතු අතර, ඡන්ද විමසීමකදී ප්‍රකාශ කරන ලද ඡන්ද සමානව බෙදී ඇත්නම් සභාපතිවරයාට තීරක ඡන්දයක් ද තිබිය යුත්තේ ය.

(7) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලද යම් පනත් කෙටුම්පතක් භාර මන්ත්‍රීවරයා එම ස්ථාවර කාරක සභාවේ සාමාජිකයකු නොවන අවස්ථාවක දී, එම පනත් කෙටුම්පත සාකච්ඡාවට භාජනය වන කවර හෝ රැස්වීමකට පැමිණීමටත්, පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කාරක සභාව ඇමතීමටත්, එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පැන නගින කිසියම් ප්‍රශ්නයක් මත එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයකු ලෙස සංශෝධන ඉදිරිපත් කරනු ලැබීමටත්, ඡන්දය දීමටත් එම මන්ත්‍රීවරයාට අයිතිය තිබිය යුත්තේ ය.

(8) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වැඩ පිළිවෙළ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක වැඩ පිළිවෙළට හැකි තාක් දුරට සමාන විය යුතු අතර, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ කාර්ය සටහන් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක කාර්ය සටහන්වල ස්වරූපයෙන්ම සකස් කරනු ලැබ අදාළ පනත් කෙටුම්පත/යෝජිත ප්‍රඥප්ති සහ ඒ පිළිබඳ වාර්තාව සමග, යම් කාල සීමාවක් පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබ තිබේ නම්, එම කාල සීමාව තුළදී එම කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුවද, වාරාවසාන කිරීමක් සිදුවන අවස්ථාවක දී, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සාකච්ඡා නිමකර නොමැතිව එහි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක දී, එම කාරක සභාවේ වැඩකටයුතු ඊළඟ සභාවාරයේ දී එකී පනත් කෙටුම්පත/යෝජිත ප්‍රඥප්ති යොමු කරනු ලැබ තිබූ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය.

## විශේෂ කාර්යයන් සඳහා කාරක සභා

## තේරීම් කාරක සභාව

**114**. (1) ආංශික අධීක්ෂණ කාරක සභාවල සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සංයුතිය, සාමාජික සංඛ්‍යාව, ඒවායේ කර්තව්‍ය සහ ගණපූරණය

සහ ඒ සම්බන්ධව සිය මතය හැකි පමණ ඉක්මනින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබීම සඳහා ද මතු සඳහන් කාරක සභාවල සේවය කිරීම සඳහා ද මන්ත්‍රීවරයන් නම් කරනු පිණිස සෑම සභාවාරයක් ආරම්භයේ දී ම ‘‘තේරීම් කාරක සභාව’’ යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය: —

(අ) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව;

(ආ) ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව;

(ඇ) ගෘහ්‍ය කාරක සභාව;

(ඈ) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව;

(ඉ) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව;

(ඊ) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා;

(උ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව;

(ඌ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව;

(එ) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව;

†(ඒ) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව;

†(ඔ) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව;

†(ඕ) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව;

(ක) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව;

(ග) උසස් නිලතල පිළිබඳ කාරක සභාව; සහ

(ච) පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව.

(2) තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් එක් එක් සභාවාරය ආරම්භයේ දී නම් කළ යුතු සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය. පාර්ලිමේන්තුව කල් තබනු ලැබ තිබියදී වුව ද, ස්වකීය රැස්වීම් පවත්වනු ලැබීමට ද, වරින් වර වාර්තා කරනු ලැබීමට ද, කිසියම් කාරක සභාවකට යම් මන්ත්‍රීවරයකු නම් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබීමට ද තේරීම් කාරක සභාවට අවසර තිබිය යුත්තේ ය.

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව

**115**. කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා,

† 2022 නොවැම්බර් 23 දින සම්මත කරන ලද සංශෝධනවලට අදාළ ආනුෂංගික සංශෝධන

විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් අටදෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ සභානායකවරයා විමසා, කථානායකවරයා විසින් කාරක සභාවට යොමු කිරීම පිණිස නියම කරනු ලබන පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සඳහා වෙන් කළ යුතු කාල සීමාව සහ වෙනත් කරුණු සලකා බලා තීරණය කිරීම, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය විය යුත්තේ ය. මෙම කාරක සභාවේ රැස්වීම්වල කාර්ය සටහන් සියලුම සාමාජික මන්ත්‍රීවරයන් අතර බෙදා හරිනු ලැබිය යුත්තේ ය.

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව

**116**. කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් හය දෙනෙකුගෙන් සමන්විත, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටිය සහ එහි වැඩකටයුතු මෙහෙයවීම සම්බන්ධ කාරණා සලකා බැලීම සහ ස්ථාවර නියෝගවලට අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි සංශෝධන නිර්දේශ කිරීම සහ පාර්ලිමේන්තුව විසින් එම කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ස්ථාවර නියෝගවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් වාර්තා කිරීම ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය විය යුත්තේ ය.

## ගෘහ්‍ය කාරක සභාව

**117**. (1) කථානායකවරයා සභාපතිවරයා වූ ද, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් නව දෙනෙකුගෙන් සමන්විත ගෘහ්‍ය කාරක සභාවක් යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) මන්ත්‍රීවරයන්ගේ පහසුකම් හා සම්බන්ධ සියලු කාරණා සලකා බලා ඒ සම්බන්ධයෙන් උපදෙස් දෙනු ලැබීම ගෘහ්‍ය කාරක සභාවේ කර්තව්‍යය වන්නේ ය. ගෘහ්‍ය කාරක සභාවේ රැස්වීම්වල කාර්ය සටහන් සියලුම මන්ත්‍රීවරයන් අතර බෙදා හරිනු ලැබිය යුත්තේ ය.

## ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව

†**118**. [(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

---

† 2022 නොවැම්බර් මස 23 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත්කර ඒ වෙනුවට ආදේශ කරන ලදි.

(2) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වන්නේ—

(අ) මන්ත්‍රීවරයන්ගේ පැවැත්ම සහ අචාර විධි සම්බන්ධව රීති කඩකිරිමට අදාළ කාරණා හෝ පාර්ලිමේන්තුවේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩකිරීම සම්බන්ධව පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිරීමක් බැලූබැල්මට පෙනෙන පරිදි වරප්‍රසාද කඩකිරීමක් බවට කථානායකවරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි පැමිණිල්ලක් විභාග කිරීම; සහ

(ආ) ඒ එක් එක් කාරණය සම්බන්ධ කාරණා ඇසුරින් පැවැත්ම සහ ආචාර විධි සම්බන්ධ රීතිවලට වරප්‍රසාද කඩකිරීමක් සිදුකර තිබේ ද යන්න නිශ්චය කිරීම සහ එවැනි කඩකිරීමක් සිදුවී තිබේ නම්, එම වරප්‍රසාද කඩ කිරීමේ ස්වභාවය, ඊට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කාරණා සහ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන කාරක සභාවේ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීම.

(3) කාරක සභාව වෙත යොමුකරනු ලබන එවැනි පැමිණිල්ලක් කාරක සභාවට ලැබුණු දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත කාරක සභාවේ නිර්දේශ කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් සුවිශේෂී කරුණු මත එකී කාලසීමාව දීර්ඝ කරන ලෙසට වන ඉල්ලීමකට අවසර ලබාදීමට කථානායකවරයාට බලය තිබිය යුත්තේ ය. කාරක සභාවට එසේ යොමු කරනු ලබන කාරණා විභාග කිරීම සඳහා අවශ්‍ය වන තැනැත්තන් කැඳවනු ලැබීමට සහ ලිපි ලේඛන සහ අනෙකුත් වාර්තා ගෙන්වා ගනු ලැබීමට ද අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියාවන් කරනු ලැබීමට ද කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ චර්යා ධර්ම සංග්‍රහයේ රීති කඩ කිරීම හෝ පිළිනොපැදීමට අදාළව කාරක සභාවට යොමු කරනු ලබන යම් කාරණයක් පරීක්ෂා කිරීම ද කාරක සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ අධිකාරය මත හෝ ඒ යටතේ කරනු ලබන එවැනි විභාග කිරීමක දී එහි සියලු අදියරවල දී සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් ම සහයෝගය දක්වනු ලැබිය යුත්තේ ය. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ යම් සාමාජික මන්ත්‍රීවරයකුට චර්යා ධර්ම සංග්‍රහයේ කඩ කරන ලදැයි කියනු ලබන රීති පිළිබඳව කාරක සභාව විසින් සලකා බලනු ලැබීමේ දී, ඒ සඳහා බලපෑම් කිරීමේ අදහසින් කිසිම මන්ත්‍රීවරයකු පෙළඹවීමක් සිදු කරනු නොලැබිය යුත්තේ ය.

(5) කාරක සභාව විසින් සිය කර්තව්‍යය ඉටු කරනු ලැබීමේ දී, කාරක සභාවට විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීමට සහ සාක්ෂිකරුවන් කැඳවා පරීක්ෂා කරනු ලැබීමට හැකි ය.

(6) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් පිළියෙල කරනු ලබන සිය වාර්තාවේ තිබෙන නිගමනයන් සහ නිර්දේශ පිළිබඳව පාර්ලිමේන්තුව

විසින් සලකා බලනු ලැබිය හැකි අතර, අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී අදාළ මන්ත්‍රීවරයාට දඬුවම් පමුණුවනු ලැබිය හැකි ය.

(7) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට, සිය කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

(8) මන්ත්‍රීවරයන්ගේ ආචාර ධර්ම සහ වෙනත් විෂමාචාර පිළිබඳ සිද්ධි විභාග කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යැයි ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විසින් සලකනු ලැබිය හැකි යම් නියෝග නිකුත් කරනු ලැබිය හැකි ය.]

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

***119**. [(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පරීක්ෂා කරන ලද ගිණුම්, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටි හා යම් දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය ගැන ද ඉන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය.

(5)(අ) කාරක සභාව විසින් නියෝග කරනු ලබන යම් දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතනවල සියලු ගිණුම් හා මුදල් සහ කළමනාකරණය සම්බන්ධව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි සිය සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකිය.

(ආ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කාර්යය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපළවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුතු ය. පිළිගත හැකි හේතුවක් මත කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.]

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

*__120.__ [ (1)තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් සහ ඉන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටිය, කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය.

---

* 2022 ඔක්තෝබර් 05 දින කරන ලද සංශෝධනය මඟින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(5) (අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇත්තා වූ යම් ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක සියලුම ගිණුම්, අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු මූල්‍ය තත්ත්වය සහ කළමනාකාරිත්වය පරීක්ෂාකර කාරක සභාවට වාර්තා කරනු ලැබීම පිණිස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය අවස්ථාවක දී, කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(ආ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කාර්යය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපලවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. පිළිගත හැකි හේතුවක් මත කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.]

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

*__121.__ [(1) සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු විය යුත්තේ ය යන්නට යටත්ව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සභාපතිවරයකු හා සාමාජික මන්ත්‍රීවරයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(2) මතු සඳහන් දේ පරීක්ෂා කරනු ලැබීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය විය යුත්තේ ය:—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම;

(ආ) ඒකාබද්ධ අරමුදලෙන් කරනු ලබන ගෙවීම්;

(ඇ) නීතිය මගින් යම් විශේෂ කාර්ය සඳහා මහජන අරමුදල් භාවිතා කිරීම;

(ඈ) රජයේ අරමුදල් යෙදවීම;

(ඉ) පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනතේ අඩංගු විසර්ජනවල ආර්ථික අවපාත, විසර්ජන මාරු කිරීම සහ අනපේක්ෂිත ශේෂය;

(ඊ) පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම;

(උ) රාජ්‍ය ණය සහ ණය සේවා;

(ඌ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශන; සහ

(එ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පත්, යෝජනා, යෝජනා සම්මතයන් සහ නියෝග.

(3) පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයකු හෝ විසින් ඕනෑම කාරණයක් සලකා බලා වාර්තා කිරීම පිණිස රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ය.

(4) කාරක සභාව විසින්, ඉහත (2) සහ (3) ඡේදවල දක්වා ඇති කාරණා වලින් පැන නඟින ගැටලු, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(5) විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව ආරම්භ වීමට පෙර කාරක සභාව විසින්–

(i) මුළු ඇස්තමේන්තුගත වියදම් හා ආදායම් සඳහා පදනම ලෙස භාවිතා කෙරෙන බදුකරණය, මූල්‍ය සහ ආර්ථික උපකල්පන පිළිබඳව; සහ

(ii) මුදල් වෙන් කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සමඟ අනුකූල වන්නේ ද යන්න පිළිබඳව;

වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(6) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අවස්ථාවක දී, එම වාර්තාව මුදල් විෂය භාර අමාත්‍යවරයාට යොමු කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක කාල සීමාවක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(7) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් යම් තැනැත්තන් කැඳවීමට සහ ලියකියවිලි හා වාර්තා ගෙන්වා ගැනීමට බලය තිබිය යුතු අතර, යෝජනා සහ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව සාක්ෂි සටහන් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

(8) කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් හතර දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.]

## බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව

†**122**. [(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට මතු සඳහන් බලතල තිබිය යුත්තේ ය:—

(අ) ශ්‍රී ලංකාවේ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය ක්ෂේත්‍ර සේවාවන්හි වෘත්තීයමය ප්‍රමිතීන් සහ සංස්කෘතිය පිළිබඳව සලකා බලා වාර්තා කිරීමට;

(ආ) ගනුදෙනු-කරුවන් සවිබල ගැන්වීම සහ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය සේවා ආයතනවල ප්‍රමිතීන් ඉහල නැංවීම පිණිස ඒ මත දැඩි විනයක් ඇතිකිරීම සඳහා එම ආයතන වල ක්‍රියාකාරීත්වය සහ බහුවිධසේවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ව්‍යවස්ථාදායක සහ අනෙකුත් නියාමන ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඇ) ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති, විදේශීය මූල්‍ය සේවා නියෝග සහ ශ්‍රී ලංකාවේ මුදල් කටයුතු, ණය සහ මූල්‍ය සේවා සහ ආර්ථික වර්ධනය මත ඒවායේ බලපෑම් හා සම්බන්ධ කරුණු අංග සම්පූර්ණ පදනමකින් අධ්‍යයනය කොට සමාලෝචනය කිරීමට;

(ඈ) මහ බැංකු සංචිත පද්ධතිය, අපනයන හා විදේශීය වෙළඳ ප්‍රවර්ධනය, අපනයන පාලන ආනයන පාලන, වාණිජ, කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය ක්‍රියාවලි, මූල්‍ය ආයතනවල කාර්ය සාධනය සහ කළමනාකරණය, මුදල් නෝට්ටු, කාසි සහ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ නිදහස් කිරීම ඇතුළුව මුදල් ප්‍රතිපත්තිය හා සම්බන්ධ කරුණු සහ ණය වියපැහැදම් කිරීම

---

† 2022 නොවැම්බර් 23 දින සම්මත කරන ලද සංශෝධනය මගින් අලුත් ස්ථාවර නියෝගය ඇතුළත් කරන ලදී.

සහ නැවත අය කර ගැනීම හා සම්බන්ධ කරුණු පිළිබඳව අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීමට සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවර භාවය සහ අඛණ්ඩතාවය තහවුරු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඉ) ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (Sri Lanka Inter Bank Offered Rate (SLIBOR)) සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නියාමන සහ තරඟකාරී විමර්ශන සිදුකිරීමට සහ ඒවා පරීක්ෂා කිරීමට;

(ඊ) රාජ්‍ය මූල්‍ය ආයතන සහ රක්ෂණය ඇතුළු සපයනු ලබන මූල්‍ය සේවාවන්ට අදාළ ආයතනික පාලනය, කාර්ය සාධනය සහ කළමනාකරණය, විනිවිදභාවය මෙන්ම බැඳියාවන් අතර ගැටුම් සමාලෝචනය කිරීමට;

(උ) මූල්‍ය ප්‍රතිපත්ති සහ රක්ෂණය ඇතුළු මූල්‍ය ආයතනවලට අදාළව රජයේ සහ අනාගත රජයන්ගේ මෙන්ම පාර්ලිමේන්තුවේ වගකීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සමාලෝචන සිදු කිරීමට;

(ඌ) සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ කාර්ය සාධනය හා කළමනාකරණය සහ ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රවණතාවන් පිළිබඳ විමසා වාර්තා කිරීමට; සහ

(එ) කොළඹ කොටස් වෙළඳපොළේ කාර්ය සාධනය සහ කළමනාකරණය පිළිබඳ විමසා වාර්තා කිරීමට.

(3) රජය සතු යම් බැංකුවක් හෝ රක්ෂණය ඇතුළු මූල්‍ය සේවා සපයන වෙනත් ඕනෑම ආයතනයක් පිළිබඳ හෝ රජයේ ලිඛිත නීතියක් මඟින් බලය පවරා ඇති වෙනත් කාර්යයක් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් සහ ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව සිදු කරන විමර්ශනවලින් අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් කාරක සභාව සෑම තුන් මාසයකට වරක් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු සම්බන්ධ නිරීක්ෂණ සහ යම් නිර්දේශයක් තිබේ නම් එම නිර්දේශ ද එකී වාර්තාවට ඇතුළත් විය යුත්තේ ය.

(4) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ විට, එය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර එම අමාත්‍යවරයන් විසින් වාර්තාවේ දක්වනු ලැබ ඇති නිර්දේශ සති අටක කාලසීමාවක් තුළ ඉටු කරනු ලැබීමටත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු යැයි එකී අමාත්‍යවරයන් විසින් යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමටත්, නැතහොත් යම් නිර්දේශයක් ඉටු නොකළ හැකිවනු ඇතැයි යන්න අදාළ අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් එයට ලිඛිතව හේතු පැහැදිලි කර එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කරනු ලැබීමටත් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5)(අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය;

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කාරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙක් කාරක සභාව ඉදිරියට කැඳවීමට, ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර කාරක සභාවේ අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.]

## ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව

†**123**. [(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ කාර්යයන් වන්නේ:—

(අ) රජය සතු ව්‍යවසායවල කාර්ය සාධනය, කළමනාකරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ප්‍රතිපත්ති රාමුව, නෛතික රාමුව සහ අවදානම් කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ආ) රජය සතු ව්‍යවසායවල මූල්‍ය ස්ථාවරත්වය, ණය කළමනාකරණය, ලාභ සහ ආයෝජන කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ඇ) රජය සතු ව්‍යවසායවල පාඩු අවම කර ලාභ වැඩි කිරීම සඳහා අවසතුකරණය කිරීමේ අවශ්‍යතා, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව සඳහා ඇති අවස්ථා සහ උපායමාර්ග පරීක්ෂා කිරීම; සහ

(ඈ) රජය සතු ව්‍යවසායන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූවන්ට අදාළව මානව සම්පත් කළමනාකරණය, අධික හෝ අතිරික්ත කාර්ය මණ්ඩලය අඩු කිරීම, වේතන හා ව්‍යවස්ථාපිත ගෙවීම් නොගෙවීම සහ වේතන සහ දීමනා වැඩිපුර ගෙවීම පිළිබඳ පරීක්ෂා කිරීම ය.

(3) 1971 අංක 38 දරන මුදල් පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනත මගින් පාලනය වන කවර හෝ රජය සතු ව්‍යවසායක් පිළිබඳව කාරක සභාව විසින් හෙළිදරව් කරගනු ලැබූ කරුණු සම්බන්ධයෙන් කාරක සභාව සෑම මාස තුනකට ම වරක් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

(4) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ විට, එය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර එම අමාත්‍යවරයන් විසින් වාර්තාවේ දක්වනු ලැබ ඇති නිර්දේශ සති අටක කාලසීමාවක් තුළ ඉටු කරනු ලැබීමටත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු යැයි එකී අමාත්‍යවරයන් විසින් යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමටත්, නැතහොත් යම් නිර්දේශයක් ඉටු නොකළ හැකිවනු ඇතැයි යන්න අදාළ අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් එයට

† 2022 නොවැම්බර් 23 දින සම්මත කරන ලද සංශෝධනය මගින් අලුත් ස්ථාවර නියෝගය ඇතුළත් කරන ලදී.

ලිඛිතව හේතු පැහැදිලි කර එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කරනු ලැබීමටත් කටයුතු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කාරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩකටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙක් කාරක සභාව ඉදිරියට කැඳවීමට, ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර කාරක සභාවේ අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.]

## ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව

†**124**.[(1) රටේ ආර්ථික ස්ථායීබව ශක්තිමත් කිරීමේ දී රජයට අමතර ආදායම් රැස් කිරීම සඳහාත්, රජයේ වියදම් සලකා බැලීම සඳහාත්, ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම පිණිස තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත වන ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රජය වෙනුවෙන් බදුකරණය, තීරු ගාස්තු හා අනෙකුත් ආදායම් වර්ධනය කිරීම සම්බන්ධ සියලුම කරුණු පරීක්ෂා කර බැලීමටත්, අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවන්හි දී බදු හා තීරු ගාස්තු පිළිබඳව පවත්නා ප්‍රතිපත්තිවලට වෙනස්කම් යෝජනා කිරීමටත්, මෙම කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(3) ස්වකීය රාජකාරි ඉටුකිරීමෙහිලා කාරක සභාව මතු සඳහන් කරුණු පිළිබඳව විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ ය—

(අ) සඵලදායී ආදායම් රැස්කිරීමේ යාන්ත්‍රණ;

(ආ) දේශීය ආදායම් නීති සම්බන්ධ හා වෙනත් නීතිවල නියම කරනු ලැබ ඇති ආදායම් ක්‍රියාමාර්ග සම්බන්ධ කාරණා;

(ඇ) තීරු ගාස්තු, රේගු නීති සහ ආනයනවලට හා අපනයනවලට අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ ද ඇතුළත් වන, රේගුව හා රේගු පරිපාලනය ආශ්‍රිත කාරණා;

(ඈ) සියලුම ආකාරයේ වෙළඳ ගිවිසුම්, වෙළඳ භාණ්ඩ ගිවිසුම් හා ඒවා ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මෙන්ම එම ගිවිසුම්වල ජාත්‍යන්තර රීති හා පිළිගත් ලක්ෂණ ඇතුළු අන්තර් ජාතික වෙළඳාම ආශ්‍රිත කාරණා;

(ඉ) ආනයන කර්මාන්තයේ බලපෑම්, ආනයන ප්‍රතිපත්ති, තරගකාරී ආනයන වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණයන් සහ හානිකර හා අසාධාරණ ආනයන හා එබඳු ආනයන පිළිවෙත් ආමන්ත්‍රණය කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළු ආනයන කර්මාන්තය ආශ්‍රිත කාරණා;

(ඊ) අපනයන ප්‍රතිපත්ති, අපනයන ප්‍රවර්ධන යාන්ත්‍රණ, වෙළඳපොළ ප්‍රවිෂ්ටය හා තරගකාරිත්වය, කර්මාන්තවලට අවශ්‍ය ද්‍රව්‍යවල අඛණ්ඩ සැපයුම, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ සබඳතා ඇතුළු වෙළඳ කර්මාන්තය ආශ්‍රිත විශේෂිත කාරණා;

---

† 2022 නොවැම්බර් 23 දින සම්මත කරන ලද සංශෝධනය මගින් අලුත් ස්ථාවර නියෝගය ඇතුලත් කරන ලදී.

(උ) සියලුම රජයේ විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය-උපස්ථානය, සුභසාධනය හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම, ඒවායේ ගෙවීම් හා ප්‍රතිපත්ති, රජයේ ළමා ආරක්ෂණ වැඩසටහන්, ශාරීරික හෝ මානසික ආබාධිතතා සහිත තැනැත්තන් සඳහා වන වැඩසටහන් සහ පුනරුත්ථාපන වැඩසටහන් ඇතුළු රජයේ සමාජ සේවා වැඩසටහන් ආශ්‍රිත කාරණා; සහ

(ඌ) හදිසි ආපදා සහන හා ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා.

(4) කාරක සභාවට ස්වකීය විෂය පථය යටතේ පවතින සියලු කරුණු සම්බන්ධයෙන් පොදු අධීක්ෂණ බලතල තිබිය යුතු අතර, එහෙත් එය පවතින නීතිවලට සීමා විය යුත්තේ ය:

එසේ වුවද, කාරක සභාවට ස්වකීය විෂය පථය යටතේ තිබෙන කරුණු වලට අදාළ නව නීති පැනවීම සම්බන්ධයෙන් සහ පවතින නීතිවලට සංශෝධන හඳුන්වාදීම හෝ පවතින නීති අහෝසි කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට බලය ඇත්තේ ය.

(5) කාරක සභාව සෑම මාස තුනකට වරක් ම කාරක සභාව විසින් සොයා ගන්නා ලද කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවට ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු පිළිබඳ ස්වකීය නිරීක්ෂණ සහ යම් නිර්දේශක් තිබේ නම් එම නිර්දේශ ද ඇතුළත් විය යුත්තේ ය.

(6) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ විට, එය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර එම අමාත්‍යවරයන් විසින් වාර්තාවේ දක්වනු ලැබ ඇති නිර්දේශ සති අටක කාලසීමාවක් තුළ ඉටු කරනු ලැබීමටත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු යැයි එකී අමාත්‍යවරයන් විසින් යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමටත්, නැතහොත් යම් නිර්දේශයක් ඉටු නොකළ හැකිවනු ඇතැයි යන්න අදාළ අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් එයට ලිඛිතව හේතු පැහැදිලි කර එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කරනු ලැබීමටත් කටයුතු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණාවලින් පැන නගින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(7) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට

සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(8) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනුකාරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(9) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(10) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙක් කාරක සභාව ඉදිරියට කැඳවීමට, ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(11) ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.]

## මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව

***125**. [(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) 30(10) ස්ථාවර නියෝගයේ දක්වා ඇති විධිවිධාන යටතේ කාරක සභාවට යොමු කරනු ලබන පෙත්සම් සලකා බැලීම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක නිලධරයකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් යම් අසාධාරණයක් යම් පෙත්සමක් මගින් අනාවරණය වන බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මතය වන අවස්ථාවක, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් එම පෙත්සම විභාග කරනු ලැබීම හෝ විභාගකොට වාර්තා කරනු ලැබීම සඳහා එය පරිපාලන

---

* 2022 ඔක්තෝබර් 05 දින සම්මත කරන ලද සංශෝධනය මගින් මුල් ස්ථාවර නියෝගය ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(4) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්වරයාට) යොමු කරනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවක් කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඒ වාර්තාව පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් හෝ කාරක සභාව විසින් සලකා බලනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ස්වකීය මතය පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

(5) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් නිරීක්ෂණ ද සමඟ ගත යුතු පියවර සම්බන්ධයෙන් සිය මතය, සෑම මාස තුනකට වරක්ම, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(6) වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කළ විට, කථානායකවරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු අදාළ වන යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ සඳහා එම අමාත්‍යවරයාට යවනු ලැබීමට පියවර ගනු ලැබිය යුතු අතර, එම අමාත්‍යවරයා විසින් තම නිරීක්ෂණ සති අටක කාල සීමාවක් ඇතුළත දී කථානායකවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(7) අදාළ යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ ලැබීමෙන් අනතුරුව, එම නිරීක්ෂණවල පිටපතක් කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයාට සහ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ මන්ත්‍රීවරයාට යොමු කරනු ලැබිය යුත්තේ ය. ඒ අනුව ලබා දී ඇති පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත් නොවන්නේ නම්, සුදුසු ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය යුතුය. අමාත්‍යවරයා මාසයක් ඇතුළත අවශ්‍ය පරිදි කටයුතු කළ යුතු අතර, එම කාර්ය ඉටුනොකිරීමට කරුණු ලිඛිතව ඉදිරිපත් කර සලකා බලනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කළ යුත්තේ ය.

(8) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන විටක, කාරක සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ මහජන පෙත්සම් හෝ වාර්තා සම්බන්ධයෙන් විභාග කරනු ලැබ කාරක සභාවට වාර්තා කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් ම සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(9) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් කාරක සභාවේ කාර්යය ඉටු කරනු ලැබීම සඳහා කාරක සභාව ඉදිරියට යම් තැනැත්තකු කැඳවා ප්‍රශ්න කිරීමට ද යම් ලියකියවිලි, පොත් හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද ගබඩා සහ දේපළවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(10) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.]

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව

**126**. (1) කථානායකවරයා සභාපතිවරයා වූ ද, අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සහ කථානායකවරයා විසින් නම් කරනු ලබන වෙනත් මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සමන්විත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) ව්‍යවස්ථාවේ උපලේඛනය යටතේ පිහිටුවන ලද සියලුම ස්වාධීන කොමිෂන් සභා, සිය බලය ක්‍රියාත්මක කිරීම සහ කාර්යය හා කර්තව්‍යයන් පිළිබඳ කාර්ය සාධනය ඇතුළත්ව ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් එක් එක් ලිත් වර්ෂයක් සඳහා වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව විසින් වාර්ෂික වාර්තා සලකා බලනු ලැබිය යුතු අතර කාරක සභාව විසින් එහි කර්තව්‍යය ඉටුකිරීමේදී කොමිෂන් සභාවල සභාපතිවරයන්, සාමාජිකයන් හා නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට බලය තිබිය යුත්තේ ය.

(5) කාරක සභාව විසින් සැක දුරු කර ගැනීම පිණිස, කොමිෂන් සභා විසින් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට නියමිත අධිකරණ කටයුතු කිසිවක් ඇතොත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටීම කරනු නොලැබිය යුත්තේ ය.

## උසස් නිලතල පිළිබඳ කාරක සභාව

**127**. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත උසස් නිලතල පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් තනතුරකට පත් කරනු ලැබ ඇති හෝ නම් කරනු ලැබ ඇති යම් තැනැත්තකුගේ යෝග්‍යතාවය පරීක්ෂා කරනු ලැබීම සහ එම තැනැත්තන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය විය යුත්තේ ය.

(3) අමාත්‍යාංශ ලේකම්වරුන්, විදේශීය දූත මණ්ඩල ප්‍රධානීන් සහ උසස් නිලතල පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන තෝරා ගත් සංස්ථාවල

සභාපතිවරුන් යනාදී තනතුරු සඳහා තැනැත්තන් පත්කරන ලද්දා වූ හෝ නිලයක් දැරීමට නම් කරන ලද්දා වූ හෝ අවස්ථාවක දී, තෙමසක කාලයක් තුළ ඔවුන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදුකළ යුත්තේ ය.

(4) උසස් නිලතල පිළිබඳ කාරක සභාව විසින් සිය කර්තව්‍යය ඉටු කිරීම සඳහා කාරක සභාව ඉදිරියට තැනැත්තන් කැඳවා පරීක්ෂා කරනු ලැබීමට ද යම් ලිපිලේඛන, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, (2) ඡේදයේ සඳහන් කර ඇති එවැනි යම් තැනැත්තකුගේ යෝග්‍යතාව පූර්ණ වශයෙන් පරීක්ෂා කරනු ලැබීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කටයුතු කරනු ලැබීමට ද කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(5) පාර්ලිමේන්තුවේ වාරාවසාන කරනු ලැබීමක් නොතකා, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබීමට සහ සිය පරීක්ෂණ කටයුතු අඛණ්ඩව ඉදිරියට කර ගෙන යෑමට කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(6) උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.

## සම්බන්ධීකරණ කාරක සභාව

**128**. (1) සම්බන්ධීකරණ කාරක සභාව, කථානායකවරයා විසින් අභිනව පාර්ලිමේන්තුවක් ආරම්භයේ දී පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) සම්බන්ධීකරණ කාරක සභාව මතු සඳහන් සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සංයුක්ත විය යුත්තේ ය —

(අ) කාරක සභාවේ සභාපතිවරයා විය යුතු කථානායකවරයා;

(ආ) නියෝජ්‍ය කථානායකවරයා;

(ඇ) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

(ඈ) පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

(ඉ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;

(ඊ) ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා;

(උ) විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා; සහ

(ඌ) ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, †[බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව, †ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව, †ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව], ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ආංශික අධීක්ෂණ කාරක සභා,

---

† 2022 නොවැම්බර් 23 දින සම්මත කරන ලද සංශෝධනවලට අදාළ ආනුෂංගික සංශෝධනය

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරයන්.

(3) සම්බන්ධීකරණ කාරක සභාව විසින් —

(අ) කාරක සභාවල පහසුකම් සහ කාර්ය මණ්ඩලවලට අදාළ යම් කාරණා;

(ආ) කාරක සභාවල රැස්වීම් සඳහා කාරක සභා කාමරවල උපයෝජ්‍යතාවය;

(ඇ) කාරක සභා සඳහා විශේෂඥයන්ගෙන් සහ පර්යේෂකයන්ගේ උපයෝජ්‍යතාව;

(ඈ) කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරයන්ගේ රැස්වීම් සඳහා පැමිණීම; සහ

(ඉ) කාරක සභා වාර්තා විවාද කරනු ලැබීමේදී ඒ සඳහා කාලය වෙන් කිරීම.

පිළිබඳ සලකා බැලිය යුත්තේය.

(4) සම්බන්ධීකරණ කාරක සභාව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු අතර, කාරක සභාවේ රැස්වීම් කැඳවීම සඳහා එහි සභාපතිවරයා විසින් පියවර ගනු ලැබිය යුත්තේ ය.

(5) සම්බන්ධීකරණ කාරක සභාවට තැනැත්තන් කැඳවනු ලැබීමටත්, ලිපිලේඛන සහ වාර්තා ගෙන්වා ගනු ලැබීමටත්, කලින් කලට, රැස්වී පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබීමටත් බලය තිබිය යුත්තේ ය.

## පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව

**129.**(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් තිදෙනෙකු සහ විරුද්ධ පාර්ශ්වයේ පසු පෙළ මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(3) විරුද්ධ පාර්ශ්වයෙන් මන්ත්‍රීවරයන් තෝරා ගැනීමේ දී, විරුද්ධ පාර්ශ්වයේ වැඩි ම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින විශාලතම පක්ෂයට එක් මන්ත්‍රීවරයකු ද, විරුද්ධ පාර්ශ්වයේ ඊළඟට වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින දෙවැනි විශාලත ම පක්ෂයට එක් මන්ත්‍රීවරයකු ද, වශයෙන් වෙන්කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා හැර, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්, නියෝජ්‍ය අමාත්‍යවරයන්, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සහ දේශපාලන පක්ෂවල නායකයන් මෙම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයකු වීමට හිමිකම් නොලැබිය යුත්තේ ය.

(5) ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු පැමිණ නොසිටින අවස්ථාවලදී විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා කාරක සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(6) පසු පෙළ මන්ත්‍රීවරයන්ගේ කටයුතු සඳහා වෙන්කර තිබෙන දිනවල දී සැලකිල්ලට ගනු ලැබිය යුතු කටයුතු නිශ්චය කරනු ලැබීම පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ කර්තව්‍යය විය යුත්තේ ය.

(7) පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවට, විශේෂ කාර්යයන් සඳහා පිහිටුවන ලද වෙනත් යම් කාරක සභාවකට ඇති බලතල තිබිය යුතු අතර, කාරක සභා සඳහා වන සාමාන්‍ය රීති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම කාරක සභාවට ද අදාළ විය යුත්තේ ය.

(8) පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවට, කාරක සභාවේ රැස්වීම් සඳහා පැමිණීමට රජයේ නිලධරයන්ට ආරාධනා කරනු ලැබිය හැකි ය.

(9) යම් කාරණයක් මත විවාදයක් සඳහා රිසිවන්නා වූ යම් පසුපෙළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, මතු සඳහන් කාරණා පසුපෙළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුත්තේ ය —

(අ) විවාදයක් පවත්වනු ලැබීමේ වැදගත්කම;

(ආ) සහභාගී වේ යැයි අපේක්ෂා කරනු ලැබිය හැකි මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව; සහ

(ඇ) එම කාරණය විවාද කර තිබේ ද; නැතහොත් පාර්ලිමේන්තුවේ පවත්නා සභාවාරයේ දී විවාද කිරීමට නියමිතව තිබේ ද හෝ විවාද කිරීමට ඉඩ තිබේ ද යන බව.

(10) ඉහත (9) ඡේදය යටතේ යම් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් යෝග්‍ය යැයි පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව විසින් සලකනු ලබන්නේ නම්, එම කාරක සභාව විසින් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව අමතා එම විවාදය සඳහා කාලය වෙන් කර ගනු ලැබිය යුත්තේ ය.

(11) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින්, ඉන් අනතුරුව, එම විවාදය සඳහා සුදුසු දිනයක් සහ වේලාවක් වෙන්කර දෙනු ලැබිය යුත්තේ ය.

## විශේෂ කාර්යයන් සඳහා කාරක සභාවල කාර්ය පටිපාටිය

**130.**(1) ස්ථාවර නියෝගවල අන්‍යාකාරයෙන් නිශ්චිතව සඳහන් කර තිබේ නම් මිස, විශේෂ කාර්ය සඳහා වූ සෑම කාරක සභාවක් විසින්ම එහි පළමු රැස්වීමේ

කටයුතු ආරම්භ කිරීමට පෙර එහි සභාපතිවරයා වශයෙන් එක් සාමාජික මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයාට මූලික ඡන්දයක් තිබිය යුතු අතර ඡන්දය විමසනු ලැබූ අවස්ථාවක දී, ලැබුණු ඡන්ද ගණන සමානව බෙදී තිබේ නම් සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(3) ස්ථාවර නියෝගවල අන්‍යාකාරයෙන් නිශ්චිතව සඳහන් කර තිබේ නම් මිස, කාරක සභාවල පුරප්පාඩු, තේරීම් කාරක සභාව විසින් පුරවනු ලැබිය යුත්තේ ය. එවැනි සෑම පුරප්පාඩුවක් පිරවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීමේ දී පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුත්තේ ය.

(4) ස්ථාවර නියෝගවල අන්‍යාකාරයෙන් නිශ්චිතව සඳහන් කර තිබේ නම් මිස, කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර අවශ්‍ය ගණපූරණය නොමැතිව කටයුතු නොකිරීම එම කාරක සභාවේ සභාපතිවරයාගේ වගකීම විය යුත්තේ ය.

(5) කාරක සභාවල රැස්වීම්, සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුත්තේ ය.

(6) සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවකදී, කාරක සභාව විසින් තෝරා පත් කරගනු ලබන කාරක සභාවේ වෙනත් යම් සාමාජික මන්ත්‍රීවරයකු විසින් මූලාසනය දරනු ලැබිය යුත්තේ ය.

(7) කාරක සභාවක පූර්ව අවසරය ලබා නොගෙන, කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අතහැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, එම සාමාජික මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුවේ අවසරය කලින් ලබාගෙන පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහා නොපැමිණ සිටින යම් කාල සීමාවක් තුළ කාරක සභාවේ යම් රැස්වීමක් පවත්වනු ලබන අවස්ථාවකදී ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.

## කාරක සභා සඳහා පොදු රීති

**131**. (1) 85(1) (අ) ස්ථාවර නියෝගයේ සඳහන් විධිවිධානය හැර අනෙකුත් අවස්ථාවලදී මහ ලේකම්වරයා හෝ මහ ලේකම්වරයා විසින් නම් කරනු ලබන පාර්ලිමේන්තුවේ වෙනත් යම් නිලධරයකු එක් එක් කාරක සභාවේ ලේකම්වරයා විය යුත්තේ ය.

(2) එක් එක් කාරක සභාවක් විසින්, එම කාරක සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් තුළ යම් කාරණා සම්බන්ධයෙන් විභාගකර එම කාරක සභාවට වාර්තා කිරීම සඳහා සුදුසු යැයි සලකනු ලබන අවස්ථාවකදී, කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි ය. එම කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, එම අනු කාරක සභාවල කර්තව්‍යය ඉටු කරනු ලැබීම සඳහා එම අනු කාරක සභා ඉදිරියට යම් තැනැත්තන් කැඳවා ප්‍රශ්න කරනු ලැබීමට ද යම්

ලියකියවිලි වාර්තා හෝ ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ඊට යොමුකර තිබෙන කාරණා පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා තැනින් තැනට යාමටත්, පාර්ලිමේන්තුව යම් කල් තැබීමක් කරනු ලැබ තිබීම නොසලකා රැස්වීම් පවත්වනු ලැබීමටත්, එම අනු කාරක සභාවලට බලය පවරනු ලැබිය හැකි ය.

(3) (2) ඡේදය යටතේ පත් කරනු ලබන එක් එක් අනු කාරක සභාවක්ම සභාපතිවරයකු සහ කාරක සභාව විසින් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් අතුරින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුත්තේ ය. එම අනු කාරක සභාවේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් දෙදෙනකුගෙන් එහි ගණපූරණය සමන්විත විය යුත්තේ ය.

(4) කාරක සභාවේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන කාර්ය මණ්ඩලයේ නිලධරයකු, එවැනි සෑම අනු කාරක සභාවක ම ලේකම්වරයා විය යුතු අතර එවැනි සෑම අනු කාරක සභාවක ම කාර්ය සටහන් පිළියෙල කර පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය.

(5) කාරක සභාවක හෝ අනු කාරක සභාවක වාර්තාව සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවකදී සභාපතිවරයා විසින් බලය පවරන ලද කාරක සභාවේ වෙනත් යම් සාමාජික මන්ත්‍රීවරයකු විසින් පිළිගන්වනු ලැබිය යුත්තේ ය.

(6) එක් අනු කාරක සභාවක සභාපතිවරයා වශයෙන් කටයුතු කරනු ලබන කාරක සභාවේ යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේම වෙනත් යම් අනු කාරක සභාවක එකම අවස්ථාවක දී, සභාපතිවරයකු වශයෙන් කටයුතු කරනු නොලැබිය යුත්තේ ය.

(7) කාරක සභාවක යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙන අවස්ථාවක දී, සති අටක කාල සීමාවක් ඇතුළත දී, එම වාර්තාවේ අන්තර්ගතය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයා විසින් ප්‍රතිචාර දක්වනු ලැබිය යුතු බවට පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි ය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ එවැනි යම් වාර්තාවක් සම්බන්ධයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ ප්‍රතිචාරය සභාගත කරනු ලැබිය යුත්තේ ය. අනෙකුත් කාරක සභාවල වාර්තා සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයන් විසින් ප්‍රතිචාර දක්වනු ලැබිය යුත්තේ ය.

(8) යම් කාරක සභාවක් සහ එම කාරක සභාව විසින් පත් කරනු ලැබූ අනු කාරක සභාවක් පාර්ලිමේන්තුවෙන් පිටත රැස්වීම සඳහා කථානායකවරයාගේ අවසරය ලබා ගනු ලැබිය යුත්තේ ය.

(9) කථානායකවරයාගේ අනුමතියට යටත්ව කාරක සභාවල නියමයන්ට අනුව තොරතුරු සැපයීම හෝ සංකීර්ණ කාරණා වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා විශේෂඥ දැනුමක් ඇති තැනැත්තන් පත් කරනු ලැබීමට සහ එම තැනැත්තන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබීමට එම කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(10) සෑම කාරක සභාවක් ම සහ එම කාරක සභාව විසින් ම පත් කරනු ලබන යම් අනු කාරක සභාවකට කාරක සභාව විසින් බලය පවරනු ලැබූ විට, කථානායකවරයාගේ අනුමතිය ඇතිව සිය රැස්වීම් සඳහා පිට අය ඇතුළත් කර ගැනීමට බලය තිබිය යුත්තේ ය. කාරක සභාව හෝ අනු කාරක සභාව විසින් සාකච්ඡා පවත්වනු ලබන අවස්ථාවේ දී, එම අමුත්තන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(11) පිට අය ඇතුළත් කර ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කාරක සභාවේ හෝ අනු කාරක සභාවේ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(12) පාර්ලිමේන්තුවේ ගැලරි සඳහා ආගන්තුකයන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් අදාළ රීති කාරක සභාවට හෝ අනු කාරක සභාවකට හෝ පිට අය ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(13) කාරක සභාවක් හෝ අනු කාරක සභාවක සභාපතිවරයාට, අවස්ථාවෝචිත පරිදි, කාරක සභාවේ හෝ අනු කාරක සභාවේ රැස්වීම්වල විනය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කථානායකවරයාට තිබෙන බලය ම තිබිය යුත්තේ ය.

## කාරක සභා සභාපතිවරයන් විසින් ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම

**132**. (1) විශේෂ කාරක සභාවක හැර අනෙකුත් සෑම කාරක සභාවකම:—

(අ) සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වීම නතර වූ අවස්ථාවක දී; හෝ

(ආ) සභාපතිවරයා, සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම සඳහා සිය අදහස සම්බන්ධයෙන් කථානායකවරයාට ලිඛිතව දැනුම් දීමක් කරනු ලැබ තිබෙන අවස්ථාවක දී; හෝ

(ඇ) මෙම ස්ථාවර නියෝගයේ (2) සහ (3) ඡේදවල විධිවිධානවලට අනුකූලව එහි සභාපතිවරයා සම්බන්ධයෙන් විශ්වාසයක් නොමැති බවට කාරක සභාව විසින් යෝජනා සම්මතයක් සම්මත කරගනු ලැබ ඇති අවස්ථාවක දී,

සභාපති ධුරය පුරප්පාඩු වූ ලෙස කථානායකවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් එම කාරක සභාව සඳහා සභාපතිවරයකු තෝරා පත් කරගනු ලැබීම පිණිස දිනයක් නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම දිනය එම නිවේදනයෙන් පසු රැස්වීම් දින හතකට නොඅඩු දිනයක් විය යුත්තේ ය.

(2) සභාපතිවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාවක් සම්බන්ධ දැනුම් දීම එම යෝජනාව කරනු ලබන රැස්වීමට යටත් පිරිසෙයින් රැස්වීම් දින හතකට කලින් සභාපතිවරයාට සහ කාරක සභාවේ සෑම සාමාජික මන්ත්‍රීවරයකුටම බෙදා

හැර ඇත්නම් මිස එවැනි යෝජනාවක් කාරක සභාවක දී ඉදිරිපත් කරනු ලැබිය නොහැකි ය.

(3) කාරක සභාවක සභාපතිවරයාට එරෙහිව විශ්වාසභංගයක් ප්‍රකාශ කරමින් එම කාරක සභාව විසින් ගෙන එනු ලබන යෝජනා සම්මතයක්—

(අ) කාරක සභාව විසින් බෙදීමක් නොමැතිව එකඟ වන්නේ නම් මිස; හෝ

(ආ) ආණ්ඩු පාර්ශ්වයේ යටත් පිරිසෙයින් සාමාජික මන්ත්‍රීවරයන් දෙදෙනෙකු සහ විරුද්ධ පාර්ශ්වයෙන් යටත් පිරිසෙයින් එක් සාමාජික මන්ත්‍රීවරයකු ඇතුළුව කාරක සභාවේ බහුතර සාමාජික මන්ත්‍රී සංඛ්‍යාවක් එම යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්නේ නම් මිස,

ඉහත (1) (ඇ) ඡේදයේ කාර්යය සඳහා එම යෝජනා සම්මතය නිශ්ඵල විය යුත්තේ ය.

(4) කාරක සභාව විසින් එහි සභාපතිවරයා තෝරා පත් කරගනු ලැබ ඉන් අනතුරුව එළඹෙන මාස හය තුළ දී හෝ එම සභාපතිවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවකට ඡන්ද විමසීමෙන් අනතුරුව එළඹෙන වසර තුළ දී හෝ සභාපතිවරයා සම්බන්ධයෙන් එවැනි විශ්වාසභංග යෝජනාවක් කාරක සභාව විසින් කරනු නොලැබිය යුත්තේ ය.

## විසර්ජන පනත් කෙටුම්පතෙහි උපලේඛන සම්බන්ධයෙන් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක කාර්ය පටිපාටිය

**133**.(1) එක් එක් වැය ශීර්ෂය යටතේ ඇති එක් එක් වැඩ සටහනේ නාමය සභාපති විසින් හඬනගා කියවිය යුත්තේ ය. අනතුරුව, මුද්‍රිත ඇස්තමේන්තුවල එම වැඩ සටහන යටතෙහි පෙනෙන්නට තිබෙන යම්කිසි ව්‍යාපෘතියක් හෝ වැය විෂයයක් උදෙසා වෙන් කරන මුදල අඩු කිරීමට හෝ අත් හැරීමට යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය. ඒ මත යෝජනා කළ යුතු ප්‍රශ්නය වනුයේ "............................ වන වැඩ සටහන .................. නමැති වැය විෂය වෙනුවෙන් (හෝ ............... නමැති ව්‍යාපෘතිය වෙනුවෙන්) රු. ..................... කින් අඩු කළ යුතු ය." යන්න යි.

(2) ව්‍යාපෘතියක් හෝ වැය විෂයයක් අඩු කළ යුතුය නැතහොත් අත් හළ යුතු යයි ප්‍රශ්නයක් සභාභිමුඛ කරනු ලැබූ විට, එය පිළිබඳව අවසාන තීරණයක් ගන්නා තෙක්, එම ප්‍රශ්නයටම පමණක් අදාළ වන සේ මන්ත්‍රීවරයන් විසින් කථා කරනු ලැබිය යුත්තේ ය.

(3) එකම වැඩසටහනක් සම්බන්ධයෙන් යෝජනා කීපයක් ඉදිරිපත් වනවිට එම යෝජනා සාකච්ඡාවට ගත යුත්තේ ඒවා අදාළ වන ව්‍යාපෘති හෝ වැය විෂයයන් මුද්‍රිත ඇස්තමේන්තුවල දැක්වෙන අනුපිළිවෙළට ය.

(4) වැඩ සටහනක එකම ව්‍යාපෘතියට හෝ වැය විෂයයට යෝජනා කීපයක් ඉදිරිපත් වන විට, ඉතාම සුළු අඩු කිරීමේ යෝජනාව පළමුවෙන් ම සභාභිමුඛ කරනු ලැබිය යුත්තේ ය. එම ව්‍යාපෘතිය හෝ වැය විෂය අත්හැරීමේ යෝජනාවක් සභාභිමුඛ කරනු ලැබිය යුත්තේ අඩු කිරීම් යෝජනා සියල්ලක් ම පිළිබඳව අවසාන තීරණයක් ගනු ලැබීමෙන් පසුව ය.

(5) කිසියම් ව්‍යාපෘතියක් හෝ වැය විෂයයක් අඩු කිරීමේ හෝ අත්හැරීමේ ප්‍රශ්නයක් මූලාසනයෙන් සභාභිමුඛ කිරීමෙන් අනතුරුව, ඊට ඉහතින් තිබෙන ව්‍යාපෘතියක් හෝ වැය විෂයයක් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය; විවාදයකට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය.

(6) කිසියම් ව්‍යාපෘතියක් අත් හැරීමේ හෝ අඩුකිරීමේ ප්‍රශ්නයක් මූලාසනයෙන් සභාභිමුඛ කිරීමෙන් පසු, එම ව්‍යාපෘතියෙහි කිසිදු වැය විෂයයක් අඩු කිරීමට හෝ අත් හැරීමට යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

(7) වැඩ සටහනක, ව්‍යාපෘතියක හෝ වැය විෂයයක වියදම වැඩිකිරීමේ යෝජනාවක් කලින් දෙන ලද දැනුම්දීමකින් පසු අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හැර ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය. එම දැනුම්දීමෙහි, අනිකුත් කරුණු අතර, එම වැඩ සටහන පිළිබඳ වියදම කවර මුදල් ප්‍රමාණයක් දක්වා වැඩි කිරීමට යෝජනා කරන්නේ ද යන වගත්, එම වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී ඇති වගත්, දක්වා තිබිය යුත්තේ ය.

(8) වැඩ සටහනෙහි කිසියම් ව්‍යාපෘතියක් හෝ වැය විෂයයක් අඩු කිරීමේ හෝ අත් හැරීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු නොලබත් නම් හෝ නැතහොත් එවැනි සෑම යෝජනාවක් ම පිළිබඳ කටයුතු අවසන් කරනු ලැබූ විට හෝ “.............වන වැඩ සටහන සඳහා රු...............ක මුදලක්” (හෝ “...........වන වැඩ සටහන සඳහා රු.............ක අඩු කරන ලද මුදලක්”) “උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.” යන ප්‍රශ්නය මූලාසනයෙන් සභාභිමුඛ කරනු ලැබිය යුත්තේ ය. එම ප්‍රශ්නය මූලාසනයෙන් සභාභිමුඛ කරනු ලැබීමෙන් අනතුරුව, එම වැඩ සටහනෙහි අන්තර්ගත එක් එක් ව්‍යාපෘතිය හෝ වැය විෂයය ගැන ඉන් ඉදිරියට විවාද කිරීමට අවසර දෙනු නොලැබිය යුත්තේ ය.

(9) 28 ස්ථාවර නියෝගයෙහි කුමක් සඳහන්ව තිබුණ ද, කිසියම් වැඩ සටහනක් ව්‍යාපෘතියක් හෝ වැය විෂයයක් සඳහා වෙන් කරනු ලබන මුදල අඩු කිරීමේ යෝජනාවක් ගැන කලින් දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

## අධි වැය

**134.** (1) මෙම ස්ථාවර නියෝගයෙහි (5) ඡේදයෙහි දැක්වෙන අන්දමට කරුණු යෙදුණු අවස්ථාවක දී හැර, මුදල් වර්ෂයක අවසානයෙන් පසු එම වර්ෂයේ ප්‍රයෝජනය සඳහා (මෙහි මින්මතු “අධිවැය” යනුවෙන් සඳහන් කරනු ලබන) මුදලක් ලබාදීම පිණිස යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) වැඩ සටහනක කිසියම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් දරන ලද කිසියම් අධිවැයක් තිබේ නම්, එය පරීක්ෂාකර එම අධිවැය දරා ඇත්තේ කවර වැඩ සටහන සම්බන්ධයෙන් ද නැතහොත් එම වැඩසටහනෙහි ව්‍යාපෘති එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් පමණක් දැයි ස්වකීය වාර්තාවෙහි ප්‍රකාශ කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කරනු ලබන නියමයක් විය යුත්තේ ය.

(3) අධිවැය සිදු වී ඇත්තේ ව්‍යාපෘති එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් පමණක් නම්, එම අධිවැය දරා ඇත්තේ නිසි බලය සහිතව හා අරපරිස්සම ගැන පරීක්ෂාකාරීව ද යනු සොයා බලා, කාරක සභාව සෑහීමකට පත්වෙත් නම් ඒ අනුව වාර්තා කරනු ලැබිය යුත්තේ ය. ඊට වැඩිමනත් අනුමතියක් එම අධිවැය සඳහා අවශ්‍ය නොවිය යුත්තේ ය:

එසේ වුවද, අධිවැය සිදු වී තිබෙන්නේ කිසියම් පෞද්ගලික වේතන ව්‍යාප්තියක් සම්බන්ධයෙන් නම්, වියදම දරන ලද්දේ එවකට පැවති වැටුප් පරිමාණයන්ට අනුව යැයි ද, පෞද්ගලික පක්ෂ හජනයෙන් මුළුමනින්ම තොරව යැයි ද, කාරක සභාව සෑහීමකට පත්විය යුත්තේ ය. කාරක සභාව විසින් එලෙස සෑහීමකට පත්වෙත් නම්, ඒ අනුව වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(4) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එලෙස සෑහීමකට පත් නොවෙත් නම්, එම අධිවැය තමන් අනුමත නොකරන බව හෝ තමන්ට සුදුසු යැයි හැඟෙන කවර ප්‍රමාණයක් එම අධිවැයෙන් තමන් අනුමත නොකරන්නේ ද යන බව හෝ කාරක සභාව විසින් වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(5) වැඩ සටහනක් සම්බන්ධයෙන් අධිවැයක් දරා ඇතැයි හෝ සමහර වැය විෂයයන් කාරක සභාව විසින් අනුමත නොකරතැයි හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වාර්තා කරන සෑම විටම, එම අධිවැය හෝ අනුමත නොකරන ලද විෂයයන් සඳහා මුදලක් දීම මුදල් විෂයය භාර අමාත්‍යවරයා නියම කරන දිනයකදී සලකා බැලීම සඳහා, පාර්ලිමේන්තුව කාරක සභාවකට පරිවර්තනය විය යුතු යැයි සම්මත කිරීමේ යෝජනාවක් එම අමාත්‍යවරයා විසින් න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, එම අධිවැය අයත් වර්ෂයට පසු වර්ෂයෙන් පසු වර්ෂයෙහි දෙසැම්බර් 31 දිනට පසු එවැනි යෝජනාවක් භාර ගනු නොලැබිය යුත්තේ ය.

(6) අධිවැයක් ඇතිව හෝ නැතිව, නිසි බලය නොමැතිව කරන ලද කිසියම් වියදමක් අනුමත නොකිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඇති බලය මෙම නියෝගයෙහි ඇති කිසිවකින් අඩු නොවිය යුත්තේ ය. මෙම ස්ථාවර නියෝගයෙහි (5) ඡේදයෙහි විස්තර කර තිබෙන ක්‍රියා පිළිවෙල එවැනි අනුමත නොකිරීමක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුත්තේ ය.

**135**. (1) කවර හෝ අත්තිකාරම් ගිණුම් කටයුත්තක් සම්බන්ධයෙන් යම් මුදල් වර්ෂයක, (මෙහි මින් මතු "අත්තිකාරම් ගිණුම් සීමාවලට අනුකූල නොවීම" යනුවෙන් සඳහන් කරනු ලබන) නීතියෙන් බලය දී ඇති උපරිම සීමාවන් ඉක්මවා යන්නා වූ හෝ අවම සීමාවලට අනුකූල නොවන්නා වූ කිසිම යෝජනාවක්, මෙම

ස්ථාවර නියෝගයේ (4) ඡේදයේ දක්වා ඇති අවස්ථාවක දී හැර පිළිගනු නොලැබිය යුත්තේ ය.

(2) අත්තිකාරම් ගිණුම් කටයුතු උපරිම සීමාවන් ඉක්මවීම හෝ අත්තිකාරම් ගිණුම් කටයුතු අවම සීමාවට අනුකූල නොවීම හෝ පිළිබඳව විගණකාධිපතිවරයා විසින් වාර්තා කරනු ලැබූ සෑම අවස්ථාවක් ම පරීක්ෂා කරනු ලැබිය යුතු බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කරනු ලබන නියමයක් විය යුත්තේ ය. අත්තිකාරම් ගිණුම් කටයුතු සීමාවන්ට අනුකූල නොවීම නීතියට අනුකූලව සිදු කර තිබේ ද යන්න කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය. වාර්තා කරනු ලැබූ අත්තිකාරම් ගිණුම් සීමාවන්ට අනුකූල නොවීම නීතියට අනුකූලව සිදු කර නොමැති අවස්ථාවක දී, අත්තිකාරම් ගිණුම් සීමාවන්ට එසේ අනුකූල නොවීම සම්බන්ධයෙන් අවසර දිය යුතු ද නොයුතුද යන්න පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(3) අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ පාඩු අදාළ වන්නේ යම් මුදල් වර්ෂයකට ද, ඒ මුදල් වර්ෂය අවසන් වීමට පෙර එම අලාභ සම්පූර්ණයෙන් පියවා නොමැත්තා වූ ද, ස්වකීය වාර්තාව මගින් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබ ඇත්තා වූ ද, අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ ඕනෑම අවසර නොලත් කාරක අලාභ ඔවුන් විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කරනු ලබන නියමයක් විය යුත්තේ ය.

(4) අත්තිකාරම් ගිණුම් කටයුතු සීමාවන්ට අනුකූල නොවීම් කිසිවක් වෙතොත් ඒවාට අවසර දිය යුතුද, නොයුතුද යන්න පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිර්දේශ කර ඇති සෑම අවස්ථාවක දී ම හෝ අත්තිකාරම් ගිණුම් කටයුතු වල අවසර නොලත් අලාභ කිසිවක් වෙතොත් ඒවාට අවසර දිය යුතු ද, නොයුතු ද යන්න පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිර්දේශ කර ඇති කවර හෝ අවස්ථාවක දී හෝ එවැනි නිර්දේශ සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුව කාරක සභාවක් ලෙස කටයුතු කිරීම සඳහා වන යෝජනාවක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, එම අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සලකා බැලීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට හැකි ය.

## රජයේ මුදල්

**136**. ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනයම් අරමුදල් වලින් හෝ ගෙවිය යුතු මුදල් වියදම් කිරීමට හෝ ගෙවිය යුතු යැයි වියදම් නියම කිරීමට, නැතහොත් කිසියම් බද්දක් පැනවීමට හෝ පනවා එවකට වලංගුව තිබෙන බද්දක් අවලංගු කිරීමට හෝ වැඩි හෝ අඩු කිරීමට බලය පවරන යෝජනාවක්, පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට කරන සංශෝධනයක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම කරනු නොලැබිය යුත්තේ ය. එවැනි යෝජනාවක්, පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට

කරන සංශෝධනයක් ඉදිරිපත් කිරීමට පෙර, එම අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් එම යෝජනාවට, පනත් කෙටුම්පතට හෝ සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු ලැබිය යුත්තේ ය. "අමාත්‍ය මණ්ඩලයේ අනුමතය දන්වා තිබේ" යනුවෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ සඳහන් කර තිබීම මෙම නියමය සමඟ අනුකූල බවට ප්‍රමාණවත් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

## ස්ථාවර නියෝග සංශෝධනය කිරීම

